# පරෙවි සන්දේශය.

තොටගමුවේ

ශ්‍රී රාහුල සඞ්ඝරාජ මහා ස්වාමිපාදයාණන්වහන්සේ

විසින්

විරචිතයි.

---

සිරිදියස් ද සිල්වා ගුරුතුමා

විසින්

කරනලද පදාර්ථ ව්‍යාඛ්‍යා සමෙතයි.



ගොරකානේ

ඩබ්ලිව්. හර්මානිස් පොන්සේකා

විසින්

ද්විතීය සංස්කරණය කොට

විද්‍යාසාගර යන්ත්‍රාලයෙහි

මුද්‍රාඞ්කනය කරවනලදි.

1901.

# සංඥාපනය.

තොටගමුවේ ශ්‍රී සඞ්ඝබෝධි ශ්‍රී විජයබාහුපරිවෙණාධිපති ෂඩ්භාෂා පරමේශ්වර ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය්‍ය ශ්‍රීරාහුලසඞ්ඝරාජ මහාස්වාමිපාදයාණන්වහන්සේ විසින් විරචිත මෙම පරෙවි සන්දේශය ජයවර්ධනපුරප්‍රවරය අග්‍රරාජධානිකොට විසූ ශ්‍රී පරාක්‍රමබාහු මහරජතුමන් හා ඒ රජතුමන්ගේ සොහොයුරුවූ මායාදුනු නුවර විසූ යුවරජතුමා ද සිවුරඟ සෙනඟ ද ආරක්ෂාකරගැනිම පිණිසත් පැරකුම්බා රජහුගේ දියණිවූ **චන්ද්‍රවතී** කුමාරිකාවට සමාන වංශයෙන් පුරුෂයකු හා පුත්‍රයකු ලබාදීම පිණිසත් අනිකෙකුගේ අයදුමක් නැතිව ස්වාභිප්‍රායෙන් යාචනය කොට දෙව්නුවර විෂ්ණුදිව්‍ය රාජයාහට සන්දේශ ප්‍රේරණයෙන් දූතක්‍රියායෙහි පාරාපත පක්ෂීහු මෙහෙයා ප්‍රබන්ධිතයි. මේ සඳහා ප්‍රපංචකථා ලිවමට අපි ප්‍රමාද නොවමු. සන්න කළ ඇදුරුතුමා විසින් ලියනලද පොත පිළිබඳ නිවේදනවාක්‍යය ප්‍රකාශකිරීමෙහි අභිලාෂ ඇතිවූ හෙයිනි. ඒ වාක්‍යය මෙසේයි:–

"සකල කවිකුල ශිරෝමණි විජයබාහු පරිවෙණාධිපති ෂඩ්භාෂා පරමේශ්වරවූ **තොටගමුවේ ශ්‍රීරාහුල සර්වඥයන්වහන්සේ** විසින් විරචිත **පරෙවි සන්දේශය** නානාවිධ කාව්‍යාලඞ්කාරාදියෙන් සජ්ජිත විය. ඡන්දස් ව්‍යාකරණාදියට එකඟය. ගී සැහැලි සිවුපදාදි විවිධ වෘත්තයන්ගෙන් අලඞ්කෘතය. නගර වර්ණනාදි නානාවිධ වර්ණනායෙන් යුක්තය. දශවිධ කාව්‍යප්‍රාණයන් අතුරෙන් සුශ්ලිෂ්ටය, සමය, සුකුමාරය යන ත්‍රිවිධ ප්‍රාණයන් එළු පද්‍යයෙහි අවිද්‍යමාන බැවින් අවශේෂ සප්තවිධ ප්‍රාණයන්ගෙන් සාලඞ්කෘතය. එළු පාලි සංස්කෘතාදි ශාස්ත්‍රඥපණ්ඩිතයන් විසින් ගරුකොට සලකනලදින් භාවිතා කරන ලද්දක්ය. එළුව ඉගෙනගන්නා අයට සර්වප්‍රකාරයෙන්ම ප්‍රයෝජනවත්ය. මේ සන්දේශයෙහි අනර්ඝතාවය අපවිසින් විස්තරව නොකී නමුත් තොටගමුවේ රාහුල මහාස්වාමීන්වහන්සේ විසින් කරනලද්දක් බැවින් උන්වහන්සේගේ ශාස්ත්‍රඥපණ්ඩිතභාවය දන්නෝ මෙහි තරම දනිත්. ඉතින් මෙය එළුව ඉගෙනගන්නාවූ අයවිසින් ඉතා ගෞරවයෙන් භාවිතා කරන නුමුත් මෙහි අර්ථගම්භීරකම නිසාත් පොත් සියගණනක් එකතුකළත් එයින් නිවරදවූ එකක්වත් සපයාගන්ට බැරිලෙස අතින් අත ලියමනෙන් හටගත් වරදින් ආකූලව්‍යාකූලව තිබෙනනිසාත් බොහෝ ගුරුවරයන් විසිනුත් හරිඅදහස් තේරුම් ගැන්ම දුෂ්කරහෙයින් ආධුනිකයන්ට හරි අර්ථ රසය විඳගැන්ම අතිශයෙන්ම අමාරුවක්ව තිබෙනවා මය. එසේහෙයින් සිංහල පාලි සංස්කෘත ඡන්දස් ව්‍යාකරණාදි නානාවිධ ශාස්ත්‍රමාර්ගයන් දැනගත්තාවූ **දොන් අන්ද්‍රිස් තුඩාවේ පණ්ඩිත ගුණවර්ධන** වැලිගම විවාහ ලේකම් මැතිතුමන්ගෙන් එළුව දැනගත් ගෝලයෙක්වූ **සිමිදියස් ද සිල්වා** ගුරුන්නාන්සේ යන මම එකී ගුරුන්නාන්සේ මහත්මයාගෙන් ලැබුණාවූ ගුරුපදේශයන් සිහිපමණින් නොඉක්මවා මගේ දැනුම් තරමෙනුත් ශුද්ධකොට කරනලද අමුතු පදගත සන්නයක් ද සහිතව ඉගෙනගන්නා අයගේ ප්‍රයෝජනය සඳහා අච්චුගස්වා ප්‍රසිද්ධ කෙළෙමි"-යනුයි.

තවද එම ගුරුතුමා විසින් ගී සැහැලි පද්‍යබන්ධනයෙහි විශෙෂ විභාග හඳුන්වාලීම පිණිස ආචාර්‍ය්‍ය නාම සඞ්ගිත වශයෙන් ප්‍රයුක්ත ගීය හා දසපද සැහැල්ලද මෙසේයි:-

"සැරද සිරිසඳ පිය–යුරු කොකුමතල උරතල
දොන් අන්ද්‍රිස් තුඩාවේ–පඬි ගුණවඩන ඇදුරිඳු

සොම්ගුණෙනි නිසයුරු–දත්සත් නැණින් ගණිසු රු 1

2 { තා න් දෙස පතල යස කිතුයුග කිරණයු රු 2
පි ත් සිරි රුසිරු මෙන් හිරොතප් ගුණෙනි ස රු 3

3 පිළිමල් කිවිකෙසර–සරබෙව් විකුම් බුන් ක ළ 4

4 { කිවිනළු එළු මගද සකු වියරණ සඳ සේ 5
පිවිතුරු ලෙස දැනෙන තොරතුරු අතැඹුල සේ 6

5 තැන තැන ප ඬි න් දිව්රග යස නළඹර ගේ 7
ත න මෙන යොවු න් ලියළෙන් දුරු රුව අන ගේ 8
ම න පි න ව මි න් සැමසත නෑසිය සම ගේ 9
දි න දි න යෙහෙන් දිනෙවා ඇදුරිඳු මෙම ගේ 10" යනුයි

කාව්‍යාලඞ්කාරාදියෙන් අතිශයෙන් ගම්භීරවූ මෙම පොත දැනට සපයාගත නොහෙන හෙයිනුත් සන්නය ලී ගුරුන්නාන්සේ මහත් මයා මගේ ආචාර්‍ය්‍යවද මසිලණුවන්ව ද විසූ හෙයිනුත් උන්නැහේගේ නාමය සිහිවනු පිණිස ඉතිවරිව තුබූ ශොධ්‍යස්ථානයන් යථාශක්තීන් ශුද්ධකොට ප්‍රසිද්ධ කරවීමු. මෙම ශුද්ධිය පිණිස අක්‍ෂරවින්‍යාසාදිය හා ඇතම් තැනෙක්හි විෂමව තුබූ කවිසන්න පිළිබඳව යථාස්ථානයෙහි උපදෙස් දෙමින් අවසාන ශොධ්‍යපත්‍රයක් බලාදුන් ලක්දිව ප්‍රශස්ත විද්‍යාස්ථානත්වයෙන් ප්‍රසිද්ධවූ පෑලියගොඩ විද්‍යාලඞ්කාර මහපිරිවෙන්හි ශාස්ත්‍රාගම උගත් දැනට ගොරකානේ කන්දේවිහාර පිරිවෙනෙහි ආචාර්‍ය්‍යභාවොපගත **ගාල්ලේ සුමනතිස්ස** ස්වාමිපාදයන්වහන්සේට අපගේ ගෞරවස්තුතිය සෘජුව පුදකර සිටිමු.

ප්‍රථම මුද්‍රණයට වඩා මෙහි සකස් කරන්ට යෙදුණු කරුණු වෙන්වෙන් වශයෙන් නොපෙන්වන ලදුවත් පොත්දෙක සසඳබලන කලැ ඒ දැනගත හැකිවේ. අපගේ ප්‍රමාද භ්‍රමයෙන් ශෙෂවූද යම්කිසි අශුද්ධ ස්ථානයෙක් මෙහි දක්නාලැබේනම් එය පණ්ඩිතයන් විසින් ශුද්ධකරනු ලැබේවා.

මේ පොත නැවත අච්චුගැසීමේ අයිතිවාසිකම මටම තබාගත් බව දන්වමි.

මේවගට,

**ඩබ්ලිව්. හරමානිස් පොන්සේකා**
ගුරුන්නාන්සේය.
W. H. Fonseka.

**වර්‍ෂ** 1901 **ක්වූ අගෝස්තු** මස
1 වෙනි දින ගොරකානේදිය.

සන්න සහිත

# පරෙවි සන්දේශය.

1. සැරද පරෙවිඳු සඳ—පබුවන් සුරත් සරණින්
පහළ කිරිමුහුදින්—සහ පබළ පැල සක්වන්.

---

1. මෙහි ප්‍රථමකොට දක්වනලද අතිශයෙන් කර්ණරසායන මධුර පදාන්විතවූ ශ්ලෝකයෙහි පදච්ඡේද සමාසාදිය සැකෙවින් දක්වනු ලැබේ.

සැරද යන පදය, පරෙවිඳු සඳ යන පදය, පබුවන් යන පදය, සුරත් සරණින් යන පදය, පහළ යන පදය, කිරිමුහුදින් යන පදය, සහ පබළ පැල යන පදය, සක්වන් යන පදය, යි මෙසේ මේ කාව්‍යය සප්තපදයක් ඇත්තේවේ.

(සැරද) යනු අකර්මකධාතු අනාගතකාල ශබ්දකාරක (මධ්‍යම පුරුෂ) ඒකවචන ආශීර්වාද ක්‍රියා ගර්භකොට ඇති විධික්‍රියායි–සැර, යනු පූර්වකොට ඇති 'දිව්' පණදූරීමෙහි යන ධාතුහු–කෙරෙන් පරව 'වත්මන් අනාරු' යනාදි උපාඞ්ගසූත්‍රයෙන් ආශීර්වාදාර්ථයෙහි විධික්‍රියා ප්‍රත්‍යය කොට 'සදුරුත්' යනාදි අඞ්ගසූත්‍රයෙන් ධාත්වන්තවර්ණලොපය හා දකාර යාගේ ස්වර ලොපයද 'පෙර පරවණන්' යනාදි උපාඞ්ගසූත්‍රයෙන් ප්‍රත්‍යය ස්වරයා ගාත්‍රාක්ෂරාරූඪද කළකල්හි 'සැරද'යි පදසිද්ධ වේ.

පරෙවි ඉඳු පරෙවිඳු (පූර්වස්වරලොපසන්ධියයි)–පරෙවියන්ට ඉඳු පරෙවිඳු, (සම්බන්ධවිභක්තිසමාසයි)–සඳ යන නිපාතය උත්තමාර්ථය කාලාර්ථය පදපූරණය යනාදියෙහි වේ. මෙතැන්හි සඳ යනු අර්ථශූන්‍ය පදපූරණ මාත්‍රයකි. පබුමවන් පබුවන්, (විශෙෂණ සමාසයි) මනාරත් සුරත් (සු ඇ වගෙහි අව්‍යයසමාසයි)–එයින් සරානුයි සරණ, 'සර–සැරීමෙහි' යන ධාතුහුකෙරෙන් 'දයින් නොමෙත්' යනාදි උපාඞ්ගසූත්‍රයෙන් වූ කරණ කාරකයෙහි ණ ප්‍රත්‍යයයි–සුරත් සරණ ඇත්තියේ සුරත්සරණ (අන්‍යාර්ථ සමාසයි) එයින් සුරත් සරණින් පහළවනලද්දේ පහළ, ප පූර්ව 'හර–හැරීමෙහි, යන ධාතුහුකෙරෙන් කර්මකාරක අප්‍රත්‍යය හා ධාත්වන්තවර්ණයා හට ළකාරාදෙශද ප්‍රත්‍යයස්වරයා ගාත්‍රාක්ෂරාරූඪ කොට ලිඞ්ගසංඥද කළ කල්හි පද සිද්ධයි–කිරෙහිවන් මුහුද කිරමුහුද, (ආධාරවිභක්ති සමාසයි) එයින් කිරමුහුදින්–පබළයාගේ පැල පබළපැල (සම්බන්ධ විභක්තිසමාසයි)–පබළපැල සහවූයේ සහපබළපැල (අව්‍යයසමාසයි)–සක්ම වත් සක්වන් (විශෙෂණ සමාසයි.)

2. මිතුරු තුරු සරහන-මමිතුරු නව වසනයුරු
නු බි නෙන සඳ නද මඳ ගඳ පවන ලෙ ලි
හෙබි පුල් කුමුදු හගනොනගතු අතින් ගි ලි
සුර ගඟිතළ නෙලුඹු-දූලි සඳහස නොවෙත පත

---

'පරෙවිදුසඳ සැරද' යනු ක්‍රියාකාරකපදසම්බන්ධයි–'සැරද' යන කර්තෘ ක්‍රියාවවිසින් උක්තහෙයින් 'පරෙවිදුසඳ' යනු උක්ත කර්තෘයි, 'සැරද' යන ක්‍රියායෙහි ධාතුව අකර්මක හෙයින් කුමක් සැරදේදැයි කර්ම චොදනාවෙක් නැත්මය.

'පරෙවිදුසඳ' යනු විශෙෂ්‍යයි–පඬුවන් යනුද, සුරත් සරණින් යනුද, කිර්මුහුදින් පහළ, යනුද, සහ පබළ පැල සක්වන් යනුද, තත්තුල්‍යාදි කරණ විශෙෂණපදයෝයි–මෙහි 'පරෙවිදුසඳ' යන්න හා 'සුරත් සරණින්' යන කරණය කෙයේ සමානාධිකරණ වේදයත් 'කිරිය සැපයී මෙහි' යනාදියෙන් නිර්දිෂ්ටකරණය නොව උපලක්ෂණාර්ථයෙහි කරණය හෙයින් සමානාධිකරණ වේමැයි.

මෙසේ පදච්ඡේදාදික්‍රමය දක්වා තදනන්තරව පදාර්ථකථනයකෙරෙමි.

පරෙවිදුසඳ සැරද, පාරාපතෙන්ද්‍රය චිරකාලයක් ජීවත්වෙතිවා; කිමෙකින් විශිෂ්ට පාරාපතෙන්ද්‍රයෙක්ද යත්? කිර්මුහුදින්, ක්ෂීරාර්ණවයෙන්, පහළ, ප්‍රාදුර්භූතවූ; පබළ පැල සහ, ප්‍රවාලාඞ්කුරයන් හා සදෘශවූ; සුරත් සරණින්, අතිරක්තචරණයෙන්ද; සක්වන්, ශඞ්ඛයක් බඳුවූ; පඬුවන්, පාණ්ඩර (සුදු) වර්ණයෙන්ද (යුක්තවූ); පරෙවිදුසඳ, පාරාපතෙන්ද්‍රය; සැරද, චිරකාලයක් ජීවත්වෙතිවා.

මෙසේදක්වූ ප්‍රථමගීයෙන් පාරාපතපක්ෂිහුගේ දෘෂ්ටජන කාන්තාජන රූප වර්ණනාවෙන් ආමන්ත්‍රණකාලය රැගෙන ශුභසිද්ධිය සඳහා ආශීර්වාද කොට තදනන්තරව පාරාපතපක්ෂිහුගේ මිත්‍රයන් සතුටුකිරීමෙහි සමර්ථ භාවය ප්‍රකාශකිරීමෙන් ආමන්ත්‍රණයද ප්‍රත්‍යක්ෂ රූප වර්ණනාවෙන් ප්‍රශංසාද කොට සම්මොදනීයකථාසම්භාෂණයෙන් තමන්ගේ සන්තොෂ භාවය ප්‍රකාශකරන්නාහු "**මිතුරු තුරු සරහන**" යනාදි උපයාති නම් දසපද සැහැල්ල කීහ.

2. මිතුරු, මිත්‍රතමෑනි; තුරු වෘක්ෂයන්; සරහන, අලඞ්කාර කරන්නාවූ; නව වසනයුරු, අභිනව වසන්තකාලය බඳුවූ; මමිතුරු, මාගේ මිත්‍රය–නඳන, සතුටුවීම යුතුවූ; ගඳ මඳ පවන, සුගන්ධ මන්ද මාරුතයෙන්; ලෙලි, ලීලොපෙතව; නුබින්, ආකාශයෙන්; එනසඳ, ආගමනය කරන

සුදු බුදු නිවෙසී නෙත තොප දැකැලෙව් එස ද
සුදු බුදු රැස් පිඬකැයි නොකොලෝද පු ද
සඳෙකින් නදු නුයනීනෙත මලෙක සුර න ඹේ
සඳෙකින් ලොබින් වටලා නොදැමූද ඉ ඹේ
නිදු කින් අවුද සකිසඳ අතරමග නු ඹේ
ඉති කින් අපට සැපනම් දැක්ම මැයි නු ඹේ

3\. ත මා ඉටු මිතුරු කරණී පැමිණි ව ර
ප මා නොවෙති සුදනෝ මෙත් කයැති ක ර
පෙමා එයිනුවමි මිණි රුවනින් පව ර
මෙමා වදන් පස්කැන් කන් ලකර ක ර

---

කල්හි; අඟනෝ, කාන්තාවෝ; ගිලි, ගලිතවූ; හෙබි, ශොභිතවූ; දුල්, දිප්‍රණාවූ; කුමුදු න, නෛකරවයෙන්ජෝතිවූ සිතා; අහින්, ගගනයෙන්; නාගතු, ග්‍රහණය නොකොලෝද; සුරගඟිනාලු, ආකාශ ගඞ්ගාවෙන් උපන්නාවූ; නෙලුම්දලි, බිසනාලය (නෙලුම්දණ්ඩ) කැයි; සඳ, විතානයෙන්; හස, හංසයෝ; වෙත, යුෂ්මත්තු සමීපයට; නොපත, නොපැමිණියාහුද; සුදුබුදුනිවෙසින්, ශුබ්‍ර බුධනිවාසයෙන්; එන, ආගමනය කරන්නාවූ; තොප, යුෂ්මත්ශබ්දවාච්‍යු; දැක, දර්ශනය කොට; එසඳ, එකල්හි; ලෙව්, ලොකවාසීහු; සුදු බුදුරැස්පිඬෙකැයි, ශ්වෙත බුධරශ්මිපිණ්ඩයෙකැයි; පුද නොකලෝද, පූජා නොකලාහුද; සඳෙකින්, එකච්ඡන්දයෙන්; නදුනුය නින්, නන්දනොද්‍යානයෙන්; එන, එන්නාවූ; මලෙක, පුෂ්පයෙකැයි; සුර නඹේ, දිව්‍යාඞ්ගනාවෝ; සඳෙකින්, සන්දේහයෙකින්; ලොබින්, ලොභයෙන්; වටලා, පරික්ෂෙපකොට; ඉඹේ, චුම්බනයකොට; නොදැමූද, ප්‍රක්ෂෙප නොකළෝද; සකිසඳ, මිත්‍රොත්තමයාණනි; අතරමග නුඹේ, අන්තරා මාර්ගාකාශයෙහි; නිදුකින්, දුඃඛ රහිතව; අවුද, ආගමනය කළහුද; ඉති කින්, එයේ බැවින්; අපට, අපමන් ශබ්දවාච්‍යන්හට; සැපනම්, සෞඛ්‍යනාම්; නුඹේ දැක්මමැයි, යුෂ්මත්හුගේ දර්ශනය මය.

3\. තාම, තාමන්ට; ඉටුමිතුරු, ඉෂ්ටමිත්‍රයන්ගේ; කරණී පැමිණිවර, කටයුතු පැමිණිකල්හි; සුදනෝ, සජ්ජනයෝ; මෙත්, මෛත්‍රියම; කයැති කර, ශරීරය (මෙන්) පිදුමානකොට; පමානොවෙති, ප්‍රමාද නොවෙත් ය; පෙමා, ප්‍රෙමාන්විතය; එයින්, එහෙයින්; පවර, උතුම්වූ; උවම් මිණි රුවනින්, උපමා නමැති මාණික්‍ය රත්නයෙන් (යුක්තවූ); මෙමා, මේ මාගේ; වදන් පස්කැන්, වචන නමැති නාඩංසා (කුණ්ඩලාභරණ) ය; කන්, කර්ණයෙහි; ලකර කර, අලඞ්කාර කර.

මෙමා මෙන මැදුරු තුරු මිතුරු යුරු
මිතුරු සඳ මෙසඳ කුම් කෙරෙම් දොමගෝ.

4. වි පුල් කුලුණු මෙත් ගුණයෙන් ලෙව් පු ස් න
කොපුල් අත දලැස ලෙස තෙද රැස් ඉ ස් න
තෙ පුල් ගෙනැ සුරිඳු රක්නා ලෙව් ස ස් න
උ පුල් වන් සුරිඳු දැකැ දෙව් මේ හ ස් න
මියුරු රසබස් නුමුතු අස්නැ තතු වනමි
දූන් තා නිකුත් වන පුරවර වෙසෙස අස.

5. තු නු රුවනෙහි බැතිපෙම් තර සත නිහො ර
උ නු නොවයුත් පහදද බිහිදොර පත ර
ම නු කුල මුදුන් නිරිඳුන් රඳන හැමව ර
ද නු මමිතුර ජයවද්දන පුර පව ර

---

මේ මාගෙ සිත නමැති ගේඇතුළෙහි; පහනක් වැනිවූ මිත්‍රොත්තමය මේ කාලයෙහි (මම) කුමක් කෙරෙම්ද?

4. විපුල්, මහත්වූ; කුලුණුමෙත්ගුණයෙන්, කරුණා මෛත්‍රීගුණයෙන්; ලෙව්පුස්න, ලොකයා පොෂණය කරන්නාවූ; කොපුල්අත, ඊශ්වරයාගේ; දලැසලෙස, ලලාටාක්ෂිය පරිද්දෙන්; තෙදරැස්, තෙජොසමූහය; ඉස්න, සිචනය කරන්නාවූ හෙවත් පතුරුවන්නාවූ; සුරිඳු, ශක්‍රයාගේ; තෙපුල්, වචනය; ගෙනැ, ග්‍රහණයකොට; ලෙව්සස්න, ලොකශාසනය; රක්නා; රක්ෂාකරන්නාවූ; උපුල්වන් සුරිඳු, උත්පලවර්ණසුරෙන්ද්‍රයා; දැකැ, දර්ශනය කොට; මේ හස්න, මේ සන්දේශය; දෙව්, දානයකරව්.

මධුර රස වචනයෙන් නිහොරවූ අස්නෙහි තත්වය (තතුව) වර්ණනාකරමි–දූන් යුෂ්මත්හු පිටත්ව යන්නාවූ උතුම් නුවරෙහි විශෙෂය ශ්‍රවණයකර.

5. තුනුරුවනෙහි, ත්‍රිවිධරත්නයෙහි; තර, ස්ථිරවූ; බැතිපෙම්, භක්ති ප්‍රෙමයඇති; සත, සත්ත්වයන්ගෙන්; නිහොර, අතරක් නැත්තාවූ; පතර, මහත්වූ; පත, ප්‍රාසාදය; දද, ධ්වජය; බිහිදොර; බහිර්ද්වාරය (තොරණ) යන මෙයින්; උනුනොවයුත්, අනූනත්වයෙන් යුක්තවූ; මනුකුල, මහා සම්මත වංශයට; මුදුන්, මස්තකවූ; නිරිඳුන්, නරෙන්ද්‍රයන්; හැමවර, සියලු කල්හි; රඳන, රජමානවන්නාවූ; ජයවද්දනපුර පවර, (ශ්‍රී)ජයවර්ධනපුර ප්‍රවරය; මමිතුර, මාගේ මිත්‍රය; දනු, ජානනය කර.

6. ක ළ සුල කළ හෙළ රුවනින් තුඟු නැබ ළ
ලෙළ සිලිලෙන් පිරි පිරිවෙනැ පවුරදු ළ
අ ළ ලනවර කිරණව මත් පහරඹ ළ
ප ළ කෙළෙ සළා දී නැඟිවට තරඟ වැ ළ

7. සොබමන් මුවන් නෙත් පියයුරු බැම සස ල
අඟ න න් දිය කෙළිනු දුකැමෙහි ගෙදිගුවි ල
ග න ර න් පියුම් නිලුපුල් නිසර බිඟු කැ ල
දනකැ න් දනිති තොරතුරු ඇසුමෙන් තෙපු ල

8. කි කිණි දැලින් ලෙලදෙන මුතු ලැල් සම ග
ඝි ඟි ණි ලකුළු තුඟු පහමුදුනැ මනර ඟ
කි ර ණි නොවැදි සැදි රතම්ණි කැරලි අ ග
පැ මි ණි මෙපුර නුබමැදූ හිරු ළඟිරු ර ඟ

---

6. සුලකළ, අත්‍යලඞ්කෘතවූ; හෙළරුවනින්, සඵටික (පළිඟු) මාණික්‍ය යෙන්; කළ, කරනලද්දාවූ; තුඟු, උස්වූ; නැබළ, මහත්වූ;ලෙළසිලිලෙන්; ලීලෝපෙත ජලයෙන්; පිරි, පූර්ණවූ; පිරිවෙනැ දුළ,පරිඛාසමීපයෙහි උජ් ජ්වලිතවූ; පවුර, ප්‍රාකාරය; (කෙසේද)කිරණව, ක්ෂීරාර්ණවය; අලලනවර, ආලෝඩනය කරනකල්හි; මත්පහරඹළ, මථිත (කලඹන්නාවූ) ප්‍රහාර යෙන් අවෘතතව; වට, හාත්පස්හි; සළාදී, ජටාදෘනයකොට; නෙවත් දිය සුළි සැදෙමින්; නැඟී, නැංගාවූ; තරඟවැළ, තරඞ්ගාවලිය; පළකෙළෙ, ප්‍රකාශකෙළේය.

7. සොබමන්, ශෝභමානවූ; මුවන්, වක්‍ත්‍රය; නෙත්, නෙත්‍රය; පියයුරු, පයෝධරය; සසල, චචලවූ; බැම, භ්‍රෑය (ඝනමෙසින් යුක්තවූ); අඟනන්, අඞ්ගනාවන්ගේ; මෙහි, මේ ජයවර්ධනපුරයෙහි; ගෙදිගුවිල, ගෘහ දිර්ඝිකානඩාගයන්හි;දියකෙළිනු දුක, ජලක්‍රීඩාව දර්ශනයකොට;ගනරන් පියුම්, ඝනස්වර්ණපද්මය; නිලුපුල්, නීලෝත්පලය; නිසර, හංසය; බිඟු කැල, භෘඞ්ගසමූහය; (යන මොවුන්ගේ) තොරතුරු, විශේෂවිභාගය; තෙපුල ඇසුමෙන්, වචන ශ්‍රවණයකිරීම කරණකොටගෙන; දනකැන්, සත්වසමූහයෝ; දනිති, ජානනයකෙරෙත්.

8. ලෙලදෙන, ලීලාදානයකරන්නාවූ; මුතුලැල්සමග, මුක්තා ලතිකාවන් සමග;කිකිණිදැලින්, කිඞ්කිණී කජාලයෙන්; ඝිඟිණි, ගනණවූ; ලකුළු, අලඞ්කෘතවූ; තුඟු,උස්වූ; මනරඟ, මනෝලයවන්නාවූ; පහමුදුනැ,ප්‍රාසාද මස්තකයෙහි (වූ); කැරලිඅග, ශෘඞ්ගාග්‍රයෙන්; රතම්ණි, රත්නමාණි

9. නිල් මිණි පැහැති තුඟු පහ මිහිගු නිනදි නේ
කුල් මත් මෙනෙන් රැවටුණු මැදුරු සිකි කැනේ
තුල් ගන ගිගුම් අසමින් නොමඳ ඇම දි නේ
පිල් නොම හඹත් දිනිඳුට මුත් උදුස නේ

10. ම න හ ර පුළුලුකුළු පියයුරු බරන් දැ ක
මෙමෙහෙවර සියුම් බඹ නොපහළ වනැයි සැ ක
හැ ම ව ර ගනන් මැද පෙදෙසින් නෙලඹු සෙක
පු ර තු ර සරනා සලෙලුන් බල සකි නොයෙ ක

11. මෙපුර ගනන් තන පිඬුවැනි යොවුනිනි රී
එ බ ර සුළා හඬනෙව් නද මෙවුල් සි රී
ප ව ර මොනර කර දගවී තම නොස රී
නිතර කියන වැනි මිණි නූපුර ගිගි රී

---

කාන්‍යාවන්; ඔවැදි, ප්‍රසතරිනවූ; කිරණින්, රශ්මියෙන්; සැදි, අලංකෘතවූ; මෙපුර, මේ නගරයෙහි; නුබමැදූ, ආකාශමධ්‍යයට; පැමිණි, ප්‍රාප්තවූ; තිරු, සූර්‍ය්‍යතෙම; ළහිරුරග, බාලාර්කයාගේ ආකාරයි.

9. නිල්මිණි, ඉන්ද්‍රනීල මාණික්‍යයන්ගේ; පැහැති, වර්ණය ඇත්තාවූ; තුඟු, උස්වූ; පහ, ප්‍රාසාදයන්හි; මිහිගුනිනදිනේ, මෘදඞ්ගභෙරිනාදය කරණකොටගෙන; කුල්මත්මෙනෙන් රැවටුණු, ක්‍රීඩාමෘතාවිපානයෙන් රැවටුණාවූ; මැදුරුසිකිකැනේ, ගෘහමයූරසමූහයෝ; තුල්, මහත්වූ; ගන ගිගුම්, මෙඝනර්ජිනාව; නොමඳ, අමන්දව; අසමින්, ශ්‍රවණයකරමින්; ඇම දිනේ, සැමදවස්හි; උදුසනේ, ප්‍රාතඃකාලයෙහි; දිනිඳුටමුත්, සූර්‍ය්‍යයාට මිසක්; පිල්නොමහඹත්, පිඤ්ඡාවස්තනය නොකෙරෙත්මය.

10 මනහර, මනොඥවූ; පුළුලුකුළු, පෘථුලශ්‍රොණීන්හා; පියයුරුබරන්, පයොධරභාරයන්; දැක, දර්ශනයකොට; බඹ, බ්‍රහ්මතෙමේ; සියුම්මෙමෙහෙවර, නිෂ්පණකම්මාන්තයෙහි; නොපහළවනැයි, සමර්ථනොවන්නේය (යන); සැක, ශඞ්කාව; අසෙක, සවලපයකුත්; හැමවරගනන්, සකල උත්තමාඞ්ගනාවන්ගේ; මැදපෙදෙසින්, මධ්‍යප්‍රදෙශ (ඉඟට්)ය කරණ කොටගෙන; නෙලඹු, නොලද්දෑවූ; පුරතුර, නගරාභ්‍යන්තරයෙහි; සරනා, හැසිරෙන්නාවූ; නොයෙක සලෙලුන්, අනෙක සල්ලාලයන්; සකි, යහළුව; බල, අවලොකනයකර.

11. මෙපුරගනන්, මේ පුරාඞ්ගනාවන්ගේ; තනපිඬු, පයොධර පිණ්ඩය; යොවුනිනිරිවැනි, යෞවනය ඉනිඹෙරන්නාක් වැනිය; මෙවුල්, මෙඛලාවන්ගේ; නදසිරි, නාදශ්‍රිය; එබර, ඒ පයොධරපිණ්ඩභාරය; උසුළා, උද්

12. කොමළ අදරකර සරණන ළපළුද ර
ඊ ඳු ළු දසත් කුසුමැති තන පල පත ර
ස ල ළු සලෙලු යදිදන මන නඳන ක ර
ල ක ළ මෙපුර ලිය කප්ලිය වෙනි පව ර

13. ඇ ති දෙර දෙර රත් ඉඳුනිල් මිණි තො ර ණ
පැ ති ර අඳුරු හැරැ කරැ පැලඹෙන කි ර ණ
නි ති රැ සරන වේමැඳු සුරගන හ ර ණ
වෙ ති මෙ බිසරු දිගැසිය සහතුටු උ ර ණ

14. ත ර පහ අග පලඹ කලදේ කො තෝ යා
භ ර ගිර හිසින් හුණු සුරගඟ ව තෝ යා
තොර නොව ලෙලෙන රත් දද පල වෙ තෝ යා
සු ර ගන එගඟ බැසැ කෙළිති සි තෝ යා

---

වහනාසකොට; හඬනෙව්, රොදනය කරන්නාක් වැනිය; මිණිනුපුරගි ගිරි, මාණික්‍ය නූපුරගර්ජිනාව; පවර, උතුම්වූ; මොනරකර, මයූර ග්‍රීවය; නම, නමාගේ; දග, ජඞ්ඝාවට; නොසරිවී, අසමානයයි; නිතර, අනවරතයෙන්; කියනවැනි, කථනය කරන්නාක් වැන්න.

12. කොමළ, කොමලවූ; අදරකර සරණන, තොල් අතුල් පතුල් නමැති; ළපලුදර, බාලපල්ලවයන් දරන්නාවූ; උදුළ, උජ්ජ්වලිතවූ; දසත්කුසුමැති, දන්ත නමැති පුෂ්ප ඇත්තාවූ; පතර, මහත්වූ; තනපල, පයොධර නමැති ඵල ඇත්තාවූ; සලළ, ලීලාසහිතවූ; සලෙලුයදිදන, සල්ලාල නමැති යාචකජයාගේ; මනනඳකර, චිත්තසන්තොෂකරන්නාවූ; ලකළ, අලඞ්කෘතවූ; මෙපුරලිය, මේ නගරස්ත්‍රීහු; පවර, උතුම්වූ; කප්ලියවෙනි, කල්පලතාවන් මෙනි.

13. දෙර දෙර,ද්වාරයක්පාසා; ඇති, විද්‍යමානවූ; රන්, සවණ්(තොරණයන්ගේද); ඉඳුනිල්මිණිතොරණ, ඉන්ද්‍රනීල මාණික්‍යතොරණයන්ගේද; කිරණ, රශ්මිය; පැහිර, ව්‍යාප්තිව; අඳුරුහැරැ, අන්ධකාර පහකොටද; කරැ, (අන්ධකාරකොටද;) පැලඹෙන, විජෘම්භමානවනකල්හි; වේමැඳු, විම්බ්‍යයෙහි; නිති, අනවරතයෙන්; රැ, රාත්‍රියෙහි; සරන, හැසිරෙන්නාවූ; සරගනහරණ, දිව්‍යාඞ්ගනාවන් සමානවූ; මෙහි, මේ නගරයෙහි; අභිසරුදිගැසිය, අභිසාරිකාඞ්ගනාවෝ;* සහතුටු, සන්තොෂය හා සමග; උරණ, කොපසහගත වූවාහුද; වෙති, වෙත්.

---

* පුරුෂයන් සිතැනට යන ස්ත්‍රීහු.

15. දළ සි ළු කැකුළු කොකවැළු දුළු සිරිරු කු ළු
මදවෙළු කකු ළු බි ගු නැ ළු කන්නලිනුලෙ ළු
රුපුරළු ගිම ළු පි හි කු ළු ගන කුළු එක ළු
ගජ මුළු නැබු ළු සු ල කු ළු මුළු බල යහ ළු

16. ම ද ග ල වරණ ගල පලකල කුළු පුව ළ
රුපු ඔ ල මොල ගහළහළ ලෙල පුරණතු ළ
නොවහල විරල රල පෙල හෙල දහර ස ළ
ර සු දු ල ලකළ හයපෙල බල සකි කොම ළ

---

14. පහඅග, ප්‍රාසාදමස්තකයෙහි; පලඹ, පැලඹෙන්නාවූ; කලදෝ කොතෝයා, කලම්බෝන(රිදී) ශෘඞ්ගයන්හි; නර, රශ්මිය; හරගිරිසිසින්, කෛලාසකූට මස්තකයෙන්; හුණු, පතිතවූ; සුරගඟවතෝයා, ආකාශ ගඞ්ගාව වැනිය; පලවෙතෝයා, ජදන (පියසි) සම්පයෙහි; තොරනොව, නිරන්තරව; ලෙලෙන, ලීලාපෙනවන්නාවූ; රන්දද, ස්වර්ණධ්වජයෝ (කෙසේද); සුරගන, දිව්‍යාඞ්ගනාවෝ; එගඟබැසැ, ඒගඞ්ගාවතීර්ණව; කෙළිති, ක්‍රීඩා කෙරෙත්යසි; සිතෝයා, චින්තනය වේ.

15. කැකුළු, කැකුළුවූ හෙවත් අලුත්වූ; දළසිළු, දන්තශිඛා නමැති; කොකවැළු, බලාකාවලියෙන්; උදුළු, උජ්ජ්වලිතවූ; සිරුරු,(ස්වකීය)ශරීර නමැති; කළු, කෘෂ්ණවර්ණය ඇත්තාවූ; මදවෙළු, මදයෙන් වෙළුණාවූ; කඳුළු, කාන්තිශවූ; බිඟුනැළු, භෘඞ්ගයන් නළනලද්දාවූ; උලෙලු, උත්සව ලෙලදෙන්නාවූ; කන්නලින්, කර්ණතාලයෙන් යුක්තවූ; රුපු, ශත්‍රු නාමැති; රළුගිමළු,රෞද්‍ර ග්‍රීෂ්මය පහකළාවූ; පිහිකුළු ගණකුළු, ප්‍රතිවචනාමෙඝකූටයන්හා; එකළු, එකාකාරවූ; ගජමුළු, හස්තිසමූහ නාමැති; නැබූළු, මිනන්වූ; සුලකුළු, අත්‍යලඞ්කෘතවූ; මුළු, පර්වතයන්; යහළු, මිත්‍රය; බල, නිරීක්ෂණය කර.

16. මදගල,මදගලිතවූ; වරණගල, හස්තිසමූහයා කරණකොටගෙන; පුවලකුළු, පෞෂ්පතුයෙන්; පලකල, ප්‍රකාශ කරනලද්දාවූ; ඔලමොල, වර්ණාති වර්ණවූ; රුපු, ශත්‍රු නාමැති; ගහළහළ, ගහල (කුනු කසල) යන් පහකළාවූ; ලෙල, ලීලාපෙනවූ; පුරණපුල, නගර නාමැති (ක්ෂීර) සමුද්‍රාභ්‍යන්තරයෙන්; හෙළදහර, සේවිත ජලධාරාව; අසළ, ආශ්‍රිතවූ; විරල, තුනීවූ; රලපෙල, තරඞ්ග පඞ්ක්ති (විලාසය); නොවහළ, බැහැර නොකළාවූ; රසුදුල, කිඞ්කිණිකයන් දිලියෙන්නාවූ; ලකළ, අලඞ්කෘතවූ; හයපෙල, අශ්වපඞ්ක්තිය; කොමල සකි,කොමල මිත්‍රය; බල,අවලෝකනය කර.

17. රුඳි රජ මිතුරු මහසෙන් උවිඳු කිවිගු රු
සුවිමල් කමල් සරම්නි දද දන ඉසු රු
යුතු හරිසඳු නිරිඳු විජයොත්පහ නිසු රු
මෙලෙසින් මෙපුරවර පුරඳරපුර අසු රු

18. දෙසඳුන් සපු මුහුළු සහයුරු වෙලෙප් ම තු
නදදුන් ගිරා පික සැළලිහිණි බිඟුයු තු
දුලනන් කුසුම් රෙනවුල වැලිතල දිමු තු
ගෙවුයන් සියන් දකැ ඇඳගත නොහැකි සි තු

---

17. රජමිතුරු, රාජමිත්‍රය; මහසෙන්, මහාසේනාවය; උවිඳු, උපාදක්‍ෂය; කිවිගුරු, කාව්‍යාචාර්‍ය්‍යය; (යන මොවුන්) රුඳි, රඤ්ජිතවූ; සුවිමල්, මනොඥ පක්‍ෂිමාලාවද; කමල්සර, පද්මනඩාගද; අම්නි, අප්‍රමාණවූ; දද, ධ්වජද; ඉසුරුදන, ඊශ්වර (ප්‍රධාන) සම්පාද ඇත්තාවූ; * හරිසඳු යුතු, හරිශ්චන්ද්‍රයා වැනිවූ; නිරිඳු, නරේන්ද්‍රයාහා; විජයොත්පහ, විජයොත් නම්වූ ප්‍රාසාදයද, නිසුරු; ආශ්‍රිතවූ–(දෝහෝ නොහොත්) රජ, චන්ද්‍රයාය; මිතුරු, සූර්‍ය්‍යයාය; මහසෙන්, මහාසෙනයාය; උවිඳු, විෂ්ණුය; කිවි, ශුක්‍රයාය; ගුරු, බෘහස්පතිය; (යනමොවුන්) රුඳි, රුදුණාවූ (වාසයකරන්නාවූ) සුවිමල්, අතිශයින් නිර්මලවූ; කමල්සර, පද්මනාඩාගය; මින්දද, මකරධ්වජ (අනඞ්ග) යාය; දනඉසුරු, වෛශ්‍රවණයාය; හරසඳුන් † හරිචන්දනය; ඉරිඳු, සෘජුවූ; විජයොත්පහ, වෛජයන්ත ප්‍රාසාදය; තේඉසුරු, අනෙකෛශ්වර්‍ය්‍යය (යනමෙසින්) යුතු, යුක්තවූ; මෙපුරවර, මේපුරප්‍රවරය; මෙලෙසින්, උක්තප්‍රකාරයෙන්; පුරඳර පුරඅසුරු, පුරන්දර(ශක්‍ර)පුරය ආකාරසී.

18. දෙසඳුන්, (ශ්වෙත රක්ත) චන්දනය; සපු, චම්පකය; මුහුළු, වකුලය; සහයුරු, ආම්‍රය; (යන මොවුන්ගේ) වෙලෙප් මතු, විටප (ශාඛා) මස්තකයෙහි; නදදුන්, නාදදුනය කරනලද; ගිරා, ශුකය; පික, කොකිලය; සැළලිහිණි, ශාරිකාය; බිඟු, භෘඞ්ගය; (යන මොවුන්ගෙන්) යුතු, යුක්තවූ; දුල, දිලියෙන්නාවූ; නන්කුසුම් රෙනවුල, නානා පුෂ්පපරාගාකුලවූ; වැලිතලදිමුතු, වාලුකාතලයෙන් දීප්තිවූ; ගෙවුයන්සියන්, ගෘහොද්‍යාන ශතයන්; දකැ, දර්ශනයකොට; සිතු, චිත්තය; ඇඳගන නොහැකි, ආකර්ෂණයකොට ගතනොහැක්කේය.

---

* එනම් රජකෙනෙක්—දූන් වනාහි "අලිච්චන්ද්‍ර රජය" කියා ව්‍යවහාර කරන්නාවූ සත්‍ය වචනයෙහිම පිහිටියාවූ ඉතා ගුණවන්තකෙනෙකි.

† දිව්‍ය වෘක්‍ෂ විශේෂයක්—හරේන්ද්‍රයාට ප්‍රියවූ සඳුන්ද, විෂ්ණු ප්‍රියවූ සඳුන් වර්ගද, සුදුසඳුන්ද, ගොශීර්ෂ නම්වූ මලයදෙශයෙහි උපන් රත්වන් සඳුන්ද, මේ **හරිචන්දන** නාමයෙන් කියනුලැබේ.

19. සුරපුර මෙපුර දෙතටුව සව් සිරින් පු රා
මහබඹ මෙර තුලාකරු බලනවර කි රා
ලුහු බැවිනෙදෙව්පුර රුඳුණෙව් සුනෙර සි රා
බටවැනි බරින් දෙරණට මෙපුර මනහ රා

20. ලෙ සේ පබළු රන්රිදි මිණි මුතු අකා ර
ගො සේ පසඟ තුරු සිව්රඟ සෙන් නිතො ර
වි සේ සවන් ඉසුරෙන් දිනු අලක පු ර
කෙ සේ වනම් එක මුවකින් සිරි මෙපු ර

---

19. සුරපුර මෙපුර, දිව්‍යපුරයහා මේ ජයවර්ධන නගර නමැති; දෙතටුව, (තරාදි) තට්ටුදෙක; සව්සිරින්, සකලෛශ්වර්යයෙන්; පුරා, සම්පූර්ණකොට; මහබඹ, මහා බ්‍රහ්මයාවිසින්; මෙර, මෙරු පර්වතය; තුලාකරු, තරාදිකඳකොට, කිරාබලනවර; (ඓශ්වර්යයෙන් වැඩිබර කවරෙක්දෝ හෝයි) ප්‍රමාණකර බලනකල්හි; එදෙව්පුර, ඒ දිව්‍යනගරය; ලුහුබැවින්, ලඝු (බරමදි) භාවයෙන්; සුනෙරසිරා, මෙරු මස්තකයෙහි; රුඳුණෙව්, නැවතුනාක් වැන්න; මනහරා, මනොඥවූ; මෙපුර, මේ නගරය; බරින්, (වැඩි) බර කරණකොටගෙන; දෙරණට, ධරණියට; බටවැනි, අවතීර්ණවූවාක් වැන්න.

20. පබළු රන් රිදී මිණිමුතු, ප්‍රවාල සවර්ණ රජත මණිමෞක්තිකය යන මොවුන්ට; අකරලෙසේ, ආකරාකාරවූ; (උත්පත්තිස්ථානය බඳුවූ)- පසඟතුරු ගොසේ, පඤ්චාඞ්ගික තූර්යඝොෂාවෙන්ද; සිව්රඟ සෙන්, චතුරඞ්ගිනි සෙනාවෙන්ද; නිතොර, නිරන්තරවූ; විසේසවන්, විශිෂ්ටවූ; ඉසුරෙන්, ඓශ්වර්යයෙන්; අලකපුර, ආලකමන්දා නම් නගරය; දිනූ, ජයගත්තාවූ; මෙපුර, මේ නගරයෙහි; සිරි, ඓශ්වර්යය; එකමුවකින්, එක මුඛයකින්; කෙසේ, කවරාකාරයකින්; වනම්, වර්ණනා කෙරෙම්ද.

තවද මේ පුරප්‍රවරාධිපති ප්‍රණත නරපති මකුට මණිවිරාජිත චරණාරවින්දයෙන් විරාජමානවූ මහාරාජාධිරාජයාගේ ගුණ වර්ණනායෙන් කර්ණ සාඵල්‍ය ලබ.

ඉක්බිති මේ ජයවර්ධන නගරවරයට අධිපතිවූ වදිනුපිණිස නැමුණු රජුන්ගේ ඔටුණු මැණිකෙන් විශෙෂයෙන් දිපහිමත්වූ පාද නමැති නෙළුම්මලෙන් බබලන්නාවූ මහාරාජාධිරාජයාගේ ගුණ ඇසීමෙන් කණේ සඵලකම ලබව.

21. ස ත කු ම් බා ගිරියුරු ගුණැති නිරස ර
මෙන කු ම් බා යොන්පාකළ රුපු සයු ර
බ ද කු ම් බා සරි සඳි දන් නඳන ක ර
පැ ර කු ම් බා නරනිඳු දින මෙපුර ව ර

22. දි න කර කුලග මෙනිරිඳු අයුරු පුරඳු රු
ග න තෙද නල දිවයුරු කිරණින් රුදු රු
වෙ න මිහිපල් කල් පුල් නෙතුපුල් අතු රු
දූ න වි කඳුලු පිනිබිඳු බලව විසිතු රු

23. ග න ව ල් ගිරි දුදුළ් සෙව්නා විපු ල් ව න
යුදලො ල් රදුන් සිළුමල් ගිහිණි ග ල් ව න
ම න ක ල් මෙරද සරණත තඹර තු ල් ව න
නි ය ම ල් කිලුටුකල පමණකි නිම ල් ව න

---

21. සතකුම්බා ගිරියුරු, ශතකුම්භ (මෙරු) පර්වතය ආකාරවූ; නිරසර ගුණැති, සම්රසාර ගුණානවිතවූ; කුම්බායොන් මෙන්, කුම්භයොනි (ඍෂි) යාමෙන්; රුපුසයුර, ශත්‍රු නමැති සාගරය; පාකළ, පහකළාවූ; (නොහොත්) පාකළ, පානයකළාවූ; බදකුම්බා සර්,භද්‍රකුම්භය සමානව; යඳිදන, යාචක සමූහයා; නඳනකර, සන්තොෂකොට; මෙපුරවර, මේ නගරවරයෙහි; පැරකුම්බා නරනිඳු, පරාක්‍රමබාහු නරෙන්ද්‍ර තෙම; දින, ජයගනීවා.

22. දිනකරකුලග, සූර්‍ය්‍යවංශයට අග්‍රවූ; පුරඳුරු අයුරු, ශක්‍රයා බඳුවූ; මෙනිරිඳු, මේ නරෙන්ද්‍රතෙම; (තමන්ගේ) රුදුරු, රෞද්‍රවූ; ගනතෙද නල, ඝනවූ තෙජෝ වහනිය නමැති; දිවයුරුකිරණින්, සූර්‍ය්‍ය රශ්මිය කරණකොටගෙන; වෙනමිහිපල්, අන්‍ය මහිපාලයන්ගේ; කල්, කාන්තාවන්ගේ; පුල්නෙතුපුල්, ප්‍රඵුල්ල නෙත්‍ර නමැති උත්පලයන්ගේ; අතුරු, අභ්‍යන්තරයෙහි; කඳුලු පිනිබිඳු, බාෂ්පනමැති තුෂාර බින්දූන්; දූනවි, උපදවීය; විසිතුරු, විචිත්‍රයක්; බලව, නිරීක්ෂණයකරව.

23. විපුල්වන, මහත්වූ; ගන, ඝනවූ; වල්ගිරිදුදුළු, වනදුර්ග පර්වතදුර්ගයන්; සෙව්නා, සෙවනය කරන්නාවූ; යුදලොල්, යුඩලොහිවූ; රදුන්,රාජයන්විසින්; ගිහිණි, අධිකකොට; ගල්වන, ගල්වන්නාවූ; සිළුමල්, ශිඛාමාලාවෙන්; තඹරතුල්වන, තාම්‍රරසය සමානවන්නාවූ; මනකල්, මනොඥවූ; මෙරද, මේ රාජයාගේ; සරණන, චරණයෙහි; නිමල්වන, නිර්මලවූ; නියමල්, නඛපුෂ්පයන්; කිලුටුකල පමණකි, කලිණකළාවූ ප්‍රමාණයක-අත් විපතක් නොකළ හැකිවූවෝය යනු භාවයි.

24. යු ග  ත පත සහසපතසිය කිරණ බ  ඳු
දි මු  ත මොහු තෙදග රුපු අඟිලැ විලැරු  ඳු
දි ග  ත දිවෙන යසඳුම ගුණ සුවඳ රැ  ඳු
මලො ත සරල් වරලස උනඹුවෝ මි  ඳු

25. උ ර ගි  ඳු නිහර හර සුදඟර ගඟ විය  ත
කෙලෙසි ඳු ඉඳු සිඳුරු සිඳුවර නිසිඳු සි  ත
පි රි සි  ඳු කරත මෙනිරිඳු යස රස දස  ත
කි රි සි  ඳු පැමිණිවර කිතුයුගය සිරිග  ත

26. ලෙව්දන මනැස කරවන සහතොස විපු  ල
මෙනිරිඳු රුවට පරදිනුවට පළමු ක  ල
මෙහෙසුරු දළැසඟින් කළ බව ගත වික  ල
සිතෙනුය මදනහට එමයසි සෙතට මූ  ල

---

24. යුගතපත, යුගාන්තයට පැමිණියාවූ; සහසපතසිය, සූර්‍ය්‍යයාගේ; කිරණබඳු, රශ්මිය වැනිවූ; රුඳු, මහත්වූ; දිමුත, දීප්තිමත්වූ; මොහු, මේ රාජයාගේ; තෙදග, තේජස්නමැති වහ්නිය; රුපු, ශත්‍රුනමැති; අඟිලැවිලැ, අඟිල්වනයෙහි ඇවිලි; ගුණසුවඳ, ගුණනමැති සුගන්ධයෙන්; රැඳු, රඤ්ජිතවූ; යසඳුම, කීර්ත්ති නමැති ධූමය; දිගත, දිශාන්තයෙහි; දිවැඑත, ධාවනයකොට එනකල්හි; උන්, ඔවුන්ගේ; අඹුවෝ, අම්බිකාවෝ; මලොත, පුෂ්පාකුලවූ; සරල්, රැලියෙන් යුක්තවූ; වරලස, ධම්මිල්ලයන්; මිඳු, මොචනය කළහ.

25. උරගිඳු, අනන්තනාගරාජයාය; නිහර, තුෂාර(පිනි)ය; හර, මුක්තාහාරය; සුදඟර, ශ්වෙතාඞ්ගරාගය; වියතගඟ, ආකාශ ගඞ්ගාවය; කෙලෙසිඳු, ඊශ්වරයාය; ඉඳුසිඳුරු, ඓරාවණ හස්තිරාජයාය; සිඳුවර, සින්ධුවාර(නිකමල්)ය; නිසිඳු, චන්ද්‍රයාය; සිත, ශුක්‍රයාය; (යන මේ මඞ්ගල්‍යවස්තු සමානවූ) මෙනිරිඳු, මේ නරේන්ද්‍රයාගේ; යස රස, කීර්ත්තිනමැති ජලය; දසත, දිශාන්තයන්; පිරිසිඳු කරත, පරිශුද්ධකරනකල්හි; කිතුයුගපැමිණිවර, කෘතයුගය පැමිණියාවූ කාලයෙහි; කිරිසිඳු, ක්ෂීරසමුද්‍රයාගේ; සිරි, ශෝභාව; ගත, ගත්තේය.

26. ලෙව්දන, ලෝකසත්වයාගේ; මනැස, චිත්ත නෙත්‍රයත්ය; සහතොස, සන්තොෂය; විපුලකරවන, මහත්කරවන්නාවූ; මෙනිරිඳු රුවට, මේ නරේන්ද්‍රයාගේ රූපයට; පරදිනුවට, පරාජයවීමට; පළමුකල, ප්‍රථම කාලයෙහි; මෙහෙසුරු, මහේශ්වරයා විසින්; දළැසඟින්, ලලාටාක්ෂි වහ්නියෙන්; ගත, ශරීරය; විකලකළබව, විකාරය කළාවූ භාවයෙක් ඇතද; මදනහට, අනඞ්ගයාහට; සෙතට මුල, සුවයට මුලක්වූයේ; එමයසි, එපමණක්මයයි; සිතෙනුය, චින්තනාය වන්නේවෙයි.

27. සවුළුකුල කමලකර දිමුතු දියනෙ ත
මෙනරපවර සුවිමල් පැවතුමින් යු ත
පසිඳු දියත නුවනත යලි නුවණ නෙ ත
මෙසක් යුවළ පැමිණිය සවනත සත ත

28. ති ල ක ට තිලකවන් මොහු දිය ඉසුරුප තා
නි ල ක ට ගෙනැ කොපුල් ඇඳි ගජසමින් යු තා
ව ල ක ට වැදි විසල් ගෙනැ උමයගන අ තා
සෙලක ට නැගී තව රකිනෙව් පටන් ග තා

29. කි ර ණි ඳු කුල කමල රජහසවන් ල කු ළු
මෙ නි රි ඳු උදය ගිරි සැදි මිණි කිරුළු කු ළු
පි රි සි ඳු හිරවරණ පිරිසඳිනි නොහ කු ළු
නෙනිරි ඳු සුපුල් කරසියපත් විය මු කු ළු

---

27. සවුළුකුල, සවුළු වංශ නාමැති; කමලකර, පද්මාකරය; දිමුතු, දීප්ති මත්කරන්නාවූ; දියනෙත, සූර්‍ය්‍යයා වැනිවූ; සුවිමල්, අතිශයින් නිර්මලවූ; පැවතුමින්යුත, ප්‍රවෘත්තිනයෙන්යුක්තවූ; මෙනරපවර, මේනරප්‍රවරයාගේ; දියතපසිඳු, ලොකප්‍රසිද්ධවූ; නුවනත, නෙත්‍රය; යලි, නැවත; නුවණ නෙත, ඥානනෙත්‍රය; (යන) මෙසක්යුවල, මේචක්ෂු යුග්මය; සවනත, ශ්‍රවණාන්තරයට; සතත, අනවරතයෙන්; පැමිණිය, ප්‍රාප්තවිය.

28. තිලකට, ත්‍රිවිධ ලඞ්කාවට; තිලකවන්, තිලකය වැනිවූ; මොහු, මේ රජයාගේ; දිය ඉසුරුපතා, ජය ඓශ්වර්‍ය්‍යය ප්‍රාර්ථනාකොට; නිල කට, නීලකණ්ඨ (ඊශ්වර) තෙම; කොපුල්, කපාලයක්; (ඉස්කබලක්) ගෙනැ, ග්‍රහණයකොට; ඇඳි, අවජාදිතවූ; ගජසමින්යුතා, හස්ති චර්මයෙන් යුක්තවූයේ; විසල්, මහත්වූ; වලකට, අරණ්‍යයකට; වැදි, ප්‍රවිෂ්ටව; උමය ගන, උමයඞ්ගනාවගේ; අතා, හස්තය; ගෙනැ, ග්‍රහණයකොට; සෙල කට, ශෛලයකට; නැගී, ආරූඪව; තව, තාපසභාවය; රකිනෙව්, රක්‍ෂා කරන්නකුමෙන්; පටන් ගතා, ආරම්භග්‍රහණයකෙළේය.

29. කිරණිඳුකුල, සූර්‍ය්‍යවංශනාමැති; කමල, පද්මය; ලකුළු, අලංකෘත කළාවූ; රජහසවන්, රාජ හංසයා වැනිවූ; මෙනිරිඳු, මේ නරෙන්ද්‍රනාමැති; උදයගිරි, උදයපර්වතයෙහි; මිණි කිරුළු, මාණික්‍ය කිරීට නාමැති; කුළු, කූටයෙහි; සැදි, සජ්ජිතවූ; නොහකුළු, අප්‍රතිවජනනාවූ; පිරසිඳු, පරිශුද්ධවූ; හිරවරණ, ඡත්‍ර නාමැති; පිරිසඳිනි, පූර්ණ චන්ද්‍රයා කාරණකොටගෙන; නෙනිරිඳු, අනෙක නරෙන්ද්‍රයන්ගේ; සුපුල්කරසියපත්, සොනප්ලල හස්ත නාමැති පද්මතෙම; මුකුළුවිය, කුඩ්මලවූයේය හෙවත් හැකුළුණේය.

30. වැර සැර නොයෙක සිව්රඟ සෙනඟ පිරිවැ රූ
පු ර වෙයපත අරා අයිරාවණ සිඳු රූ
ව ර මිණිකිරුළු සහසිව්සැට බරණඳ රූ
නර ලොවැ පසක් පුරඳුරුසිරි පැයි මෙවි රූ

31. ක ර ද ර විරිඳු රණරණ දිලි ලවගබ ඳ
ති ර ස ර සුමෙර සරි මෙනිරිඳුගෙ මනාන ඳ
පෙ ර ස ර සන තුබූ යසදස දිගතැඇ ඳ
උ ර හ ර ගිරය තෙලි මකුළුතු කිරිමුහු ඳ

32. නූ නා වැළඳි සිරි මොහු තිළිණ යස ස ක
ගා නා සඳෙහි සුරඟන වෙණ තබා ඇ ක
නානා දෙස වැනෙන නෙලෙනතු තිදසරු ක
පා නා වැනි සතොස සලමින් හිස නිස ක

---

30. වැරසැර, වීරසාරවූ; නොයෙක සිව්රඟ සෙනඟ, අනෙකචතුරඞ්ගිණීසෙනාව; පිරිවැරූ, පරිවාරණය කරනලද්දාවූ; අයිරාවණ සිඳුරූ, ඓරාවණ හස්තියාට; අරා, ආරූඪව; පුරවෙයපත, නගරවීථියට පැමිණියාවූ; වර, උත්තමවූ; මිණිකිරුළුසහ, මාණික්‍යකිරීටසහිතවූ; සිව්සැටබරණ, චතුෂ්ෂෂ්ඨිආභරණයන්; දරූ, ධාරණයකළාවූ; මෙවිරූ, මේවීර තෙමේ; නරලොවැ, මනුෂ්‍යලොකයෙහි; පසක්, ප්‍රත්‍යක්ෂවූ; පුරඳුරුසිරි, ශක්‍රයාගේ ශොභාව; රූපැසි, ගෙනහැරදක්වී.

31. කරදර, කෲරධාර්වූ; විරිඳු, විරුඞකාරයන්ගේ; රණරණ, යුඞනැමැති අරණ්‍යයට; දිලි, දිලිසෙන්නාවූ; ලවගබඳ, දවාගනියන් බඳුවූ; තිර සර, ස්ථිරසාර (ගුණ) යෙන්; සුමෙරසරි, මෙරුපර්වතය සමානවූ; මෙනිරිඳුගෙ, මේනරෙන්ද්‍රයාගේ; මනානඳ, මනොනන්දනවූ; යස, කීර්තිය; සර සන, බ්‍රහ්මයාවිසින්; පෙර, පූර්වයෙහි; දසදිගතැ, දශදිශාන්තයෙහි; ඇඳ, අඤ්ජනයකොට; තුබූ, තබනලද්දාවූ; නෙලි, නෙල්ල (තෙලිකුර) නම්; උර හරගිරය, කෛලාශපර්වතයයි; මකුළුතු, මකුළුඋතුකටුව නම්; කිරිමුහුඳ, ක්ෂීරසමුද්‍රයයි.

32. සිරි, ශ්‍රීකාන්තාව විසින්; නූනා, මොචනයනොකොට; වැළඳි, ආලිඞ්ගනය කරනලද ;මොහු, මේ රාජයාගේ; තිළිණයසසක, නානාගුණ හා කීර්තිසමූහය; සුරඟන, දිව්‍යාඞ්ගනාවන් විසින්; වෙණ, වීණාව; ඇක, අඞ්කයෙහි; තබා, ස්ථාපනයකොට; ගානාසඳෙහි, ගායන්නාවූ කාලයෙහි; නෙලෙන්, මාරුතයෙන්; නානාදෙස, අනෙකදිසාවට; වැනෙන, චචල වන්නාවූ; තිදසරුකඅතු, ත්‍රිදශවෘක්ෂශාඛානොමෝ; හිස, ශීර්ෂය; සල මින්, චලනයකරමින්; නිසක, නිඃශඞ්කාව; සතොස, සන්තොෂය; පානාවැනි, ප්‍රකාශකරන්නාක්මෙනි.

33. කි රි සමුදුර වෙනුද සුරවරණ හිදසි ඳු
කි රි හසනිවට කලඳේ ගිර මෙහෙසුරු ඳු
දි රි කරු සුලා සිටිණේ නිතරම පුරු ඳු
ස රි සිරිපතාදෝ? යසසට මෙනරනි ඳු

34. ද ඹ දෙණි අලක පුරවැසි දිනිසුරු විල ස
ලො බ වත මෙරජු වෙතැ සරසම් සිරි නිවෙ ස
ත ඹ රණ පිවිසැ වියොවග වනුව සිහිල ස
බ ඹ දියබඳ දෙදෙන විඳිනේ වෙද වෙහෙ ස

35. මි න් ඉබි කුරු වරා නරසී ගොපලුවෙ ස
වෙ න් ගත් මෙ ඇ නන්විකරන් දැකැ සියැ ස
පි න් වත් අප නිරිඳුවෙතැ පවතිනෙක ලෙ ස
ම න් තොස්වෙමින් විසු සිරිසඳ ඇමදව ස

---

33. කිරිසමුදුර, ක්ෂීරසමුද්‍රයවිසින්; වෙනුද, විෂ්ණුද; සුරවරණ, ඓරාවණයා විසින්; හිදසිඳු, ශක්‍රයාද; කිරිහස; ශ්වේතහංසයා විසින්; නිවට, බ්‍රහ්මයාද; කලඳේගිර, කෛලාශ පර්වතය විසින්; මෙහෙසුරුඳු, මහේශ්වරයාද; නිතරම, අනවරතයෙන්ම; පුරුඳු, පරිචිතවූ; දිරිකරු, ධෛර්‍ය්‍යය කොට; උසුලාසිටිණේ, උද්වහනය කොට සිටින්නේ; මෙනරනිඳු, මේ නරේන්ද්‍රයාගේ; යසසට, කීර්තියට; සරිසිරි, සමාන ශොභාව; පතාදෝ, ප්‍රාර්ථනාකොටදෝ?

34. දඹදෙණි, ජම්බුද්‍රෝණි නමැති; අලකාපුර, ආලකමන්දා නම්වූ නගරයෙන්; දිනිසුරුවිලස, වෛශ්‍රවණයා විලාශයෙන්; වැසි, වාසයකරන්නාවූ; මෙරජුවෙතැ, මේ රාජයාකෙරෙහි, සරසම්සිරි, සරස්වතිය හා ශ්‍රීකාන්තාව; නිවෙස, නිත්‍යවාසයට; ලොබවත, ලොභවූකල්හි; වියොවග, වියොග වහනිය; සිහිලසවනුව, සීතල වතුපිණිස; තඹරණ, තාම්‍රසපට හා ක්ෂීරාර්ණවයට; පිවිසැ, ප්‍රවේශව; බඹදියබඳ දෙදෙනා, බ්‍රහ්මයාහා විෂ්ණු යන දෙදෙනා; වෙහෙස, විහිංසනය; විඳිනේවෙද, විඳනායකරන්නේ වේද.

35. වෙන්, විෂ්ණුහු විසින්; ගත්, ගත්තාවූ; මින්, මත්ස්‍යය; ඉබි, කූර්මය; කුරු, වාමනය; වරා, වරාහය; නරසී, නාරසිංහය; ගොපලුවෙස, ගොපාලවේශය; (යන) මෙඇනන් විකරන්, මේ ආදිවූ නානාවිකාරයන්; සියැ, සවකීයාක්ෂියෙන්; දැකැ, දර්ශනයකොට; එකලෙස, එකාකාරයෙන්; පවතින, ප්‍රවර්තනය වන්නාවූ; පින්වත්, පුණ්‍යවන්තවූ; අපනිරිඳුවෙතැ, අපගේ නරේන්ද්‍රයා කෙරෙහි; ඇමදවස, සැමදවස්හි; මන්තොස් වෙමින්, චිත්තසන්තොෂ වෙමින්; සිරිසඳ, ශ්‍රීකාන්තා නොමෝ; විසු, වාසයකරන්නීය.

36. අ   ණ තද විකුම් පින්යස තෙද මියුරු බ   ණ
නැ ණ බල රුසිරු දප් හිරෙතප් මෙත් කුලු ණ
ර   ණ දිරි සැදූ දන්සිල් සිහි මෙ ඇ ගු   ණ
ග   ණ සහ නිපන් මෙනිරිඳු තුල සලකල   ණ

37. ම හ ත සැපත මොනු ගුණතෙද පවස   ත ය
ස ත ත සහසනෙත දෙව්මැති පසව   ත ය
ව ත ත සවන දිතගුරු සොම් බඹක   ත ස
ස ම ත මෙසුර සැකහැරනත නොසම   ත ය

38. පුවත ර සව්සිරින් නරලොවට පත්මු   දු න්
නදක ර යදිදනන් මෙන් සුරබිනවන   දු න්
මනහ ර බ සි න් විලසින් හෙබි මෙනරනිඳු න්
අව ස ර රැ ග න් සිරිපා තඹර දී මු   දු න්

---

36. තදඅණ, සනාබාධආඥාය; විකුම්, වික්‍රමය; පින්, පුණ්‍යය; යස, කීර්තිය; තෙද, තේජස්ය; මියුරුබැණ, මධුරවචනය; නැණ, ඥානය; බල, ශක්තිය; රුසිරු, රූපශ්‍රීය; දප්, දර්පය; හිරි, ලජ්ජාය; ඔතප්, පාපයට භයය; මෙත්, මෛත්‍රිය; කුලුණ, කරුණාවය; රණදිරි, යුධ ධෛර්‍ය්‍යය; සැදූ, ශ්‍රද්ධාවය; දන්, දානය; සිල්, ශීලය; සිහි, සමෘතිය (යන) මෙඇගුණගණ සහ, මේආදි ගුණසමූහය සමග; නිපන්, උපන්නාවූ; මෙනිරිඳු, මේ නරේන්ද්‍රතෙම, සලකලණතුල, සාලකල්‍යාණය සමානය.

37. මොනු, මේරාජයාගේ; මහත, මහත්වූ; සැපත, සම්පත්තියද; ගුණ, ගුණයද; තෙද, තේජස්ද; සැකහැර, ශඞ්කාදුරුකොට; පවසනය, ප්‍රකාශකරනතෙනත්; සතත, (මහා) බ්‍රහ්මයාද, සහසනෙත, ශක්‍රයාද, දෙව්මැති, වෘහස්පතීද; පසවනය, පංචවක්ත්‍ර (විශ්වකර්ම) යාද; වනත, ගණේශ්වරයාද; සවන; ස්කන්ධකුමාරයාද; දිතගුරු, ශුක්‍රයාද; සොම්, බුද්ධද, බඹසහනය, සරස්වතීද; (යන) මෙසුර, මේ දිව්‍යයෝ; සමත, සමර්ථයෝය; අනත, අනන්තැත්තෙන්; නොසමනය, සමර්ථනොවත්තේය.

38. පුවතර, ප්‍රසිද්ධවූ; සව්සිරින්, සර්වෛශ්වර්‍ය්‍යයෙන්; නරලොවට, මනුෂ්‍යලොකයට; මුදුන්පත්, මස්තකප්‍රාප්තවූ; සුරබිනවනදුන් මෙන්, සුරභිධෙනුව හා නවනිධානයමෙන්; යදිදනන්, යාචකසමූහයන්; නදකර, සන්තොෂකරන්නාවූ; මනහර, මනොඥවූ; බසින් විලසින්, වචනයෙන් හා ලීලාවෙන්ද; හෙබි, ශොභමානවූ; මෙනරනිඳුන්, මේ නරේන්ද්‍රයන්ගේ; සිරිපාතඹර, ශ්‍රීපාද පද්මයට; මුදුන්, මස්තකය; දී, දානයකොට; අවසර රැගන්, අවකාශග්‍රහණයකර.

39. පෙර මුනිඳුන් තමහට කළ ගුණ පව ර
ක ර සඳහන් සුරරද පිදූ කිරුළයු ර
න ර සර හිවි පහතුර වොරැදි විසිතු ර
න ර පතරැහි පත රන්මිණි කරඬුතු ර

40. වි හි ද කැලුම් සිතලෙව් සත නෙත තර ඟ
සු ස ද රඳන හෙළදිවඹරැ ළසඳ ර ඟ
ඇ ම ද සතන් නඳ කළ නර සුරනු ර ඟ
ද ළ ද හිමිඳු වැඳැ පලලබ සග පව ග

41. දි න ර ත් නමා වන් තෙද යස කොත්න ඟ න
පැ න ර ත් නමා මිතුරෙන් සෙත් මග ම ග න
ව න ර ත් නමා ළය යුතු උරතල ර ඟ න
ව න ර ත් නමා හිමි වඳු සහ මහස ඟ න

---

39. පෙර, පූර්වයෙහි; පවර, උතුම්වූ; මුනිඳුන්, සර්වඥයන්වහන්සේ විසින්; තමහටකළ, තමාහට කරනලද්දාවූ; ගුණ, ගුණය; සුරරද, ශක්‍රයා විසින්; සඳහන්කර, සමරණයකොට; පිදු, පුදනලද්දාවූ; කිරුළයුර, කිරීටාකාරවූ; නරසර, සර්වසාරවූ; හිවි, උස්වූ; විසිතුර, විචිත්‍රවූ; පහතුර, ප්‍රාසාදාභ්‍යන්තරයෙහි; වොරැදි, විරාජමානවූ; තරපතරැහි, රශ්මිසමූහය ඇත්තාවූ; රන්මිණිකරඬු තුර, ස්වර්ණයෙන් හා මාණික්‍යයෙන්ද කර නලද කරඬු ඇතුළට; පත, පැමිණියාවූ.

40; සිතකැලුම්, ශ්වෙතකාන්තිය; විහිද, විසර්ජනයකොට; ලෙව්සත, ලොකසත්වයාගේ; නෙත, නෙත්‍රයෙහි; තරඟ, තරඞ්ගයන් (මෙන්) සුසද, මනාව සජ්ජිතකොට; හෙළදිව්, සිංහලද්වීප නමැති; අඹරැ, ආකාශයෙහි; ළසඳරඟ, බාලචන්ද්‍රාකාරයෙන්; රඳන, රජමානවූ; නරසුරනුරඟ, මනුෂ්‍ය දෙවනාගයන්ගේ; සතන්, සන්තානයන්; ඇමද, සැමදවස්හි; නඳකළ, සන්තොෂකළාවූ; දළදාහිමිඳු, දංෂ්ට්‍රාධාතු ස්වාමින්ද්‍රයා; වැඳැ, නමස්කාර කොට; සගපවගපල, ස්වර්ගාපවර්ග ඵලය; ලබ, ලබාගනුව.

41. දිනරත්නමාවන්, සූර්යයා හා චන්ද්‍රයාවැනිවූ; තෙදයස, තෙජස හා කීර්තිය; කොත්, ශෘඞ්ගයන් (මෙන්); නඟන, ආරොපණයකරන්නාවූ; පැන, ප්‍රඥනමැති; රත්නමා මිතුරෙන්, රුවන්මහපානින්; සෙත්මග, ශාන්තිමාර්ගය; මගන, බලන්නාවූ; උරතල, වක්ෂස්ථල (හෘදය) යෙහි; රඟන, නෘත්‍යකරන්නාවූ; (නොනොත්) පවත්නාවූ; වනරත්නමාලය යුතු, විනයනමැති රත්නමාලාවෙන් යුක්තවූ; මහසඟන සහ, මහාසඞ්ඝයාසමග; වනරත්න මාහිමි, වනරත්න සඞ්ඝරාජමනා ස්වාමීන්වහන්සේ; වඳු, නාමස්කාරකර.

42. දි ත් රද පිණිස සුරපියුමැසි නමැති ලො ළ
ග ත් සිය අහින් කොහි නැනැ මෙර සිදුරුක ළ
ග ත් තෙද රුසෙව් මහසෙන් දෙව් රදු නුදු ළ
සි ත් සහතොසින් නමදුව දෙනුව මනදෙ ළ

43. දින කර දිනැ හතය සොම්ළදුරි ලග තු රු
පන ව ර නැමදූ තෙරුවන් සිහිනි පිවි තු රු
සිරි බ ර මෙනුවරින් මනරම් ඉටුම් තු රු
සිහි ක ර යතුරු කර කරණීමෙත් සු තු රු

44. * ලොල වඩවන ගජහය පුන් කලස් හි වි
කු ල ගන සසක් කුසතණ බමුණන් පෙර වි
න ල සෙව් ඉදිරිවන ගෙනැ මුවරද සැක වි
බ ළ සුබ නිමිති තොපයන පෙරමගැ පරෙ වි

---

42. සුරපියුමැසි නමැති, පද්මාසුරය යන නම්ඇත්තාවූ; දිත්රදපිණිස, අසුරරාජයා පිණිස; ලොළ, (ඇතිමට) ලෞල්‍යයෙන්; සියඅහින්ගත්, ස්වකීය හස්තයෙන් ගන්නාලද්දාවූ; කොහින්, කුන්තයෙන්; ඇනැ, ඇනීමකොට; මෙර, මෙරුපර්වතය; සිඳුරුකළ, ඡිද්‍රකළාවූ; තෙදරුසෙව්, තේජෝරශ්මියක් වැනිවූ; ගත්, ශරීරයෙන් යුක්තවූ; උදුළ, උජ්ජ්වලිතවූ; මහසෙන් දෙව්රදුන්, මහාසෙන දිව්‍යරාජයන්; මනදෙළ, චිත්තදෙහලය; දෙනුව, දැනායකරනුපිණිස; සිත්සහතොසින්, චිත්තසන්තොෂයෙන්; නමදුව, නමස්කාරකරව.

43. දිනකර දිනැ, දිවාකර දිනයෙහි (යෙදුණාවූ); හතය, අකීතාම්වූ නක්ෂත්‍රයද; ළදුරලනතුරු, කන්‍යාලග්නාභ්‍යන්තරයට (පැමිණියාවූ); සොම්, සෞම්‍යයා (බුදහු)ද ඇතිකල්හි; පනවර, පුනර්වසෙහි; පිවිතුරු සිහිනි, පවිත්‍ර චිත්තයෙන්; තෙරුවන්, ත්‍රිවිධරත්නය; නැමදූ, නමස්කාරකොට; සිරිබර, ශ්‍රීසම්භාරිතවූ; මෙනුවරින්, මේ නගරයෙන්; මනරම් ඉටුම්තුරු, මනොරම්‍ය ඉෂ්ටමිත්‍රය; කරණීමෙත් සුතුරු, කරණීයමෙත්තනම්වූ සූත්‍රය; සිහිකර, ස්මරණයකොට; යතුරුකර, යාත්‍රාකර.

44. හිවි, උස්වූ; ලොලවඩවන, ලෞල්‍යවර්ධනය කරවන්නාවූ; ගජහය පුන්කලස්, හස්ත්‍යශ්ව පූර්ණඝටය; කුලගන, කුලාඞ්ගනාව; සසක්, සඞ්ඛ සහිතවූ; කුසතණ, කුසතෘණය; පෙරම් බමුණන්, පූර්ණිතබ්‍රාහ්මණය

---

* මේ කවියේ පළමුවෙනි පාදේ මාත්‍රාවක් අඩුයි-පොතකළ කාගේ එසින් එලෙසම තියන්ට ඇතක්සා සිතෙන බැවිනුත්, සමුද්‍ර ඝොෂා නම් සිවුපද වගය

45. නු  ඹ මිණි අලුත් වනවන කත් අතු අනි  න
ල  ඹ මල් කැනති සෙමරින් විදැ විදැ පව  න
දෙ ඹ අතු සෙවන තුරු සැනපි ඉඳැ යෙහෙ  න
නු  ඹ සිතුලෙසින් මිතුරිඳු එතැනින් වඩ  න

46. සුවිමල්ලමැණිකුල–තිලකෙව් උදුල හැමක  ල
සිරිසඳ නොසින්රැඳි කුසුමෙව් නොකල  ම් බා
සිරියස තෙදැති නරනිඳු මේ පැරකු  ම් බා

පතාඹුදු සිරිසව්–සතවෙතැකුලුණු දියුණු  වැ
කරවා දෙමාලින් මුනිමැඳුරක් මහ  රු
පුරවා සව්සිරින් කරැතෙසිත පිවිතු  රු

---

(ඇන මොවු)න්ද; ඉදිරිවන, අභිමුඛවනය; සෙව්, ආශ්‍රයකළාවූ; මුවරඳ සැකවී, මකරන්දසමූහය; ගෙනැ, ග්‍රහණයකොට; (එන්නාවූ) නල, මාරුතයද;(යන) සුබනිමිති, ශුභනිමිත්තයන්; පරෙවි, පාරාපතය; නොපයන, යුෂ්මත්නු යන්නාවූ; පෙරමගැ, ප්‍රතිපථයෙහි; බල, නිරීක්ෂණයකර.

45. නුඹමිණි, සූයසීයඃ; අලුත්වන, අභිනවවූ කල්හි; වන, අරණ්‍යන මැති; කත්, කාන්තාව විසින්; අතු, ශාඛානමැති; අනින, හස්තයෙන්; ලඹ, එල්වෙන්නාවූ; මල්කැනති, පුෂ්පස්තවක නමැති; සෙමරින්, චාමරයෙන් (ගසනලද); පවන, මාරුතය; විදැ විදැ, විජනය කොට කොට; දෙඹඅතු සෙවන තුරු, පූනාගශාඛා ඡායාභ්‍යන්තරයෙහි; යෙහෙන, සුවසේ; සැනපිඉඳැ, සන්තර්පිතව ඉඳ, මිතුරිඳු, උතුම්වූමිත්‍රය; නුඹ, යුෂ්මත්නු; සිතුලෙස, සිත්වූ පරිද්දෙන්; එතැනින්, ඒ ස්ථානයෙන්; වඩන, ප්‍රයාණය කරන්න.

46. සුවිමල්, අතිශයෙන් නිර්මලවූ; ලමැණිකුල, ලම්බකර්ණවංශයට; තිලකෙව්, තිලකයමෙන්; හැමකල, සැමකල්හි; උදුල, උජ්වලිතවූ; සිරිසඳ, ශ්‍රීකාන්තාව විසින්; නොකලම්බා, ක්ෂුභිතනොකොට; රැඳි, රජමානවූ; කුසුමෙව්, පුෂ්පයමැනිවූ; සිරියස තෙදැති, ඓශ්වර්‍ය්‍යයද කීර්තියද තෙජස්ද ඇත්තාවූ; මේ පැරකුම්බා නරනිඳු, මේ පරාක්‍රමබාහු නරේන්ද්‍රයා විසින්—සව්සතවෙතැ, සකල සත්‍වයාකෙරෙහි; කුලුණු, කරුණාව; දියුණුව, විතුණව; බුදුසිරි, බුද්ධශ්‍රීය; පතා, ප්‍රාර්ථනාකොට; දෙමාලින්, ද්විභූමකයෙන් යුක්තවූ; මහරු, මහාර්ඝවූ; මුනිමැඳුරක්, සර්වඥමන්දිරයක්; කරවා,

---

මාත්‍රා 17, 18, 19 යෙන්, සියාතිබෙන බැවිනුත්, මේ වෘත්තවල මාත්‍රාවික අඩුවැඩිවීම ඡන්දශාස්ත්‍රයට විරුද්ධනොවන බැවිනුත් මෙහි ඌනමාත්‍රාව සම්කරන්ට කල් පනානොකෙලෙමු.

සියගුරු බිසෝහිමිසඳ නම්නි පිරිවෙන ක්
කරවා පැපිළියානෙහි මහසඟනනොයෙ ක්
වසනුව දෙවූ වෙහෙරට පිවිසැ නොසිනුද ක්
ඉඳැසැතපි ගතැ සරතැස නිවා මඳ ක්

47. සැඩ නා යක් අසුර බඹනර මරු නොම ද
ම ඩ නා උදම් කෝදල දප සිඳැපසි ද
දි ඩ නා රදෙව් තිත් නල රණ පත පසි ද
ව ඩ නා මැනවි මුනිරජ සිරිපා නැම ද

48. පැ යෙ න් අදර පබළකුරන් ගත් එ ඞි ය
තෝයෙ න් සිහිලුපුල් මුවරඳ වත් වැ ඞි ය
ගී යෙ න් කොවුල්සර අඟවන මත්වැ ඞි ය
ඒ යෙ න් එතර අඟනන් දකු අත්ති ඞි ය

---

කාරපිතකොට; නෙසින, ත්‍රිවිධවිතානය; පිවිතුරුකර, පවිත්‍රකොට; සවිසි රින්, සවෛශ්‍වය්‍ෂීයෙන්; පුරවා, සම්පූණීකරවා—පැපිළියානෙහි, පැපිළියාන නම්වූ ග්‍රාමයෙහි; සියගුරු බිසෝහිමිසඳ නම්හි,ස්වකීය මාතෘ මහෙෂිකා ස්වාමි චන්ද්‍රිකාවගේ නාමයෙන්; කරවා, කාරපිතකොට; නොයෙක් මහසඟන, අනෙක මහාසඞ්ඝයාට; වසනුවදෙවූ, වාසයකරනු පිණිස දුනයකරවූ; වෙහෙරට, විහාරයට; උදක්නොසින්, හුදකලාසනොනාෂයෙන්; පිවිසැ, ප්‍රවෙශව; සැනපිඉඳැ, සන්තර්පිතව ඉඳ; ගතැ, ශරීරයෙහි; සර තැස, ශ්‍රානතය(විඩාව); මදක්, ස්වල්පයක්; නිවා, නිර්වාපණයකොට.

47. නොමද,අමන්දවූ; සැඩ,චණ්ඩවූ; නා යක් අසුර බඹ නර මරු, නාග යක්ෂ දානව බ්‍රහ්ම මනුෂ්‍ය මාරයන්ගේ; උදම්, උන්නතවූ; කෝදල, කොප නමැති වහනියගේ; දප, දර්පය; සිඳ පසිඳැ, ජිතාග ප්‍රවජිතානකොට; මඩනා, මර්දනය කරන්නාවූ; තිත්, තිර්ථික නාමැති; නාලරණ, බටවනය; පසිඳ, ප්‍රච්ඡිතානකොට; පන, පැමිණියාවූ; දිඩ, දෘඪවූ; නාරදෙව්, හස්තිරාජයෙකු වැනිවූ; මුනිරජ, සර්වඥරාජයාගේ;සිරිපා, ශ්‍රීපාදය; නැමද නමස්කාරකොට; වඩනා මැනව්, ප්‍රයාණයකළ මැනව.

48. අදර පැයෙන්, අධර වර්ණයෙන්; පබළකුරන්, ප්‍රවාලඞ්කුරයන්ගේ; එඞිය, දර්පය; ගත්, ග්‍රහණයකළාවූ; උපුල් මුවරඳ, උත්පල මකරන්දයෙන් යුක්තවූ; සිහිල්තෝයෙන්, සීතල ජලයෙන්; වත්වැඩිය, වක්ත්‍රබොවනයකොට; කොවුල්සර, කොකිල නාදය; ගීයෙන්, ගීතිකාවෙන්; අඟවන, විඥාපනය කරන්නාවූ; මත්වැඩිය, වර්ධනවූ දර්පය ඇත්නාවූ; ඒයෙන්, සොබනයෙන්; එතර, පරතිරයෙන්; අත්හිඩිය, අත්තිඩිය නම්වූ ග්‍රාමයෙහි; අඟනන්දකු, සත්‍රීන් බලව.

49. නි සා කර අයුරුවත් පැහැදැ බැබ ලියේ
ග සා පවන් හන්සළු කුලෙනි ඉගි ලියේ
ල සා නොව යනෙන ලිය දැකැ නොවමැලියේ
නො සා වඩන මග බැසැ මොරටුව එ ලියේ

50. උ ගු සැව්ගුරු සයුර අලළන මඳර ගි රේ
අ ගු පලඳන දද මිණි රැස් විසුළ යු රේ
දි ගු එළිකරැ තරුතර පෙනෙන නුබ තු රේ
ල ගු කලරැව් දෙව් විමනත පාණදු රේ

51. පෙර දිගඟන දිවයුරු රන් දපණ ත ල
ගතරළතින් දලනිඳු වසන තින්නි ල
නෙතැ නිදි දැහැ සිහිකරැ තුනුරුවන් බ ල
ලැගි නිවෙසින් නැඟිසිට කරැ පියසස ල

---

49. නිසාකර අයුරු, චන්ද්‍රයාගේ ආකාරයෙන්; පැහැදැ,ප්‍රසන්නව; බැබලියේ, භ්‍රාජමාන වන්නාවූ; වත්, වක්ත්‍රය ඇත්තාවූ; පවන්ගසා, මාරුතප්‍රවෙශව; උකුලෙනි, ශ්‍රොණියෙන්; ඉගිලියේ, ඉගිලුනාවූ; හන්සළු, අවඡාදිත වස්ත්‍ර ඇත්තාවූ; ලසානොව, අකුසීතව; යනෙන, ගමනා ගමනය කරන්නාවූ; ලිය, කාන්තාවන්; දැකැ, දර්ශනයකොට; මැලියේ නොව, ආලස්‍යනොවී; මොරටුව එලියේ, මොරටුව එලියෙහි; මගබැසැ, මාර්ගාවතීර්ණව; නොසා, සන්තොෂයෙන්; වඩන, ප්‍රයාණයකර.

50. උගුසැව්ගුරු, විෂ්ණුහු; මඳරගිරේ, මන්දර පර්වතයෙන්; සයුර, සාගරය; අලළන, ආලොඩනය කරන (කලඹන) කල්හි; අගුපලඳන, * අඞ්ගාභරණයෙහි;දද,දරන්නාවූ; මිණිරැස්,මාණික්‍ය රශ්මිය;විසුළයුරේ විසර්ජිණිවූ පරිද්දෙන්; දිගු, දිශාවන්; එළිකරැ, ආලොකකොට; තරුතර, තාරකා රශ්මිය; නුබතුරේ, ආකාශාභ්‍යන්තරයෙහි;පෙනෙන, දෘශ්‍යමාන වනකල්හි; පානදුරේ, එනම්වූ ග්‍රාමප්‍රදෙශයෙහිවූ; දෙව්විමනත, දිව්‍ය විමාන (දෙවාල) යෙහි; කලරැව්, පාරාපතය; ලගු, ලඝනාවෙව.

51. පෙරදිගු, පූර්වදිශා නමැති; අඟන, අඞ්ගනාව; දිවයුරු, දිවාකර නමැති; රන්දපණතල, † සුවර්ණ දර්පණ තලය; රළතින්, තරඞ්ග නමැති හස්තයෙන්; නිල, නීලවර්ණවූ; දලනිඳු වසනතින්, සමුද්‍රනමැති වස්ත්‍රය අතරෙන්; ගත, ග්‍රහණය කළකල්හි; නෙතැ, නෙත්‍රයෙහි; නිදි, නිද්‍රාව; දැහැ, දුරුකොට; තුනුරුවන්බල, ත්‍රිවිධරත්නබලය; සිහිකරැ, මෙනෙහි කොට;ලැගි නිවෙසින්, ලගනාවූ නිවාසයෙන්; නැඟිසිට,උත්ථිතව; පිය සස ලකරැ, පක්ෂවාලනයකොට.

---

* අතමුල පලඳින ආභරණයක්. † රන් කැටපත.

52. තද තෙද පැවති යුගතග විලසින් නිබ ද
සඳ න ද කරන විලසින් මදරදපබ ද
බ ද අ ද රින් වැඩ සිදුවනලෙස ලොබ ද
යැද සු ද සුන් දෙවිඳුට යාගත් සබ ද

53. ක මි න් තලාගිනි හැලි පංගන් නැ වි ය
ල ව න් පැහැයකළ විලසින් ගුරුමැ වි ය
ව ස න් මුගුරු නොපහල දණිනුඩසි වි ය
මෙව න් ගොපලු අඟනන් දකුපොතුපි වි ය

නවද මගදෙපසැ තුරුපතර වෙසෙස අස,

54. සි ය ඹ ර ස බ ර කරමොරපඟර කළුහ ර
ස ම ද ර ඬෙ බ ර පරසොර තුවර අන්ද ර
සි දු ව ර කෙ ස ර කිණිහිරි බිජු පුරමඳ ර
මග තු ර නොහැ ර තුරතුරවල බලම්තු ර

---

52. යුගතගවිලසින්, යුගාන්ත වහනිය පරිද්දෙන්; නිබඳ, අනවරත යෙන්; පැවති, පවත්නාවූ; තදතෙද, සනබ්ධ තෙජස් ඇත්තාවූ; පබද, ප්‍රසිඬවූ; මදරද විලසින්, අනඞගරජයා විලාසයෙන්;සඳනාද කරන, චිත්ත සනෙතාෂකරන්නාවූ; සුදසුන් දෙවිඳුට, සුදශීන දෙවෙන්ද්‍රයාට; ලොබඳ, ලොකප්‍රතිබඞවූ; වැඩ, අභිවෘඞිය; සිදුවනලෙස, සිඬවනපරිද්දෙන්; බද අදරින්, බඩආදරයෙන්; යැද, යාච්ඤාකොට; සබඳ, මිත්‍රය; යාගත්, යාත්‍රා ග්‍රහණය කරව.

53. තලා ගිනිහැලි පංගන්නැවිය,තලා කොලය ගිනිහැලිය පංගන්නැ විය* (යන ද්‍රව්‍යයන්); කමින්, ඛාදනයකරමින්; ගුරුමැවිය විලසින්, ගුරු මැවි ආකාරයෙන්; පැහැයකළ, වර්ණයකළාවූ; ලවන්,අධරයන් ඇත්තාවූ; නොපහළ, පහත්නොව; දණිනුඩසිවිය, ජානුවෙන් උඩසිටියාවූ; වසන් මුගුරු, † වස්ත්‍රමුද්ගර ඇත්තාවූ; මෙවන්, මෙබඳුවූ පොතුපිවිය, පොතු පිටියෙනි; ගොපලු අඟනන්, ගොපාලාඞගනාවන්; දකු, දශීනයකරව.

නැවනත් මාගීය දෙපැත්තෙහි පැතිරීතිබෙන වෘක්ෂවිශෙෂයන් අසව.

54. සියඹර, තිත්තිඹිකවෘක්ෂය; සබර, සබරය; කර, කරගස්ය; මොර, පියාලවෘක්ෂය; පඟර, පඟුරුවෘක්ෂය; කළුහර, කළුවරය; සමදර, සමද රය; ඬෙබර, බිදජිය; (මසන්) පර, පරගස්ය; සොර, සොරගස්ය; තුවර, ප්‍රපුන්නාඩය; (රටතෝර) අන්දර, වීරතරුය; සිදුවර, නිගීගුණ්ඩිය;(තිකා)

---

* බුලත් සමග කන්නාවූ ද්‍රව්‍ය වශයි. † මුගුරමෙන් තිබෙනලෙස අදනාවස්ත්‍රය.

55\. න ළා අවුලු හැරරිටි සුඹුළු ඇඳැනි ති
දු ළා වෙමින් ලූසිරියෙල් තිලකඇ ති
වෙ ළා වරල සිකිපිල්සහ මල් කැන ති
ලො ළා යනෙන බලමලකිඳු එවනපෙ ති

56\. එ ව න සබරසෙන් දූකැම්රිකි මුවග න
ලෙ ව න පලුරෙසින් කනවැනිලවනව න
ග ම න පැරැද්දූහසගන පිවිසි විල්ව න
කෙ වි න හඬන වැනිසෙමෙලන් වරලව න

---

කෙසර, පුන්නාග (දොඹ) හෝ වකුල (මූනමල්)ය; කිණිහිර, කණිකාර ය; බිජ්ජූර, බිජපූර (ලප්නාරං) ය; මඳර, මන්දාර (එරබදු) ය; (යන) තුර, වෘක්ෂයන්; මගතුර, මාර්ගාන්තරයෙහිවූ; වලතුර, අරණ්‍යාභ්‍යන්තරයෙහි මිතුර, මිත්‍රය; නොහැර, අත්නොහැර; බල, නිරීක්ෂණයකරව.

55\. නළා, නාඩනයකොට; (නළාලා) අවුලුහැර, අවුල්පහකොට; රිටි සුඹුලු, * වල්කලයන්; තිති, නිත්‍යයෙන්; ඇඳැ, අච්ඡාදනයකොට; දූළා වෙමින්, ජවලිතවෙමින්; (බබලමින්) ලූ, ලනලද්දාවූ; සිරියෙල්තිලකඇ ති, හරිතාලතිලකානවිතවූ; සිකිපිල්සහ, මයූරපිඡයන්සමග; මල්කැනති, පුෂ්පස්තවකයන්; වරල, බම්මිල්ලයෙහි; වෙළා, වෙඨනයකොට; යනෙන, ගමනාගමනය කරන්නාවූ; ලොළා, ලොභවියයුතුවූ; මලකිඳු, මෙලච්ඡ දුහිතෘන්; (මැදිගැණුන්) එවනපෙහි, ඒවනපඞ්ක්තියෙහි; බල, නිරීක්ෂණයකරව.

56\. එවන, ඒ අරණ්‍යයෙහි; සබරසෙන්, ව්‍යාධ (මැදි) සෙනාව; දූකැ දෂ්නයකොට; මිරිකි, (බියෙන්) මිරිකුණාවූ; මුවගන, මෘගාඞ්ගනාවෝ; ලෙවනපලු,රක්තවර්ණ පලලවයන්; ලවනවන,(ඒ වැද්දන්ගේ)තොල්වැනි යයි; රෙසින්, කොපයෙන්; කනවැනි, අනුභව කරන්නාක්මෙනි; හස ගන, හංසාඞ්ගනාතොමෝ; ගමන, (මැදිගැණුන්ගේ) ගමනට; පැරැද්ද, පරාජිතව; වනවිල්, වනානඩාගයන්ට; පිවිසි, ප්‍රවිෂ්ටවූවාක්මෙනි; කෙවින, මයූරධෙනුහු තුමූ; සෙමෙලන්, ශ්‍යාමවර්ණවූ; වරලවන, (ඔවුන්ගේ) ධම්මිල්ලය වැනියයි; හඬනවැනි, රොදනය කරන්නාක්නුමෙනි.

---

* ගස්වල පිට පතුරුවලින් සාදාගෙන වස්ත්‍රවෙනුවට අඳිනවර්ගයක්.

57\. ස  රා වසන් කරතුටු මල් කැකුලුයෙ  නා
අ  රා කැලා තුරුවලඋන් රිසින්කා  නා
ගි  රා කැලන් දැකැ නැමුණෙව් කරල්ග  නා
පු  රා තදෙළ ඇල්කෙත්වලැ -කෙළියෙහෙ  නා

58\. අ  යා නෙත් බලනරුසිරු අන  ගී ය
නො යා දෙන බැහැරවූවත් සම  ගී ය
කි  යා සරන ඇල්ගෙවිලිය ලිය  ගී ය
නො යා සබඳ ඒ අසමින් නොල  ගී ය

59\. එ ත නි න් නයන විලිකුම් කෙම් වැලැසැදු  ණු
සොබ ම න් එඇල් ගෙවියෝනන්ගේ දිලු  ණු
පැහැ ස න් දසන් වරණට සෙසිනි පැරදු  ණු
වි ල සි න් දිසිය ගෙළෙවැල්ලාගෙන එලු  ණු

---

57\. සරාවසන්කර, ස්වරය අවසානකොට (නාදය නවතා); මල්කැකුලුයෙන, පුෂ්පකලිකාවෙන්; තුටු, තුෂ්ටවූ; අරා, ආරූඪව; කැලාතුරුවල, වනවෘක්ෂයන්හි; කන, (කරල්) අනුභවකරන්නාවූ; රිසින්, ඊප්සාවෙන්; උන්, නිසීදනයකළාවූ; ගිරාකැලන්, ශුකසමූහයන්; දැකැ, දර්ශනයකොට; නැමුණෙව්, අවනතවූවාක් වැනිවූ; කරල්ගන, සස්‍ය මඤ්ජරියෙන් සාන්ද්‍රවූ; ඇල්කෙත්වලැ, ශාලික්ෂේත්‍රයන්හි; තදෙළ, තාගෙදෙහලයෙ; පුරා, සම්පූර්ණකොට; යෙහෙන, සුවසේ; කෙළි, ක්‍රීඩාකරව.

58\. නෙත්, නෙත්‍රයෙන්; අයා, විවෘතකොට; බලන, නිරීක්ෂණය කරන්නාවූ; අනග්ය, අනර්ඝවූ; රුසිරු, රූපශ්‍රීඇත්තාවූ; සමගීයවූවත්, සමගිවූ අයට; බැහැර, බාහිරයට; නොයාදෙන, ප්‍රයාණය නොදෙන්නාවූ; * කියා කථනය කෙරෙමින්; සරන, හැසිරෙන්නාවූ; ඇල්ගෙවිලිය, ශාලිගොපකාඞ්ගනාවන්ගේ; ලියගිය, ලයාන්විත ගීතිකාවක් ඇතිද; ඒ, එය; අසමින්, ශ්‍රවණය කරමින්; නොලගීය, ලග්නනොව; සබඳ නො, සුසම්බන්ධවාවූ මිත්‍රය; යා, ගමනයකර.

59\. එතනින්, ඒ ස්ථානයෙන්; නයන, නා ගමනය කරනකල්හි; වැලැ, ලතාවෙහි; සැදුණු, සජ්ජිතවූ; විලිකුම්, පරිනතවූ; කෙම්, බිම්බ(ඵල) නෙමේ; සොබමින්, ශෝභමානවූ; එඇල් ගෙවියෝනන්ගේ, ඒ ශාලි ගොපිකාඞ්ගනාවන්ගේ; දිලුණු, දීප්තිමත්වූ; පැහැසන්, ප්‍රභාවෙන් ගැවසීගන්නාවූ; දසන්වරණට, දන්තාවරණයට (තොලට); පැරදුණුසෙසිනි, පරාජයවූහෙයින්; ගෙළෙ, ග්‍රීවයෙහි; වැල්ලාගෙන; ලතාප්‍රවේශකොටගෙන, එලුණුවිලසින්, එල්ලුණාවූ විලාසයෙන්; දිසිය, දෘශ්‍යමානයි.

---

* මෙතන්හි "කියා"යි පෙරකිරිය මිශ්‍ර ක්‍රියාපදයෙහි ලා සංලක්ෂිතයි.

60. රු කු හිමි සිටියදි ලිය ලිය ගෙනැවෙත ට
දු කු දී සාමුවනු යෙති පැනැ පැනැ ඉස ට
එ කු වම් වෙසෙස් ඇතිවන වනපෙතිනෙපි ට
ද කු ගොස් ඉසුරුබර මනනඳන කළුතො ට

61. ස ම න ළ ගිරි ගිජිඳු දියගනුව සමුදු ර
දි ගු ක ළ සලල දිගුසොඬ සිරි පෑ නිත ර
රැ ලි ර ළ පෙළින් බබලන කළුගඟිනෙත ර
ඔළමො ළ නොවී පවනින් කර පියාස ර

62. ම ද න දුවන් නිවෙසට වදිනදිනැවෙ ර
ද ල න වටොර රන් රඹකඳ අග සොඳු ර
ර ඳ න ලකල් වැටුපෙවි දඟිති මනහ ර
සි ටි න දෙතෙර ළඳ අඟනන් බල මිතු ර

---

60. රුකුනිම්, වෘක්ෂනාමැති වල්ලභයන්; ලියලිය, ලතානාමැති කාන්තාවන්; වෙන්ට, සමීපයට; ගෙනැ, ග්‍රහණයකොට; සිටියදී, ස්ථානයකරන කල්හි; සාමුවනු, සාඛාමෘගයෝ; දුකුදී, දුඃඛදානයකොට; ඉසට, ශීර්ෂයට; පැනැපැනැ, ලඞ්ඝනයකොට කොට; යෙති, ගමනය කෙරෙත්; එකු වම්වෙසෙස් ඇතිවන, (පූර්වෝක්තකරණය හා) එකාකාර උපමා විශේෂ ඇත්තාවූ; වන පෙතිනෙපිට, වනපඞ්ක්තියෙන් එපිටවූ; ඉසුරුබර ඓශ්වර්ය්‍ය සමූහඇති; මනනඳන, මනොනන්දනයවන්නාවූ; කළුතොට, කාලතීර්ථනම්වූ ග්‍රාමය; ගොස්, ගමනයකොට; දකු, දර්ශනය කරව.

61. සමනළගිරි, සුමන පර්වතය නමැති; ගිජිඳු, ගජේන්ද්‍රයා විසින්; සමුදුර, සමුද්‍රයෙහි; දිය, ජලය; ගනුව, ග්‍රහණයකරනු පිණිස; දිගුකළ, දික්කළාවූ; සලල, ලීලාසහිතවූ; දිගු, දීර්ඝවූ; සොඬසිරි, හස්තශ්‍රීය; නිතර, නිරන්තරයෙන්; පෑ, ප්‍රකාශකළාවූ; රැලි, රැලිසහිතවූ; රළපෙළින්, තරඞ්ගපඞ්ක්තියෙන්; බබලන, භ්‍රාජමානවන්නාවූ; කළුගඟින්, එනම් ගඞ්ගාවෙන්; එතර, පාරමතීරයට; පවනින්, මාරුතය කරණකොටගෙන; ඔළමොළනොවී, වණ්ඩාතිවණ්ඩනොව; පියාසරකර, පක්ෂ ප්‍රසාරණය කරව.

62. මදන, අනඞ්ගයා; වෙර, ශරීරයෙහි; දුවන්, ජඝන (උකුල)නමැති; නිවෙසට, නිවාසයට; (ගෙට) වදිනදිනැ, ප්‍රවෙශවන්නාවූ දවසෙහි; සොඳුර, සුන්දරවූ; වටොර, වෘත්තොරුනමැති; රන්රඹකඳ අග, ස්වර්ණකදලිස්කන්ධාග්‍රයෙහි; දලන, දල්වනලද්දාවූ; රඳන, බබලන්නාවූ; ලකල්, අලඞ්කෘතවූ; වැටුපෙවි, ප්‍රදීප්‍යවැනිවූ; දඟිනි, ජඞ්ඝාවෙන්; මනහර, මනොඥවූ; දෙතෙර, (කලුගඟේ) උභයතීරයෙහි; සිටින, ස්ථානය කරන්නාවූ; ළඳඅඟනන්, තරුණාඞ්ගනාවන්; මිතුර, මිත්‍රය; බල, අවලොකනය කර.

63. ස ඳ විය නොවන දිස්නාමෙන් කෙලෙස කු ළ
ම ඳ විය එතර ඉවුරස සැදි වෙහෙරු ඳු ළ
ම ද විය එහි සියනෑ දකැ යනෙන කෙ ළ
රැඳ විය නොලැබැ නික්මෙව සකිසඳ කොම ළ

64. එක සුරඟන පැහැසර රුසිරෙන් දු ල් ල
එක එක බසින් වඩවන සලෙලුන් ලො ල් ල
සක එක සකින් දිටුසරලන සිව්මැ ල් ල
දක නොලසව පරෙවිඳුසඳ කලමු ල් ල

65. ස ම ඳ අනඟ රඟදෙන වැලිතලා රැ ස
නො මඳ නෙරලු තුරු සෙවනතැ මඟ දෙප ස
න ස ඳ ලෙසට සැතපී මාවනට බැ ස
නෙතැඳ වඩන පස්සාගලැ සිරි විල ස

---

63. සඳ, චන්ද්‍රයා; වියනොවන, වියොග (වෙන්වීම) නොවන්නාවූ; කෙලෙස කුළමෙන්, කෛලාසකූටය පරිද්දෙන්; දිස්නා, දෘශ්‍යමානවන්නාවූ; එතර, පාර්මතීරයෙහි; ඉවුරස, ආලි (ගංඉවුර) සමීපයෙහි; සැදි, සජ්ජිතවූ; ඳුළ, දිලියෙන්නාවූ; වෙහෙරු, විහාරයෙහි; කෙළ, ක්‍රීඩාකොට; යනෙන, ගමනා ගමනය කරන්නාවූ; සියනෑ, ස්වකීයනෑයන්; දකැ, දර්ශනයකොට; මඳවිය, (කාමයෙන්) මත්ව; මදවිය, මූළාව; එහි, ඒ ස්ථානයෙහි; රැඳවිය, රජනය; නොලැබැ, අලබ්ධව; කොමල, කොමලවූ; සකිසඳ, මිත්‍රොත්තමය; නික්මෙව, නිෂ්ක්‍රමණයකරව.

64. දුල්ල, දිලියෙන්නාවූ; පැහැසර, ප්‍රභාසාරවූ; රුසිරෙන්, රූපශ්‍රීයෙන්; සුරඟන, දිව්‍යාඞ්ගනාවන් හා; එක, එකාකාරවූ; එක එකබසින්, එක එක වචනයෙන්; (වචනයක් පාසා) සලෙලුන්, සල්ලාලයන්ගේ; ලොල්ල, ලොභය; වඩවන, වර්ධනයකරවන්නාවූ; සක, චක්ෂුවගේ; (ඇහෙ) එකසකින්, එකාංශයකින්; දිටුසර, දෘෂ්ටිනමැති බාණය; (බැලීම නමැති ඊසැරය) ලන, ප්‍රක්ෂෙපකරන්නාවූ; සිව්මැල්ල, සුකුමාරයන්ගින් ඇත්තාවූ; කලමුල්ල, එනම්වූ ග්‍රාමය; දක, දර්ශනයකොට; පරෙවිඳුසඳ, පාරාපතෙන්ද්‍රය; නොලසව, අනාලස්‍යව.

65. සමද, සන්තොෂ (එලවන්නා)වූ; අනඟරඟදෙන, අනඞ්ගනෘත්‍ය දානයකරන්නාවූ; වැලිතලාරැස, වාලුකාතල සමූහ ඇත්තාවූ; මඟදෙපස, මාර්ග උභය පාර්ශ්වයෙහි; නොමඳ, අමන්දවූ; නෙරලුතුරු සෙවනතැ, නාරිකෙල වෘක්ෂච්ඡායාවෙහි; නසඳලෙසට, නාගයේ විතාකාරයට; සැතපී,

66. දු ල ය මල් සැරය ලැබගෙන මල් සැ වි ව
මු ල ය ඉඳැ පුලුපු නොපැවති රිවි හ වි ව
ලොලය වඩන අසමින් ලියගී රු වි ව
ප ල ය බලාගෙන මග්ගොන කල රු වි ව

67. ආ රා අ නය පැනැ අඹරා මුගුරු හෙ ල
බෝ රා ම තය නන්දෙඩුමෙන් කල විකා ල
පූ රා මැ තය අඟවන මොළ බඹුරුකැ ල
පා රා ප තය දකු පෙරමගැ බේරුව ල

68. ර න් නැ වි අයුරු තුඟු පින්පියයුරු උදු ළ
ම න් අ වි කරන අඟනන් රඟදෙන ඉපි ළ
උ න් සැ වි බලා සිටි සලෙලුන් නොපැඇ ළ
බෙ න් තොටි නෙතර සැතපෙව කාලි කෝවි ළ

---

සන්තාපීපීනව; මාවතට, මහාපථයට; බැස, අවතීර්ණවීව; පස්යාගලැ, පස්යාගලනම්වූ ග්‍රාමයෙහි; සිරිවිලස, ශෝභා විලාසය; නෙනැද, නොත්‍රාජනයකොට; වඩන, ප්‍රයාණය කරව.

66. මල්සැව්ව, පුෂ්පවාණ (අනඞ්ග) යාගේ; දුලය, දිලියෙන්නාවූ; මල්සැරය, කුසුම්සැරය; ලැබගෙන, ලබාගෙන; රිවිහව්ව, සූර්‍ය්‍යසන්තාපය; නොපැවති, අප්‍රවෘත්තිනවූ; පුලුපුමුලය, නාරිකෙල (වෘක්‍ෂ) මූලයෙහි; ඉඳැ, නිෂද්‍යකොට; (තියන්නාවූ) ලොලයවඩන, ලොභවර්ධනයකරන්නාවූ; ලිය, ස්ත්‍රීන්ගේ; ගිරුව්ව, ගීත්කාරවය; අසමින්, ශ්‍රවණය කෙරෙමින්; මග්ගොන, එනම්වූ ග්‍රාමය; බලාගෙන, නිරීක්‍ෂණයකොට; කලරුව්ව, පාරාපතය; පලය, පිටත්වෙව.

67. මුගුරුහෙල, මුද්ගර කූටනයන්; අනය, භක්‍ෂයට; ආරා, ආරූඪකොට; අඹරා, ආවර්ත්තනයකොට; පැනැ, (මාර්ගයට) අවතීර්ණවීව; බෝරාමතය, බහුලවූ සුරාමතයෙන්; කලවිකල, කලවිකලවී; නන්දෙඩුමෙන්, ප්‍රලාපබිණීමෙන්; පූරාමැතයඅඟවන, අවිද්‍යමාන සම්බන්ධභාවය අඟවන්නාවූ; මොළ, චණ්ඩවූ; බඹුරුකැල, පුක්කාස * සමූහයාඇති; පෙරමගැ, පටිපාටියෙහි; බේරුවල, බේරුවලනම්වූ ග්‍රාමය; පාරාපතය, කපොත (පක්‍ෂි)ය; දකු, දර්ශනයකර.

68. රන්නැවිඅයුර, රන්නැවිආකාරවූ; තුඟු, උස්වූ; පින්පියයුරු, පීනපයෝධරයෙන්; උදුළ, උජ්වලිතවූ; මන්අවිකරන, චිත්තාභිලාෂකරන්නාවූ; ඉපිළ, ඉල්පී; රඟදෙන, නෘත්‍යදානය කරන්නාවූ; අඟනන්, කාන්තාවන්; උන්සැවි, උන්නාවූ ආකාරය; බලා, නිරීක්‍ෂණයකොට;

---

* මල් නෙළීමෙන් ජීවිකා වෘත්තිඇති-එනම් සැඩොල් කුලයක්.

69\. එන සඳරද එ ගුවන — වන වා ස ය ට
අඳුරු රුපුන් වන්සඳ — වන වා ස ය ට
ගොසින් තොසින් බෙන්තොට — වන වා ස ය ට
වදූ මිතුරිඳු රුදිනැ — වන වා ස ය ට

70\. එ වි රිඳු හිමි විල්කත කිරණ රත්ප — ත
එ වි කියවන බිඟුරැවි වගිනි සියප — ත
සි වි දිගිනෙන එසදෙහි නල සුවඳ යු — ත
ය වි මමිතුර වැඳැ මුනිඳුන් බැතින් සි — ත

71\. නිල්ල දු ළ ය වනපෙතැ මුවගන කෙළි — න
වැල්ල තුළ ය මුතුරැස තුල මනනඳ — න
පු ල්ල දු ළ ය කුසුමැති තුරු සුමු සොබ — න
නිල්ල පොළය දකිමින් එපිට යාගෙ — න

---

ඇලනොපැ, අංශුප්‍රකාශනොකොට; (අන්අනකට නොහැරී) සලෙලුන්, සල්ලාලයන්; සිටි, ස්ථානයකරන්නාවූ; බෙන්තොටින්, බෙන්තොටනම්වූ ස්ථානයෙන්; එනර, පාර්මතීරයෙහිවූ; කාලිකෝවිළ, කාලිකෝවිලෙහි; සැනපෙව, සන්තර්පිතවෙව.

69\. එ, එහි; ගුවන, ආකාශනාමැති; වන, විරහිණීයකරා; වාසයට, වාසයකරනුපිණිස; සඳරද, චන්ද්‍රනමැති රාජයා; එන, ආගමනයකරන කල්හි; අඳුරු රුපුන්, අන්ධකාරනමැති සතුරන්; වනවාසයට, වනයෙහි විසීමපිණිස; වන්සඳ, පැමිණිකල්හි; බෙන්තොට, බෙන්තොටනම්වූ ග්‍රාමයෙහි; වනවාසයට, වනවාසනම්වූ විහාරස්ථානයට; තොසින්, සන්තොෂයෙන්; ගොසින්, ගමනයකොට; මිතුරිඳු, මිත්‍රොත්තමය; රුදිනැ, රාත්‍රිදිනයෙහි; වන, පැමිණියාවූ; වාසයට, විසීමපිණිස; වදු, ප්‍රවෙශවෙව.

70\. රිවිහිමි, සූර්‍ය්‍යනාමැති ස්වාමියාවිසින්; විල්කත, නාගනාමැති කාන්තාවට; එවි, එවනලද්දාවූ; කිරණරත්පත, රශ්මිනමැති ස්වර්ණපත්‍රය (රත්පත්ලියමන); සියපත, ශතපත්‍රනමැති; වගිනි, වකත්‍රයෙන්; කියවනඑවි, කියවන්නාක්මෙන්; බිඟුරැවි, භෘඞ්ගාරාවයඇති; සුවඳයුත, සුගන්ධයුක්තවූ; නල, මාරුතය; සිවිදිගිනෙන, සතරදිශාවෙන් එන්නාවූ; එසදෙහි, තත්කාලයෙහි; මමිතුර, මාගේමිත්‍රය; මුනිඳුන්, මුනීන්ද්‍රයන්; සිත බැතින්, චිත්තභක්තියෙන්; වැඳැ, නමස්කාරකොට; යවි, ප්‍රයාණයකරව.

71\. නිල්ල, නීලවර්ණයෙන්; දුළය, දිලියෙන්නාවූ; වනපෙතැ, අරණ්‍යපඞ්ක්තියෙහි; මුවගන, මෘගසමූහයා; කෙළින, ක්‍රීඩාකරනලද්දාවූ; මුතුරැසතුල, මුක්තාරාශි සමානවූ; මනනඳන, මනොනන්දනය වන්නාවූ; වැල්

72. ග ස් බ ඩ සේ උ ස් ගු ඩ මෙව් ළග ලිය ළු
තොස් ව ඩ ව් න ඇ ස් අ ඩ දිටිනි කල්මු ළු
දෙ ස් සැ ඩ ම ඳ බස් තු ඩ තුඩ අම එක ළු
ගොස් වැඩකරු කොස්ගොඩ සැතපෙව යහ ළු

73. අ යු රු තිසර තනබැඳ රන් ප ටින් පටින්
මි යු රු තෙපුල් තෙපලන ලිය ක ටින් කටින්
සොඳුරු සලෙලුමුළු දැක එන ව ටින් පිටින්
මි තු රු වඩින් මනහර වැලිතො ටින් තුටින්

74. මැ ලව රිවි රැසින් සිව්මැලි තොපවෙ ර ය
තු ලව මුතුපලක් මැද නිල් මිණි හ ර ය
ග ලව සිලිල් සරතැස පැහැර බැහැ ර ය
ලො ලව නොරඳ මහදම්පා මුව්දෙ ර ය

---

ලතුලස, වාලුකාබහුලාකාරයෙහි; පුල්ල, සොත්ඵුල්ල (භාව)යෙන්; දුලස, බබලන්නාවූ; කුසුමැති, පුෂ්පාන්විතවූ; තුරුසුමු, වෘක්ෂසමූහයෙන්; සොබන, ශොභනවූ; තිල්ලපොළය, තිල්ලපොළනම්වූ ස්ථානය; දකිමින්, දර්ශනයකෙරෙමින්; එපිට, දූරයට; යාගෙන, යාත්‍රාග්‍රහණයකොට.

72. උස්ගුඩම්, උච්චස්ථානයන්; ළඟ, සමීපයෙහි; ගස්බඩ, වෘක්ෂාසන්නවූ; සේ, ඡායාවෙහි; ලියළුව්, ලතාමෙන්; අළු, එලවුවාවූද; ඇස්අඩදිටිනි, අක්ෂිඅර්ධදෘෂ්ටියෙන්ද; සැඬදෙස්මඳ, චණ්ඩදෝෂයෙන් මන්දවූ; තුඩතුඩ, මුඛයක්පාසා; අමළුකළු, අමෘතයහා එකාකාරවූ; බස්, වචනයෙන්ද; (යුක්තවූ) කල්මුළු, කාන්තාසමූහයාඇත්තාවූ; කොස්ගොඩ, එනම්වූ ග්‍රාමයට; ගොස්, ගමනයකොට; වැඩකරු, වෘද්ධිකාරකවූ; යහළු, මිත්‍රය; සැතපෙව, සන්තර්පිතවෙව.

73. තිසර අයුරු, හංසාකාරවූ; තන, පයොධරයන්; රන්පටින්, ස්වර්ණපට්ටයෙන්ද; පටින්, පට්ට (වස්ත්‍ර) යෙන්ද; බැඳ, බන්ධනයකොට; මියුරුතෙපුල්, මධුරවචනයන්; කටින් කටින්තෙපලන, කටින් කට ප්‍රකාශකරන්නාවූ; ලිය, කාන්තාවන්; දැක, දර්ශනයකොට; සොඳුරු, සුන්දරවූ; සලෙලුමුළු, සල්ලාලසමූහයා; වටින්පිටින් එන, වටින්පිටින් එන්නාවූ; මනහර, මනොඥවූ; වැලිතොටින්, වැලිතොටනම්වූ ග්‍රාමයෙන්; මිතුරු, මිත්‍රය; තුටින්, තුෂ්ට(භාව)යෙන් යුක්තව; වඩින්, ප්‍රයාණයකරන්.

74. රිවිරැසින්, සූර්යරශ්මියෙන්; මැලව, මලානිවූ; සිව්මැලි, සුකුමාරවූ; වෙරය, ශරීරයඇත්තාවූ; තොප, යුෂ්මත්හු; නිල්මිණිහරයමැද, නීලමාණික්‍යදාම මධ්‍යයෙන; මුතුපලක්තුලව, මුක්තාඵලයක්(මුතුඇටයක්)

75. කමලැස සමාගම වනසදෙහි සිරිස ද
මුහු ලස ඉනී ගිලි කුසුමෙව් ඔහු ලැම ද
ගහ රුස පෙනෙත ගුවනතසේරුස නොම ද
අද හස විලස සැදි තොටගමු වෙහෙර ර ද

76. දිවයුරු පෙණ පෙනෙන සිදුඋරඟ ගෙලෙබ ද
දිවයුරු රන මිණෙක සිරිසර පානස ද
දිවයුරු සිය නාත දෙව්හිමිඳුන්නැම ද
දිවයුරු මගට වැඳූ යාගන් මිතුරුස ද

77. පෙත්මගැ දකුණුදිගැ—රන්තැඹිලිරන් නරඹා
දුනුකේකුසුම් රොණතුළ-එතරවැ යා මොලපුවෙන්

---

සමානව; සිලිල්, සලිලයෙහි; ගලව, නිමගනව; සරනැස, ශ්‍රාන්තාඞ්ගය; බැහැරය, බාහිරයට; පැහැරය, පහකොටඇර; ලොලව, ලොභව; මහදම් පාමුවදෙරය, මාදම්පානම්වූ ද්‍රොණිමුඛයෙහි; (මෝදර) නොරඳ, රජමානනොව.

75. සිරිසඳ, ශ්‍රීකාන්තාවනා; කමලැස, විෂ්ණු; සමාගම වනසදෙහි, සමහිවන්නාවූ කාලයෙහි; මුහුලස, ධම්මිල්ලය; ඉනී, මොවනව; ඔහුලැමද, ඒ විෂ්ණුහුගේ වක්ෂසෙහි; ගිලී, ගලිනවූ; කුසුමෙව්, පුෂ්පයන්පරිද්දෙන්; නොමඳ, අමන්දවූ; සේරුස, ශ්වෙතරශ්මියඇත්තාවූ; ගහරුස, තාරකාසමූහයා; ගුවනත, ආකාශයෙහි; පෙනෙත, දෘශ්‍යමානවනකල්හි; සැදි, අලඞ්කෘතවූ; තොටගමුවෙහෙර, තොටගමුවිහාරයෙන්;අදහසවිලස, අධ්‍යාස විලාසයෙන්; රඳ, රජමානවෙව.

76 පෙණ, (සමුද්‍ර) ඵේණය; දිවයුරු, ජිනවාකාරයෙන්; පෙනෙන, දෘශ්‍යමානවන්නාවූ; සිඳු, සමුද්‍රනමැති; උරඟ, නාගයාගේ; ගෙලෙ, ග්‍රීවයෙහි; බඳ, බන්ධනය කරනලද්දාවූ; රනමිණෙක, රත්නමාණික්‍යයෙක; සිරිසර, ශ්‍රීසාරය; දිවයුරු, සූර්‍ය්‍යයා; පානසඳ, ප්‍රකාශකරනකල්හි; දිවයුරුසිය, සූර්‍ය්‍යබන්ධුවූ; නාතදෙව්හිමිඳුන්, නාථදෙවස්වාමීන්ද්‍රයන්; නැමද, නමස්කාරකොට; දිවයුරු මගට, ආකාශයට; වැඳූ, ප්‍රම්ශටව; මිතුරුසඳ, මිත්‍රාත්මය; යාගන්, යාත්‍රා ග්‍රහණය කරනු.

77 පෙත්මගැ, පටිපථ (ඉදිරිමාර්ග) යෙහි; රන්නැඹිලිරන්; සවර්ණසන්තිරාරණයන්; නරඹා, නිරීක්ෂණයකොට; දුනුකේකුසුම්රොන්, රාජකෙතකී පුෂ්පරේණූන්; අතුළ, ආස්තරණයවූ; මොලපුවෙන්, මොලපුව නම්ඛයෙන්; එතරවැ, පාරවත්ර (ප්‍රාප්ත) ව; යා, යාත්‍රාකර.

78. ලියන් කියන ගී විඳැ මල් කඩින් කඩින්
සසින් සැදුණු වෙල්යා දකැ මඩින් ගොඩින්
කමින් ගොදුරු බැසැ මුංවතු බඩින් උඩින්
සෙමින් සිටම සකි මාවේ කඩින් වඩින්

79. ලප් අඩු වෙන් මිස සඳසදිසිවුවනි න
තෙප් කඩු වෙන් මෙන් නෙතගින් පහරදෙන
ඔප් වැඩූ වෙන් ලියසරි ලිය දකැසොබන
සිප් කඩු වෙන් යා සැතපී යාදසන

80. සේ පෙළිනා සුසැදුණු පොල් වතුකැටිය
සේ පුළිනා තලැඑනසන ගැටිගැටිය
නෝර ළිනා යන නැව් සමුදුරවැටිය
මී කෙළිනා කලැවදු උඩුගල්පිටිය

78. මල්කඩින් කඩින්, පුෂ්පයන් කඩකඩා; ලියන්, ස්ත්‍රීන්විසින්; කියන කථනයකරන්නාවූ; ගී, ගීතිකාවන්; විඳැ, වින්දනයකොට; මඩින්ගොඩින් මඩින්ද ගොඩින්ද; සසින්, සස්‍යයෙන්; සැඳුණු, සජ්ජිතවූ; වෙල්, ක්ෂෙත්‍රයන් සම්බන්ධිවූ; යා, යාය; දකැ, දර්ශනයකොට; උඩින්, උන්නත (ස්ථාන) යෙන්; බැසැ, අවතීර්ණව; මුංවතුබඩින්, මුද්ගවස්තු ආසන්නයෙන්; ගොදුරුකමින්, ගොචරානුභවය කෙරෙමින්; සකි, යහළුව; සෙමින්සිටම, අත්වරිතව සිටම; මාවේකඩින්, මාවේකඩනම්වූ ප්‍රදෙශයෙන්; වඩින්, ගමනය කරන්න.

79. ලප්, (ශශ) ලපය; අඩුවෙන්මිස, ඌනත්වයෙන්මිසක්; (අන්‍යාකාරයෙන්) මුවනිසා, වක්ත්‍රයෙන්; සඳසදිසි, චන්ද්‍රයාසමානවූ; තෙප්, * තෙබෙන්හා; කඩුවෙන් මෙන්, ඛඞ්ගයෙන්ද (පහරදෙන) මෙන්; නෙතගින් නෙත්කොනින්; පහරදෙන, ප්‍රහාරදානය කරන්නාවූ; ඔප්, ඔපය; වැඩූ, වර්ධිතවූ; වෙන්ලියසරි, ශ්‍රීකාන්තාව සමානවූ; සොබන, ශොභමානවූ; ලිය, ස්ත්‍රීන්; දකැ, දර්ශනයකොට; සිප්කඩුවෙන්, සිප්කඩුවනම්වූ ග්‍රාම ප්‍රදෙශයෙන්; යාදසන, ප්‍රිය දර්ශනය; සැතපී, සන්තර්පිතව; යා, ගමනය කර.

80. පොල්වතුකැටිය, නාරිකෙල වස්තුසමූහයාගේ; යේපෙළිනා, ජායාපඞ්ක්තියෙන්; සුසැදුණු, අලඞ්කෘතවූ; සේපුළිනානලැ, ශ්වේතවාලුකා තලයෙහි; සන, සත්වයා; ගැටිගැටිය, ඝට්ටන ඝට්ටනව; එන, ආගමනය

* තෙබනම්වූ ආයුධ විශෙෂයකි (අග්‍ර උල් වස්තුයක්)

81. අවර සයුර සරතුරුරුදි සරෙව්ර ත
පවර දිනිඳු වට තම් බිඟුරුසෙව්ව ත
පවර අත්ලියන් සසඟින් වනනිය ත
එවර ලඟින් රත්ගම්මුනිඳු මැඳුර ත

82. තුඟුතර තරඟ අත්පුත් බමර බැම නි තින්
ඉ දු වර තුවනයා හසකරු තඹරව තින්
සියකර හිමිහු දුකැ රඟනෙව් විලඹුම තින්
මම් තු ර එසඳ වඩිණේමැනව් ගුවන තින්

83. පො ල බා සපිරි සිරි ලක්තුනු ව ගේ යා
නෙළු බා සුසැදි පුලුපුල්මල් ව ගේ යා
ස සො බා ගොතා හෙලු කෙස්වැටි ර ගේ යා
නා ර ඹා පියාසර කර ගිංග ගේ යා

---

කරන්නාවූ; නැව්, නෞකාවන්; සමුද්‍රවැව්ය, සාගරප්‍රාප්තව; නේරලින්, අනෙකතරඞ්ගයන් කරණකොටගෙන; යන, ප්‍රයාණය කරන්නාවූ; උඩු ගල්පිවිය, උඩුගල්පිවියට; මීකෙළිනාකලැ * මීකෙළින්නාවූ කාලයෙහි; වදු, ප්‍රවෙශවව්.

81. අවරසයුර, අපර (දිශා) සාගරනමැති; සරතුරු, තඩාගාඛ්‍යන්තරයෙහි; රුදි, රජිතවූ; රනසරෙව්,රක්තපද්මයක් වැනිවූ; පවර, උතුම්වූ; දිනිඳුවට, සූර්‍ය්‍යබිම්භ හාත්පස්හි; තම, අන්ධකාරය; බිඟුරුසෙව්වන, භෘඞ්ග සමූහයාමෙන්වූ කල්හි;පවර, වලලභයන්; අත්ලියන් සසඟින්,අන්‍ය ස්ත්‍රීන් හා සංසර්‍ගය කරණකොටගෙන; නියනවන, නිශ්චයවන්නාවූ; එවර, තත්කාලයෙහි; රත්ගම්, රත්ගමනම්වූ ප්‍රදෙශයෙහි; මුනිඳුමැඳුරන, බුද්ධමන්දිර (විහාර) යෙහි; ලඟින්, ලඟනවෙව.

82. නිතින්, අනවරතයෙන්; තුඟුනර, අතිශයෙන් උස්වූ; තරඟඅත්, තරඞ්ගනමැති හස්තයෙන්ද; බමර බැම, භෘඞ්ගනමැති භ්‍රූවෙන්ද, පුත්, පුසානාවූ; විලඹු, තඩාග නමැති අම්බිකාතොමෝ; සියකර හිමිහු, සූර්‍ය්‍ය නමැති ස්වාමියා; දුකැ, දර්ශනයකොට; මතින්, මනාන (භාව) යෙන්; ඉඳු වරනුවන, ඉන්දීවරනමැති නෙත්‍රයන්; අයා, විවෘතකොට; තඹරවතින්, තාම්රරස නමැති වක්ත්‍රයෙන්; හසකරු, හාස්‍යකොට; රඟනෙව්, නෘත්‍ය කරන්නියක් වැනිවූ; එසඳ, එකල්හි; මම්තුර, මාගේ මිත්‍රය; ගුවනතින්, ආකාශයෙන්; වඩිණේමැනව්, වැඩිය මැනව.

83 පොලබා, ප්‍රලොභකරන්නාවූ; සිරි, ඓශ්වර්‍ය්‍යයෙන්; සපිරි, සම්පූර්‍ණවූ; ලක්තුනුවගේයා, ලඞ්කානමැති තණ්ඩන්‍ය විසින්; නෙළුබා, ශනපත්‍රය; සුසැදි, සුසජ්ජිතවූ; පුල්, සොභාපුල්ලවූ; උපුල්මල්වගේයා, උත්

* මීකෙළිනාකල යනුවෙන් සන්ධ්‍යාකාලය ප්‍රකාශිතයි.

84. ස  රා සොඳින් මහසයුරන මුළු ල් ලේ
පෙ රා රුගෙනැ රන්මිණි මුතු සිය ල් ලේ
ස  රා තුබූ මෙන් සල්පිල් ·උඳු ල් ලේ
පු  රා මෙසිරි දැකැ යාගන් ගා ල් ලේ

85. ස ල ග මි යු රු ස හ යු රු සමතු ව න් නේ
ම ල ග බ ම රු පි පි තු රු හිසැ සදෙ න් නේ
ම ල ග ල තු රු ස හ තු රු ඉන් කර න් නේ
බ ල ග මි තු රු වි සි තු, රු මිරි පැ න් නේ

86. නලවැ ද සසල සිහිලඹ රළ ග ලා යා
මන න ද කරන පළ හෙළ වැලි ත ලා යා
මු ව ර ද වගල ඉවුරසැ තුරු නි ලා යා
ස කි ස ඳ වඩින් 'ලනුමෝදර බ ලා යා

---

පලය (යන) පුෂ්පවර්ෂයන්; සසොබා, ශොභාසහිතව; ගොනා, ග්‍රහණය කොට; හෙලූ, පතනය කරනලද්දාවූ; කෙස්වැටිරඟේයා, කේශකලාපාකාරවූ; ගිංගඟේයා, එනම් ගංගාව; නරඹා, නිරීක්ෂණයකොට; පියාසර කර, පක්ෂප්‍රසාරණය කරව.

84. මුළුල්ලේ මහසයුරන, සකල මහාසමුද්‍රාභ්‍යන්තරයෙහි; සොඳින්, සුන්දරව; සරා, සවාරණයකොට; රන්මිණිමුතු සියල්ලේ, සුවර්ණමණි මුක්තාවන් සියල්ල; පෙරාරුගෙනැ, පෙරීමකොට හැරගෙන; සරාතුබූ මෙන්, අලඞ්කාරකොට තුබූවාක් වැනිවූ; සල්පිල්, ආපනයෙන්; උඳුල්ලේ, උජ්ජ්වලිතවන්නාවූ; ගාල්ලේ,ගාල්ල නම්වූ ප්‍රදේශයෙහි; මෙසිරි, මේ ඓශ්වර්ය්‍යයන්; පුරා, සම්පූර්ණත්වය; දැකැ, දර්ශනයකොට; යාගන්, යාත්‍රා ග්‍රහණය කරන්න.

85. සලග, ශෛලාග්‍රයෙහි; මියුරු, මයූරයන් විසින්ද; සහයුරු, සහකාර (අඹ) වෘක්ෂයන්හි; නේ, අනේකවූ; සමතුවන්, කොකිලයන් විසින්ද; තුරුහිසැ, (අන්‍ය) වෘක්ෂජාති මස්තකයෙහි; පිපි, පුෂ්පිතවූ; මලග, පුෂ්පාග්‍රයෙහි; බමරු, භෘඞ්ගයන් විසින්ද (කරනලද්දාවූ); සද, ශබ්දය, එන්නේ, ආගමනය කරන්නේය; ඉන්, ඒකාරණයෙන්; මලග, අනඞ්ගයාවිසින්; කරන්නේ, කරන්නාවූ; ලතුරු, මහත්වූ; තුරුසහ, තූර්‍ය්‍යය සමානවූ; විසිතුරු, විචිත්‍ර (භාව)ය ඇති; මිරිපැන්නේ, මිරිපැන්න නම්වූ ග්‍රාමය; මිතුරු, මිත්‍රය; බලග, නිරීක්ෂණය කරව.

86. නලවැද, මාරුත ප්‍රවිෂ්ටව; සසල, චංචලවන්නාවූ; ගලායා, ගලායන්නාවූ; සිහිලඹ රළ, ශීතලජලතරඞ්ගයන් ඇත්තාවූ; මනනඳකරන, මනෝනන්දනය කරන්නාවූ; පළ, ව්‍යාපත (පතළා)වූ; හෙළවැලිතලායා,

87. ප ල් ල ව බැබලි නාතුරු ගිනිසිලු සදි සි
නි ල් ල ව ගිලි පෙනි වැලි අඟුරු අලු රැ සි
ලොල් ල ව බලා මෙව්ලස බිය නොවැ සතො සී
පොල් ල ව මදක් සැතපී යන් නොවි ලැ සී

88. පැ ක ර වනා නෙත් මද පස්වැනි සැ ර ය
සේ ක ර වූවන් පැහැසරවත් මනහ ර ය
ආ ක ර සුරු පිහිටි ලියමිණි ඇම ව ර ය
පෝ ක ර පිටිය බලමින් යව මග තු ර ය

89. කරකැ වි යා නොමදෙන සත පටු දෙ ළෙ න
කුසුම වි යා සැවි දියමෙන් බැම ලෙ ළෙ න
හිසුල වි යා කල්බඳ කල්බඳ කෙ ළෙ න
මහ නැ වි යා පොකුණට වදු කෙළි දෙ ළෙ න

---

ශෙවන වාලුකාතලයෙහි; මුවරඳ, මකරන්දයන්; වගල, ගිලිහුණාවූ; ඉවුරසැ, ආලි සමීපයෙහි; නිලායා, නිලවණීවූ; තුරු, වෘක්ෂයන්ඇත්තාවූ; ලහුමෝදර, එනම්වූ ස්ථානය; බලායා, නිරීක්ෂණය කොට; සකිසඳ, මිත්‍රොපාකමය; වඹින්, ප්‍රයාණය කරන්.

87. නාතුරු, නාගවෘක්ෂයන්ගේ; බැබලි, බබලන්නාවූ; පල්ලව, දළු; ගිනිසිළුසදිසි, වහ්නි ශිඛා සමානය; නිල්ල, නිලවණීව; ගිලි, ගලිනාවූ; පෙනි, පත්‍ර හා; වැලි, වාලුකාතලය; අඟුරු අලුරැසි, අඞ්ගාර හා භස්මසමූහය සමානය; ලොල්ලව, ලොභව; මෙව්ලස, මේ විලාසය; බල, නිරීක්ෂණය කොට; බියනොවැ, භයනොවී; සතොසී, සන්තොෂයෙන්; පොල්ලව, පොල්ලව නම්වූ ස්ථානයෙහි; මදක් සැතපී, ස්වල්පයක් සන්තර්පිනව; ලැසි නොවී, ආලස්‍ය නොව; යන්, ගමනය කරනු.

88. මද, අනඞ්ගයාගේ; පස්වැනිසැරය, පඤ්චමශරය; (උපුල්සැරය)පැකරවනා, ප්‍රකාශ කරවන්නාවූ; නෙත්, නෙත්‍රයෙන්ද; සේකර, චන්ද්‍රයාවැනිවූ; පැහැසරවත්, ප්‍රභාසාරයඇත්තාවූ; මනහරය, සිත්ගන්නාවූ; වුවත්, වක්ත්‍රයෙන්ද යුක්තාවූ; ලියමිණි, ස්ත්‍රීරත්නයන්ට; ඇමවරය, සකල කාලයෙහි; ආකරසුරු, උත්පත්තිස්ථානයමෙන්; පිහිටි, ප්‍රතිෂ්ඨිතවූ; පෝකරපිටිය, එනම්වූ ස්ථානය; බලමින්, නිරීක්ෂණය කෙරෙමින්; මගතුරය, මාර්ගාන්තරයෙහි; යව, ප්‍රයාණය කර.

89. සත, (දුටුවාවූ)සත්වයන්; කරකැවී, ආවෘත්තනව; යානොමදෙන, ප්‍රයාණය නොදෙන්නාවූ; පටු, පටුවූ; දෙළෙන, ලලාටයෙන්ද; කුසුම්වියා, අනඞ්ගයාගේ; සැවි, චාපයෙහි; දියමෙන්, ජ්‍යා (ගුණය) වැනිවූ; ලෙළෙන, ලීලොපෙත වන්නාවූ; බැම, භ්‍රැවෙන්ද යුක්තාවූ; හිසුලවියා කල්

තවද විකසිත කුමුදු කුවලයකමලකල්හාරාදි කුසුම්සමූහයෙන් හා හංසකාදම්බකාරණ්ඩවාදි විවිධ පක්ෂිජාතීන්ගෙන් මනොහරවූ ඒ පුෂ්කරිණියෙහි.

90. පු ලා තුරු කුසුම් කඩමින් කෙළැ ඇම් ද
ම ලා නිකට ඔාබිඳු පෙනුණුසඳ බ ඳ
නි ලා කෙස්වැටිය බැඳැ රත් වසන් ඇ ඳ
බ ලා සිටුව දිය කෙළිනා ලඳුන් සො ඳ

91. ම න් තොස කර නරඹා කොමලඟක ව ත
දු න් රසවත් රසපහරින් පිය උර ත
ව න් සිහනිය ඇත් කුඹුතලැ උරිරු යු ත
මෙ න් මුතු දිසි දියබිඳු සහ කොකුම් මු ත

බඳ, ත්‍රිශූලායුධයාගේ කාන්තාව හෙවත් උමාඞ්ගනාව බඳුවූ; කල්බඳ, සඳිහු විසින්; කෙළෙන, ක්‍රීඩා කරන්නාවූ; මහනැවියාපොකුණට, එනම්වූ පුෂ්කරිණියට; කෙළිදෙළෙන, ක්‍රීඩා ධුරයෙන් යුක්තවූයේ; වද්‍ද, ප්‍රවේශවව්.

යලිත් පිපුණාවූ කෞමුද මානෙල් නෙළුම් හෙල්මැලි යනා පම් ආදි මල් සමූහයෙන්ද හංසය විල්කුකුළුය * කාරණ්ඩවය යනාදිවූ නානාවිධ පක්ෂි ජාතීන්ගෙන්ද මන පිනවන්නාවූ ඒ පොකුණෙහි.

90. තුරු, වෘක්ෂයන්හි; පුලා කුසුම්, ඵුල්ල පුෂ්පයන්; කඩමින්, කඩා ගනිමින්; කෙළැ, ක්‍රීඩා කොට; ඇම්ද, ආභරණ්ඩණය කොට; මලානිකට, ම්ලානිවී; බඳ, දෙහයෙහි; ඔාබිඳු පෙනුණුසඳ, සේවද බින්දු දෘශ්‍යමානවූ කල්හි; නිලාකෙස්වැටිය, නීලකෙශකලාපය; බැඳැ, බන්ධනය කොට; රත්වසන්, රක්තවස්ත්‍රයන්; ඇඳැ, අච්ඡාදනය කොට; දියකෙළිනා, ජල ක්‍රීඩා කරන්නාවූ; සොඳලඳුන්, සුන්දරකාන්තාවන්; බලා, නිරීක්ෂණය කොට; සිටුව, සථානය කරව.

91. කොමලඟක, කොමලඩිග්යකගේ; වත, වක්ත්‍රය; නරඹා, නිරීක්ෂණයකොට; මන්තොසකර, චිත්තසන්තොෂකොට; පිය, වල්ලභයාවිසින්; උරත, වක්ෂස්ථලයට; දුන්, දානයකරනලද; රසවත්, රසඇත්තාවූ; රසපහරින්, ජලප්‍රහාරය කරණකොටගෙන; සිහනියවන්, සිංහනාබ ප්‍රවේශවූ; (සිංහයාගේ නියපොතු වැදුනාවූ) ඇත්කුඹුතල, හස්තිකුම්භස්ථල යෙහි; උරිරුයුත, රුධිරයෙන් යුක්තවූ; මුතුමෙන්, මුක්තාපරිද්දෙන්; මුතකොකුම් සහ, මූත්‍රකුංකුමය සමග; දියබිඳු, ජලබින්දු; දිසි, දෘශ්‍යමානයි.

* හංසභේදයෙකි.

92\. සි රි ම ත් මනහනක දුන් දියපහරක ට
ග ම නො ත් බඹරු ගුම් කරු නොසතුටිනෙවි ට
පැ මි නෙ ත් ඔවුන් හිමි සවනත් නිලුපුල ට
වැ ද ග ත් ගැහැට ගියවැනි පමුනන ලෙස ට

93\. දි ය රළ වැදීමෙන් තම පියතම ක ර ණ
නි ය රද කොකුම් කලලින් මුසුවත පො ර ණ
සි ය පත් විලස් නොහැඳිනැ දුකැ රතකි ර ණ
ලි ය අන් සමග සැක දිගැසක් වූ උ ර ණ

---

92\. **සිරිමත්,** ශ්‍රීවත්නාවූ; මනහනක, මහනාඩගනාවන් විසින්; **දුන්,** **දෙන** (ගසන) ලද; දියපහරකට, ජලප්‍රහාරයකට; නොසතුටින්,අසන්තු **ෂ්ටයෙන්;** එවිට, එකල්හි; ගුම්කරු, ඝොෂාකොට; ගමනොත්, ගමන්ගත් නාවූ; බමරු, භෘඩගයෝ; ඔවුන්, ඒමහනාඩගනාවගේ;හිමි, වල්ලභයාගේ; **සවනත්,** ශ්‍රවණාන්තය වැනිවූ; නිලුපුලට, නිලොත්පලයට; පැමිණෙත්, ප්‍රාප්තවෙති; (එසේපැමිණීම)වැදගත්, වැදගත්නාවූ; (පැමුනුණු)ගැහැට, ඝෂ්ටණය; (අමාරුව) පමුනනලෙසට, පමුනන (කියන) පරිද්දෙන්; **ගිය වැනි,** ගමනය කළාක්මෙනි.

93\. තම, තමාගේ; පියතම, වල්ලභයාගේ; කරණ, හස්තයන්ට; දිය රළ වැදීමෙන්, ජලතරඩගයන් වැදීම කරණකොටගෙන; නියරද, නව රජිය; පොරණ කොකුම් කලලින්, පූරාණ කුංකුම කදීමයෙන්; මුසුවත, මිශ්‍රවූකල්හි; සියපත්, ශතපත්‍රයන්ගේ; විලස්, විලාසය; නොහැඳිනැ, ස්ථානනයනොකොටද; රතකිරණ, රත්තරශ්මිය; දුකැ, දශ්නයකොට; **අන්ලිය** සමග, අන්‍යස්ත්‍රියක් සමග; සැක, ශඩකාවූද; දිගැසක්, ස්ත්‍රියක් නොමෝ; උරණවූ, කොපවූවාය.

(තමාගේ ස්වාමිපුරුෂයාගේ අතට වතුරරැළ වැදීම කරණකොටගෙන නාන්නාවූ සෙසු ස්ත්‍රීන්ගේ පයොධරවල ඉහන ගල්වාතුබූණු කොකුම් මඩව දියවී වතුරරැළට මිශ්‍රවහිකීමෙන් පළමුනී පුරුෂයාගේ අතේ නිය පොතුපෙළ කොකුම්මඩෙත් මිශ්‍රවීය, එකල්හි ඔහුගේ ස්ත්‍රී නෙළුම්මල්ද අතේද වෙනස නොහැඳිනත් කොකුම්වල රතු පැහැය දකලා එනන්හි නාමින් සිටි වෙනින් ස්ත්‍රියකගේ පයොධරයෙහි තුබූ කොකුම්මඩ මොහු ගේ අතේ තැවරුණාය යන සැකසිතෙනුත් ඒ ස්ත්‍රියසමග කෝපවූවාය යනු භාවයි.)

94. ප හ ර ත කෙළිරිසින් පියතම ලියන් ව ත
සි ලි ල ත ගිලුණු තෙනිනෙත දියබිඳු දිමු ත
ද න ප ත වසර කිසිකලැ කපටලෙස ඇ ත
ලොවැසත රැකෙනු සැබ විය සමහරු විප ත

95. දියකෙළිනා ලෙස දකිමින් කලුන් න ඳ
පොකුණු අඹද සමගව උන් කෙළින ස ඳ
කලදේ සිලිලයයි ඇරගත් සිතින් එ ඳ
සිතේ දුටුව පැලඹෙන හස පියුම් මැ ඳ

96. හසරද සරන පසහිර දී සිලිල්පි ට
මේ මේ නොපටයයි දෙන වැනි සියතුන ට
දියකා කෙවෙනි එහි යුගපිය විඳ සි ට
දුනමැනවයි යන වැනි මෙපමණක් ම ට

94. කෙළිරිසින්, ක්‍රීඩේච්ඡාවෙන්; ලියන්, කාන්තාවන්; පියතම, වල්ලභයාගේ; වත, වක්ත්‍රයට; පහරත, (ජල) ප්‍රහාරයකළකල්හි; සිලිලත, සලිලාන්තයෙහි; ගිලුණුහෙනින්, නිමග්නස්ථානයෙන්; දිමුත, දීප්තිමත් වූ; දියබිඳු, ජලබින්දු; එත, එනකල්හි; කිසිකලැ, කශ්චිත්කාලයක; කපට ලෙස, ව්‍යාජාකාරවූ; දත, සංඛ්‍යනම; පත, පැමිණෙනලද; අවසරඇත, අවකාශ ඇත්තේ විය; සමහරු, ඇතම් සංඛ්‍යයෙකුව;(පමුනනලද) විපත, විපත්තියෙහි (දී); ලොවැ, ලෝකයෙහි; සත, (සමහර) සත්වයන්ගේ; රැකෙනු, රක්ෂාවීම; සැබ විය, සත්‍යයෙක් වූයේය.

· 95. කලුන්, කාන්තාවන්; දියකෙළිනාලෙස, ජලක්‍රීඩාකරන පරිදි; දකිමින්, දර්ශනයකෙරෙමින්; නඳ, සන්තොෂයෙන්;පොකුණුඅඹද;පුෂ්කරිණීනමැති අම්බාවද; උන්සමගව, ඒ කාන්තාවන් එක්ව; කෙළිනසඳ, ක්‍රීඩාකරනුසඳහා; එඳ, එදවස්හි; සිතින්, යෞවනවශීයෙන්; ඇරගත්, හැරගත්තාවූ; කලදේසිලිලයයි, කලඹොනජලයයි; පියුම්මැඳ, පද්මමධ්‍යයෙහි; පැලඹෙන, විජෘම්භමාණවන්නාවූ; හස, හංසයන්; දුටුව, දර්ශනයකලහොත්; සිතේ, චින්තනය වේ.

96. පසහිර * දී, පක්ෂරේඛා දානයකොට; සිලිල්පිට, සලිල පෘෂ්ඨයෙහි; සරන, සංචාරණය කරන්නාවූ; හසරද, හංසරාජතෙම; මේමේ, මේ මේ කොටස; නොපටයයි, නොපහටයයි; සියතුනට, පක්ෂීන්ට; දෙනවැනි, දානයකරන්නාක්වැනිය; එහි, ඒස්ථානයෙහි; යුගපිය, යුග්මපක්ෂය; විඳ,

* පියාපත්වලින් වතුරේ ඇදෙන රේඛා (ඉරි.)

97. ර ත් සර කැකුළකට තුඩු දී හසෙක් මො ළ
සි ත් සහ නොසිත් සෙද විදහා පුබුදුක ළ
ප ත් නු අනඟරස අඟනකට කරු ලො ළ
ම ත් සලෙලකු ගියාවැනි අවල කෙළි කෙ ළ

98. පි ය කර ලකරවන් තමගතට ඇමක ළි
නි ය තම දකැ සිඳිනබව පියුමක් එක ළි
සි ය හිමිහට කියනුවස් විල්කත් සස ළී
සි ය පත් අතින් ගණනෙව් පෙතියෙන් ඇඟි ළි

99. කෙළිතු සිලිල් මෙවිලස මනකල් කලු න
දි මු තු දසන් පැහැසරදර පැහැනෙනි න
ග නු තු රත තඹර නිලුපුල් සල නෙළෙ න
අ මු තු ලදින් දියසිරි රඟනෙව් නොසි න

---

සිට, ප්‍රසාරණයකොටසිට; දියකා, දීර්ඝකවුඩුනෙම; කෙවෙනි, කුමක් (කියන්නාක්) වැනිද; මට, මාහට; මෙපමණක්, මේප්‍රමාණයක්; දුන, දූනය කළහොත්; මැනවසි, මනොඥයයි; යනවැනි, කියන්නාක් වැනිය.

97. මොළ, චණ්ඩවූ; හසෙක්, හංසයෙක්; රත්සරකැකුළකට, රක්ත පද්මකුඩ්මලයකට; තුඩුදී, තුණ්ඩදානයකොට; සිත්සහනොසිත්, චිත්ත නොසහිතව; සෙද, ශීඝ්‍රව; විදහා, විජෘම්භණකොට; පුබුදු කළ, (ඒ) ප්‍රබොධ කෙළේය. (කුමක්මෙන්දයත්?) අනඟරස, මදනරසයට; පත් නු, අප්‍රාප්තවූ; අඟනකට, ස්ත්‍රීයකට; ලොළකරු, ලොභකොට; මත්සලෙලකු, (රාගයෙන්) මත්තසල්ලාලයකු; අවලකෙළිකෙළ, රතික්‍රීඩාකොට; ගියා වැනි, ගමනය කළාක් වැන්න.

98. තමනතට, තමාගේ ශරීරයට; ඇමකළි, සැමකල්හි; පියකර, ප්‍රියඞ්කරවූ; ලකරවන්, අලඞ්කාරයක්වූ; පියුමක්, පද්මයක්; සිඳිනබව, ඡින්දනය කරන්නාවූ භාවය; නියනම, නිශ්චයෙන්ම; දකැ, දර්ශනයකොට; එකළි, තත්කාලයෙහි; විල්කත්, නඩාගනමැති කාන්තාතොමෝ; සියහිමි හට, ස්වකීය ස්වාමියාහට; කියනුවස්, කථනය කරනු පිණිස; සසළි, චපලවූ; සියපත්, ශතපත්‍ර නමැති; අතින්, හස්තයෙන්; පෙතියෙන් ඇඟිලී, පත්‍රවූ අඞ්ගුලියෙන්; ගණනෙව්, ගණින්නාක් වැන්න.

99. මනකල්, මනොඥවූ; කලුන, කාන්තාවන්; මෙවිලස, උක්තප්‍රකාර යෙන්; සිලිල්කෙළිතු, ජලක්‍රීඩාකරනකල්හි; දිමුතු, දීප්තිමත්වූ; දසන්පැහැසර, දන්තප්‍රභාවයෙන් සාරවූ; අදර, අධරයන්හා; පැහැ, ප්‍රභාවඇත්තාවූ; නෙතින, නෙත්‍රයෙන්ද; රතනඹර, රක්තතාමරසයන්හා; නිලුපුල්, නීලොත්පලයන්ගේ; (විලාසය) ගනුතු, ග්‍රහණයකළකල්හි; නෙළෙන,

100. පැ ළ දිගු සුනිල් මිණිතරයුත බිතෙහි ල ඹා
ප ළ පැහැ පළොල්වන් මිණිතල්වැටෙක සුබා
අ ළ සඳ අසඳ බිඹු සොඳ සපිරි සිහිල ඹා
කෙ ළ අවසනය පත්වන පියඹ ලෙස ලො බා

101. ස ඳ වෙල වසන් නිලඹර මුහුලසිනි බ ඳ
සොඳ පෙරදිගු දිගුනෙන සැදි නලල් මැ ද
ස ඳ න තලාවට සිරි ගත සුපුන්ස ඳ
ර ඳ මමිතුර අග්බෝ වෙහෙරැ මනන ඳ

102. පෙරදිග නිරිඳු පැහැසර දිගු රැහැන ගෙ න
හළ නිලඹරෙහි ගනරනගස් පතක් මෙ න
බබලන ළහිරු මොහොතක් මුනිගුණ මෙනෙ න
සිහිකර නැමඳූ සෙඳ යාගන් ගුවනති න

---

මාරුතයෙන්; සල, චචලවූ; දියසිරි, ජලශොභාව; (කෙසේද?) අමුතු, අමුත්තක්; ලදින්, ලබ්ධභාවයෙන්; තොසින, සතොෂයෙන්; රඟනෙව්, නෘත්‍ය කරන්නාක් මෙනි.

100. පැළදිගු, පශ්චිමදිශානමැති; සුනිල්මිණිතරයුත බිතෙහි, අති නීලමාණික්‍යාස්තරණයෙන්යුක්ත භිත්තියෙහි; ලඹා, එල්ලෙන්නාවූ;පළ, ව්‍යාප්තවූ, පැහැ, ප්‍රභාව ඇත්තාවූ; පලොල්වන්, * පාටලවර්ණවූ; මිණි තල්වැටෙක, මාණික්‍ය තාලවෘන්තයක; සුබා, ශොභාව; අසඳබිඹු, සූර්‍ය මණ්ඩලය;අළසඳ, එළවූ කල්හි; පියඹ, ප්‍රියාම්බිකාවන්; ලොබාලෙස, ලොභය පරද්දෙන්; සොඳ, සුන්දරවූ; සපිරිසිහිලඹා, සම්පූර්ණ ශීතලජලය; කෙළ, ක්‍රීඩාකොට; අවසනය පත්වන, අවසානයට ප්‍රාප්තවූකල්හි.

101. සඳවෙල, සන්ධ්‍යාවලාහක නමැති;වසන්, වස්ත්‍රයෙන්ද; බඳ, බන්ධනය කරනලද්දාවූ; නිලඹරමුහුලසිනි, නිලාකාශනමැති ධම්මිල්ලයෙන්ද යුක්තවූ; සොඳ, සුන්දරවූ; පෙරදිගු, පූර්වදිශා නමැති; දිගුනෙන, දීර්ඝාක්ෂියගේ; නලල්මැද, ලලාටමධ්‍යයෙහි; සැදි, සජ්ජිතවූ; සඳනතලාවට, චන්දනතිලකා වෘත්තියක; සිරි, ශොභාව; සුපුන්සඳ, සම්පූර්ණචන්ද්‍රයා; ගත, ග්‍රහණය කළකල්හි; මමිතුර, මාගේ මිත්‍රය; මනනඳ, මනොනන්දනය වන්නාවූ; අග්බෝවෙහෙරැ, අග්‍රබොධි විහාරයෙහි; රඳ, රඤ්ජනයකර.

102. පෙරදිග, පූර්වදිශා නමැති; නිරිඳු, නරෙන්ද්‍රයාවිසින්; පැහැසර, ප්‍රභාසාර නමැති; දිගුරැහැන, දීර්ඝරජ්ජුව; ගෙන, ග්‍රහණයකොට; නිල ඹරෙහි, නිලාකාශයෙහි; හළ, හැර්‍යාවූ; ගනරන, ඝනසුවර්ණ (මය)වූ; අහස්පතක්මෙන, ආකාශපත්‍ර (සරුන්ගල) යක් මෙන්; ළහිරු, බාලාදිත්‍යා; බබලන, භ්‍රාජමානවන කල්හි; මුනිගුණ, සර්වඥගුණය; මොහොතක්,

---

* සුදෙන් රතෙන් මිශ්‍රිතවූ පැය.

103. දි ලි හෙම් පබළු මුතුමිණිවන් පැහැ විහි දී
බ ලි න ම් පසිදු විප්වෙස් ඈ දනන් රැ දී
ගෙ ලි ද ම් තිසර බරණින් හෙබි ලියන් සැ දී
වැ ලි ග ම් පටුන වදු සව්සිරි පිරි ඔරැ දී

104. පැහැයෙන් නැහැස්මෙන් අගයෙන්ද කිරුමෙ න
මෙඇ මි න් මදින් මද සැලසිමෙන් රැගෙ න
ඉ සු රෙ න් පසිදු දිය දිසි වෙසවුණු සෙයි න
වෙ ළ දු න් බලන් මගැ සල්පිල්වල හිඳි න

105. ත රා දියෙහි ලූ කස්තුරුයෙ වෙළඳු න
පු රා ඉඳින ගුම්නැති බමර සමගි න
කි රා දෙතත වැද උන් දූක ඉඟිල ය න
ත රා සවන බල පිටිසර ගැහැවිය න

---

මුහුණිනියක්; මෙනෙන, චින්තනයෙන්; සිහිකරැ, ස්මරණය කොට; නැමඳ, නමස්කාරකොට; සෙද, වහා; ගුවනගින, ආකාශයෙන්; යානන්, යාත්‍රා ග්‍රහණය කරව.

103. පැහැ, ප්‍රභාව; විහිදී, විසන්ධිව; දිලි, දිලියෙන්නාවූ; හෙම්පබළු මුතුමිණි, සවර්ණප්‍රවාල මුක්තාමාණික්‍යයෙන් යුක්තවූ; අවන්, ආපනයන් ඇත්තාවූ; බලි, බලවත්වූ; නම්පසිදු, නාමයෙන් ප්‍රසිඩවූ; විප්, බ්‍රාහමණ යන්ද; වෙස්, වෛශ්‍ය (කුල) යන්ද; ඈ, යනාදීවූ; දනන්, ජනයන්; රැඳි, රඤ්ජිතවූ; ගෙලිදම්, ග්‍රිවාදාමයෙන්ද; තිසර බරණින්, මෙඛලාදාම යෙන්ද; හෙබි, ශොභනවූ; ලියන්, කාන්තාවන්; සැදි, සජ්ජිතවූ; සව් සිරි, සකලෛශ්වර්යයෙන්; පිරි, සම්පූර්ණවූ; ඔරැදි, විරාජමානවූ; වැලි ගම්පටුන, වැලිගම්පටුන නම්වූ ප්‍රදෙශයට; වදු, ප්‍රවිෂ්ටවව්.

104. පැහැයෙන්, වර්ණයෙන් ගතයුතු දෙයද; නැහැස්මෙන්, උරගෑ මෙන් ගතයුතුදෙයද; අගයෙන්ද, මිල කිරිමෙන් ගතයුතු දෙයද; කිරු මෙන, කිරිමෙන් ගතයුතුදෙයද; (යන) මෙඇමින්, මේ සියල්ලෙන්; ම දින්මද, ස්වල්පයෙන් ස්වල්පය; සැලසීමෙන්, සජ්ජිතකිරීමෙන්; රැගෙන, ග්‍රහණයකොට; ඉසුරෙන්, ඓශ්වර්යයෙන්; දිය, ලොකයෙහි; දිසි, දෘශ්‍ය මානවූ; වෙසවුණු සෙයින, වෛශ්‍රවණයා පරිද්දෙන්; පසිදු, ප්‍රසිඩවූ; මගැ, මාර්ගයෙහි; සල්පිල්වල, ආපනශාලාවන්හි; හිඳින, නිෂීදනය කරන් නාවූ; වෙළඳුන්, වාණිජයන්; බලන්, නිරීක්ෂණය කරන්.

105. වෙළඳුන, වනික් ජනයන්විසින්; තරාදියෙහි, තුලායෙහි; ලූ, ප්‍රක්ෂිප්තවූ; කස්තුරුයෙ, කස්තූරිකායෙහි; පුරා, සම්පූර්ණව; ඉඳින, උප වෙශනය කරන්නාවූ; ගුම්නැගී, ඝොෂාරහිතවූ; බමර සමගින, භ්‍රමරයන් හා සමග; කිරා, ප්‍රමාණකොට; දෙන්, (ඒකස්තූරිකා) දානය කරන කල්හි; අන, (මිළිගන්නා) හස්තය; වැද, ස්පර්ශිවීමෙන්; ඉඟිලයන, ඉගිලි යන්නාවූ; උන්, ඒ භෘඞ්ගයන්; දූකැ, දර්ශනයකොට; තරාස වන, කොප වන්නාවූ; පිටිසර, ප්‍රත්‍යන්තරවාසිවූ; ගැහැවියන, ගෘහපතීන්; බල, අව ලොකනය කර.

106\. ත  ල් අතු සොලවමින් කරැ කල කල නින ද
ග  ල් මතු ගඟුල් හැළි විහිගුම් ගිගුම් ඇ  ද
ම  ල් වතු පෙළින් එන මඳ සුවඳනල වි  ඳ
පො ල් වතු මෝදරින් යාගන්නැ සකිස  ඳ

107\. නි  ල් දු  ම් යොන්වැලෙව් ගුම්ගත් මිහිලොලුන
ම  ල් ද  ම් තුරුවෙළෙප්යුතු වෙළෙමින්ඉඳි න
පොල් හෙම් තැඹිලි පුවකුගු රඹ වන සොබ න
ව  ල් අ  ම් බලමැ ඉඳැ සැතපෙමිනි යාග  න

108\. මි හි ක ත සුනිල් මුහුලස මෙන් තරව බැ  දී
ව නපෙ ත මැද කුසුම් සුඹුලක සිරින් සැ  දී
සි ය ග ත පැ පෑ එන සුරකැළට එහි රැ  දී
ගම නොත යෙහෙකි මිතුරිඳු සඳ තොසින් යෙදී

---

106\. කලකල, කලකලයන; නිනදකරැ, ශබ්දකොට; තල්අතු, තාල ශාඛාවන්; සොලවමින්, චාලනය කෙරෙමින්; ගල්මතු, පර්වතමස්තක යෙහි; ගඟුල්හැළි, ගංගානිර්ඣරයන්ගේ; විහිගුම්, විශේෂයෙන් ශීඝ්‍රවූ; ගිගුම්, ගර්ජනාව; ඇද, ආකර්ෂණයකොට; මල්වතුපෙළින් එන, පුෂ්ප වස්තු පඞ්ක්තියෙන් එන්නාවූ; මඳසුවඳනල, මන්දසුගන්ධ මාරුතය; විඳ, වින්දනයකොට; පොල්වතු මෝදරින්, එනම්වූ ස්ථානයෙන්; සකිසඳ, මිත්‍රොත්තමය; යාගන්නැ, යාත්‍රාග්‍රහණය කරව.

107\. නිල්දුම්යොන්වැලෙව්, නීලධූමයොනි පඞ්ක්තියක් (වැහි වලාකුල් පෙළක්) මෙන්; ගුම්, ඝොෂාව; ගත්, ග්‍රහණය කළාවූ; මිහිලොලුන, මධු ලොලයන් විසින්; වෙළෙමින්, වෙෂ්ටනයවෙමින්; ඉඳින, නිසීදනය කරන්නාවූ; මල්දම්, පුෂ්පදාම ඇති; තුරු වෙළෙප්යුතු, වෘක්ෂවිටපයෙන් යුක්තවූ; පොල්, නාරිකෙලය; හෙම්තැඹිලි, ස්වර්ණ සත්කිරය; පුවක්, පූගය; උගු, ඉක්ෂුය; රඹ, රම්භාය; (යන) වන, වනයෙන්; සොබන, ශොභනාවූ; වල්අම්බලමැ, වල්අම්බලම නම්වූ ස්ථානයෙහි; ඉඳැ, නිසීදනය කොට; සැතපෙමිනි, සන්තර්පිතවෙමින්; යාගන, යාත්‍රා ග්‍රහණය කොට.

108\. මිහිකත, මහීකාන්තාව විසින්; තරව, ස්ථිරව; බැඳී; බන්ධනයකරන ලද්දාවූ; සුනිල්, අතිනීලවූ; මුහුලස මෙන්, ධම්මිල්ලය වැනිවූ; වනපෙත මැද, වනපඞ්ක්තිමධ්‍යයෙහි; කුසුම් සුඹුලක, පුෂ්පචුම්බටකයෙක්හි; (මල් සුඹුලෙක්හි) සිරින්, ශොභාවෙන්; සැදී, සජ්ජිතවූයේ; එහි, ඒ

109. සු රි ඳු න් සදිසි සිළු මිණි කුල සත පා ය
දි රියෙ න් ගිරිඳුසරි යසසින් පිනි පා ය
සි රි බ න් තැන් පිහිටි විජයබ නර පා ය
සි රි ව න් දෙලෙහි සැතපෙව පිය සත පා ය

110. පඟු රන් සහසිඟුරු ගැවසුණු සුනිල් අ ති න්
වගු රන් නෙන් පවනමල් අසල වනපෙ ති න්
මගු රන් කා නැගෙන වනතුරු දියත රු හි න්
පඟු රන් වෙල්එළිය දූකැ යන්නැ වෙන්පති න්

111. නොසරුප්පා කරනුව එන කුරුලු කැ ලා
නොසතප්පා සොලුවන ටකපෝරු වැ ලා
ක සරුප්පා වෙලැ කිරිවත් ගොයම් ව ලා
නොසතප්පා යව ඇල්ගෙවිලියන් බ ලා

---

වනයෙහි; රැඳී, රංජිතවූ; සියගත, සවකීය ශරීරයෙහි; පෑ, ප්‍රභාව; පෑ, ප්‍රකාශකොට; එන, එන්නාවූ; සුර කැළට, දිව්‍ය සමූහයාට; තොසින්, සන්තොෂයෙන්; යෙදී, යොජිතව; මිතුරිඳු සඳ, මිත්‍රොත්තමය; ගමනොත, ගමන්ගතහොත්; යෙහෙකි, යහපති.

109. සුරිඳුන් සදිසි, ශක්‍රයන් සමානවූ; සනපායකුල, සූර්‍ය්‍යවංශයට; සිළුමිණි, සිඛා මාණික්‍යයක් වැනිවූ; දිරියෙන්, ධෛර්‍ය්‍යයෙන්; ගිරිඳුසරි, මහාමෙරු පර්‍වතය සමානවූ; යසසින්, කීර්ත්තියෙන්; පිනිපාය, චන්ද්‍රයා සමානවූ; විජයබ නරපාය, විජය බාහු නරෙන්ද්‍රයා විසින්; සිරිබත් තැන්, ශ්‍රී ඛණ්ඩ ස්ථානයෙහි; පිහිටි, පිහිටුවන ලද්දාවූ; සිරිවත් දෙලෙහි, සිරිවත්දල නම්වූ ස්ථානයෙහි; පිය, පක්ෂයන්; සතපාය, සන්තර්පණය කොට; සැතපෙව, ශයනය කරව.

110. පඟුරන්සහ, පඟුරන් සමග; සිඟුරු, හිඟුරු නම්වූ ලතාවන්ගේ; සුනිල්අතින්, අතිනිලවර්ණ ශාඛාවෙන්; ගැවසුණු, සංකීර්ණවූ; අසලවන පෙතින්, ආසන්නවනපඞ්ක්තියෙන්; මල්, පුෂ්පයන්; පවන, මාරුතයෙන්; වගුරන්නෙත්, වගුරුවනනෙයින්; දියත, ජලාන්තයෙහි; රුහින්, රුචියෙන්; මගුරන්, * රෝහිත මත්ස්‍යයන් විසින්; කා, අනුභවකොට; නැගෙන, උද්ගතවන්නාවූ; වනතුරු, අරණ්‍යාභ්‍යන්තරයෙහිවූ; පඟුරන්වෙල් එළිය, එනම් ක්ෂෙත්‍ර ප්‍රදෙශය; දූකැ, දර්ශනයකොට; වෙන්පතින්, ආකාශයෙන්; යන්නැ, ගමනය කරන්න.

111. නොසරුප්පා කරනුව, (සත්ත්‍වයන්) නොසරුප් ක්‍රම පිණිස; එන, ආගමනය කරන්නාවූ; කුරුලු කැලා, පක්ෂිසමූහයාට; නොසතප්පා, අනනුරූපචෙඡදනොකොට; ටකපෝරු වැලා, ටකපෝරුපෙළ; සොල

---

* මගැ, මාර්ගයෙහි; උගුරන්, වරාහයන්; කියාද මෙසේද අර්ථවිවරණය කළහැකිය.

112. බිඟුබ ට ක ල ට නඹරට සුවඳට රෙණ ට
මුතුප ට ලෙ ස් ට සැදි වැලිපිට දෙන දව ට
ලියදු ට නොසි ට සහතුට නෙතට සැපය ට
එමවි ට ම ග ට බැසැ යව මහතොට ගම ට

113. කා ලම දෙවුන් හා දලසිත් ඉදි නිතො ර
කු ලම නැතිව දෙස් පිරිසිදින බැවහ ර
සී ලම සිහිල් පිරි හේමැඳුරත් සොඳු ර
පා ලම යෙහෙන් සැනපි යන්නැ මමිතු ර

114. දෙතර මුහුළු සල් දෙඹ පු ල් වලා අ ගින්
නි තර සපිරි සිහිලඹැ නි ල් වලා ර ගින්
වැ තිර කෙළිනා මත්ගජ නි ල් වලා ග ගින්
එ තර පියාසර කර නි ල් වලා ම ගින්

---

වන, සොලවනලද; කිරිවත්, ක්ෂීරප්‍රවෙශ (කිරිවැදුනා)වූ; ගොයම්වලා, සස්‍යයෙන් ගැවසීගත්තාවූ; කසරුප්පාවෙලැ, කසරුප්පා නම්වූ ක්ෂෙත්‍ර යෙහි; ඇල්ගෙවිලියන්, සාලිගොපිකාඞ්ගනාවන්; බලා, අවලොකනය කොට; නොසනප්පා, සන්තර්පිතනොව; යව, ප්‍රයාණය කර.

112. රෙණට සුවඳට, රෙණු සුගන්ධය පිණිස; නඹරට, නාමරසයට; බිඟු, භෘඞ්ගයන්; බට කලට, අවතීර්ණවූ කාලයට; මුතු පටලෙසට, මුක්තා පට්ට විලාසයට; සැදී, සජ්ජිතවූ; වැලිපිට, වාලුකාපෘෂ්ඨයෙහි; දවට දෙන, දූවටීම දෙන්නාවූ; ලිය, කාන්තාවන්; දුට, දර්ශනය කළ කල්හි; සහතුට, සන්තුෂ්ටව; නෙතට සැපයට, නෙත්‍ර සෞඛ්‍යය පිණිස; නොසිට, සවා නය නොකොට; එම විට, එමකාලයෙහි; මගට, මාර්ගයට; බැසැ, අවතී ර්ණව; මහතොට ගමට, මහාතීර්ථ නම්වූ ග්‍රාමයට; යව, ගමනය කරව.

113. කාලම, කාලම්; (පිඹිමෙහි) දෙවුන්හා, ප්‍රධාතිත්සමග; දල, ඉක්‍ෂු ජලයෙන්; සිත්, චිත්තයට; ඉදි, සෘඞ්ඛකරන්නාත්ගෙන්ද; නිතොර, නිර න්තරවූ; කුලමනැතිව, කෝලනැතිවම; බැවහර, ව්‍යවහාරවූ; දෙස්, (නානා) දෙශිකවූ; පිරිස, පර්ෂද්; ඉදිනා,නිසිදනායකරන්නාවූ; සීලම සිහිල්, අතිශයෙන්ම ශීතලයෙන්; පිරි, පූර්ණවූ; සොඳුර, සුන්දරවූ; හේමැඳුරත්, සෙතුමන්දිරනතරයෙහිවූ; පාලම, පාලමෙහි; සැනපි, සන්තර්පිතව; මමිතුර, මාගේ මිත්‍රය; යන්නැ, ගමනය කරන්න.

114. දෙතර, උභය තීරයෙහි; පුල්වලා, ඵුල්ල (පුෂ්ප) යෙන් ගැවසී ගත්තාවූ; අගින්, මස්තකයෙන් යුක්තවූ; මුහුළු සල් දෙඹ, වකුලශාල පුන්නාග වෘක්ෂයන් ඇත්තාවූ; නිල්වලා රගින්, නීලවලාහකාකාරයෙන්;

115. මී පා සවන සිරිපාසර සරණ පෙ මා
මා පා විරබා කරවූ නමින් ත මා
මා පා පටන් වැඳ එතැනින් මිතුරු තු මා
තා පා සනපමින් යාගත් නිවා ගි මා

116. සක් කල් සදිසි ලියපද පහර වැඳගෙ න
අක් මුල් නොහැර මල් පිපි හෝපළු සොබ න
දික් ගල් තලින් යුතු සිකිකැන් පිලඹර න
උක් ගල් බැවුල ගෙවමින් මගට බැසැ ගෙ න

117. සු පි පි මලී බ ම රු දලී තමලු වැලී මලාමැ ලී
තුටුකෙවිලී සකොලහලී සු පි පි යලී වෙනෙහිපුලී
ළපළු හැලී සෙවන වලී පැහැසුනිලී ගනවැදි ලී
බල මෙමලී තුරු සියලී ව ළ වි දු ලී සිරි ලක ලී

---

නිතර, නිරන්තරයෙන්; සපිරි, සම්පූර්ණවූ; සිහිලැඹැ, ශීතල ජලයෙහි; වැතිර, පතිනව; කෙළින, ක්‍රීඩාකරන්නාවූ; මත්ගජ,මත්ත හස්තීන් ඇත් නාවූ; නිල්වලා ගඟින්, නීලවලා ගංගාවෙන්; එතර, පාරිමතීරව; නිල් වලා මගින්, ආකාශයෙන්; පියාසර කර, පක්‍ෂප්‍රසාරණය කරව.

115. අසවන, ආසන්නප්‍රාප්තවූ; මීපා, මහීපාලයන්විසින්; පෙමා, ප්‍රේම යෙන්; සරණ, ප්‍රතිඥාකරනු ලබන්නාවූ; සිරිපා, ශ්‍රීපාදනමැති; සර, පද්මය ඇත්තාවූ; මාපාවීරබා, මාපාවීරබාහු රජවිසින්; තමානමින්, තමාගේ නාමයෙන්; කරවූ, කරවනලද්දාවූ; මාපාපටන්, මාපාපටුනට; වැඳ, ප්‍රවේශව; මිතුරුතුමා, මිත්‍රොත්තමය; එතනින්, ඒ ස්ථානයෙන්; තාපා, තාගේ පාදයන්; සනපමින්, සන්තර්පනය කෙරෙමින්; ගිමා, ග්‍රීෂ්මය; නිවා, නිර්වාපණය කොට; යාගන්, යාත්‍රාග්‍රහණය කර.

116. සක්කල් සිදිසි, ශක්‍රයාගේ (සුජාතානම්)කාන්තාව සමානවූ; ලිය, ස්ත්‍රීන්ගේ; පදපහර, පාදප්‍රහාරය; වැඳගෙන, ස්පර්ශග්‍රහණයකොට; අක් මුල්, වෘක්‍ෂාග්‍රයන්හාමූලයන්; නොහැර, අපගතනොකොට; මල්, පුෂ්පයන්; පිපි, පුෂ්පිතවූ;හෝ, අශෝක වෘක්‍ෂයෙන් හා; පළු,පිලුවෘක්‍ෂයෙන්ද; සොබන, ශොභනවූ; සිකිකැන්, මයූරසමූහයා විසින්; පිලඹරන, පිඤ්ඡා වෘත්තනය කරන්නාවූ; දික්ගල් තලින්යුතු, දීර්ඝපාෂාණතලයෙන් යුක්තවූ; උක්ගල්බැවුල, එනම්වූ ස්ථානය; ගෙවමින්, අතික්‍රාන්ත කෙරෙමින්; මගට, මාර්ගයට; බැසගෙන, අවතීර්ණග්‍රහණය කොට.

117. සුපිපි, සුපුෂ්පිතවූ; මලී, පුෂ්පයන්හි; බමරුදලී, භෘඞ්ගජාලාය; තමලුවැලී, තමාල ලතාය; මලාමැලී, ක්‍ෂුද්‍රම්ලානපුෂ්පය; තුටු, (මධුරමූපානාදිය කරණකොටගෙන) තුෂ්ටභාවයෙන්; සකොලහලී, කොලාහලසහි

118. මෙනිඳු නිලී පැහැ ඉසිලී එව නැ වි ලී පියුමුපු ලී
වතල ලෙලී ව ග ල මලී රෙණින වලී එන ගඟු ලී
සතුරු කැලී බ ම වි ස ලී යු තු සි හි ලී පිරි සිලි ලී
නුබ කි ය ලී ස කී එකලී දෙ ලෙහි ගිලී යව ඉපි ලී

119. තු රු ප ත රා අ ත ර තරා රඳන ගිරා කැල නිතොරා
කු සු ම ස රා රිය සොඳු රා අදින වරා බැරිවැහැ රා
සැඟෙවිසොරා පැමිණි පු රා මෙසිරිසරා දැකැනොහැරා
තු ටි නු තු රා ත සි ත පුරා යව මිතුරා එවන තු රා

---

නාවූ; කොවිලි, කොකිලය; යළි, නැවත; සුපිපි, මනාකොට පිපුණාවූ; වෙනෙහිපුලී, වනොත්පලය; (යනමෙයින්හා) හැලී, සිහිල්වූ; ළපළු, බාල පල්ලවයෙන්හා; සෙවන, ඡායාවෙන්ද; අවලී, ආකුලවූ; ගනාවැ දිලි, ඝනව දිලියෙන්නාවූ; සුනිලිපැහැ, මනොඥ නීලවර්ණය ඇත්තාවූ; මෙමලි තුරුසියලි, උක්තප්‍රකාර වෘක්ෂ සියල්ල කරණකොටගෙන; විදුලිසිරි, විද්‍යුල්ලතාශ්‍රීයෙන්ද; ලකලී, අලඞ්කාරවූ; වල, වනය; බල, නිරීක්ෂණය කර.

118. ඉඳුනිලිමෙන්, ඉන්ද්‍රනීලයට බඳුවූ; පැහැ, වර්ණය; ඉසිලි, උද්වහනය කරන්නාවූ; පියුමුපුලී, පද්මොත්පලයන් ඇති; විලී, තඩාගයෙන් යුක්තවූ; එවනැ, ඒ අරණ්‍යයෙහි; ලෙලී, ලීලොපෙතව; වගල, ගිලිහුණාවූ; වතල, විස්තෘතවූ; මලිරෙණින්, පුෂ්පරෙණුවෙන්; අවලී, ආකුලව; එන, ආගමනය කරන්නාවූ; ගඟුලී, ගංගානිර්ඣරයන් ඇත්තාවූ; සතුරු කැලී, ශත්‍රු(හොරු)සමූහයා; බම, භ්‍රමණය කරනලද්දාවූ; විසලී, විසාරිණීවූ; පිරි, පූර්ණවූ; සිලිලී, සලිලයෙන්; යුතු, යුක්තවූ; නුබ, ආකාශය; කියලී, ප්‍රකාශකළාවූ; දෙළෙහි, නිර්ඣරයෙහි; ගිලී, නිමග්නව; ඉපිලී, ඉල්පී; සකී, යහළුව; එකලී, ඒ (උඟ්ගල්බැවුල ගෙවා මගට බැසගත්) කාලයෙහි; යව, යාත්‍රා කරව.

119. තුරුපතරා, වෘක්ෂප්‍රස්තාරයන්හි; අතරතරා, අනන්තරානන්තරයෙහි; නිතොරා, තොරනැතිව; රඳන, රජමානවූ; ගිරාකැල, ශුකසමූහයා; (කෙබඳුද?) කුසුමසරා, අනඞ්ගයාගේ; සොඳුරා, සුන්දරවූ; රිය, රථය; අදිනවරා, ආකර්ෂණය කරන්නාවූ කාලයෙහි; බැරිව, අසක්‍යභාවයෙන්; හැරා, අත්හැර; සැඟෙවි, ගුප්තව; සොරා, චෞරභාවයෙන්; පැමිණිපුරා, ප්‍රාප්තාකාරයි; මිතුරා, මිත්‍රය; එවනතුරා, ඒ වනාන්තරයෙහි; මෙසිරිසරා, උක්තප්‍රකාරශ්‍රීසාරය; නොහැරා, අත්නොහැර; දැකැ, දර්ශනයකොට; තුටිනුතුරා, අතිරෙක තුෂ්ටභාවයෙන්; තසිතපුරා, තාගේ චිත්තපූරණය කොට; යව, ප්‍රයාණය කර.

120. කර සුනිමල් උපුල් ලෙ ළී
බොන පය මුව ගිම විස ළී
ඔවුන් නුවන් සඳැස්පෙ ළී
පිල්බර සිරි විලස් හැ ළී

121. සසලව වනකැලා එ න ම ල් කැළඹ ලා
රුඳිමුවරඳ ලොලා ම න ක ල් එහි ලො ලා
තුඟුතුරු අගපුලා ස පු ම ල් සුපිපු ලා
උසනැඟි දුම්නලා පැ හැ දු ල් දියුණු ලා

122. ගු ම් ග ත් මේ කුළුවන් මතැතු න් ගේ
ද ම් ද ත් පැහැ දූකැ ලෙළවිදු අ න් ගේ
පෙම් සි ත් කරගෙනැ සෙබඩුන් ල න් ගේ
සම් ප ත් වූ ගිරිරග සිකිර න් ගේ

---

120. සුනිමල්, අතිශයෙන් නිර්මලවූ; උපුල්, උත්පල නමැති; ලෙළී, ලීලොපෙතවූ; කර, ග්‍රීවා ඇත්තාවූ; විසළී, බහුලවූ; ගිම, ග්‍රීෂ්මයෙන් යුක්තවූ; මුව, මෘගයන්; පය, ජලය; බොන, පානයකරනකල්හි; ඔවුන්, ඒ මෘගයන්ගේ; නුවන්, නෙත්‍රනමැති; සැඳැස්පෙළී; * චන්ද්‍රකපඞ්ක්තිඇත්තාවූ; හැළී, නිර්ඣරයෝ; සිරි, ශ්‍රීමත්වූ; පිල්බර, පිඤ්ඡභාර (මයුර) යන්ගේ; විලස්, අකාරයෝයි.

121. සසලව, චචලව; වනකැලා, වනකැලෑවෙන්; එන, එන්නාවූ; මල්කැළ, පුෂ්පසමූහය; බලා, නිරීක්ෂණයකොට; මුවරඳලොලා, (එහි) මකරන්දලොභයෙන්; රුඳි, රංජිතවූ; මනකල්, මනඃකල්‍යවූ; මිහිලොලෝ, මධුලොලයන් අත්තාවූ; තුඟු, උස්වූ; තුරුඅග, වෘක්ෂාග්‍රයෙහි; පුලා, පුල්ලවූ; සුපිපුලා, අතිබහුලවූ; සපුමල්, චම්පකපුෂ්ප (කෙශේද?) උසනැඟි, උස්වනැංගාවූ; දුම්නලා, ධූමයෙන් යුක්ත වහ්නියක; පැහැ, ප්‍රභාවගේ; දියුණු, විගුණවූ; උදුල්, උජ්ජ්වලිත භාවයට; අලා, පැමිණියේය.

122. ගුම්, ඝොෂාව; ගත්, ග්‍රහණයකලාවූ; මේකුළුවන්, මෙඝකූටයන් වැනිවූ; මතැතුන්ගේ, මත්තහස්තීන්ගේ; ලෙළ, ලීලොපෙතවූ; විදුඅන්ගේ, විද්‍යුල්ලතාකාරවූ; දම්දත්, දන්තමාලාවන්ගේ; පැහැ, ප්‍රභාව; දූකැ, දශීනයකොට; පෙම්සිත්, ප්‍රෙමචිත්තයෙන්; සෙබඩුන්, මයුරබෙනුන්; ලන්ගේකරගෙන, සමීපකොටගෙන; ගිරිරග, පර්වතාග්‍රයෙහි; රන්ගේ, නෘත්‍යයට; සිකි, මයුරයෝ; සම්පත් වූ, සම්ප්‍රාප්තවූහ.

---

* "චන්ද්‍රක" යනු මයුරයන්ගේ පිඤ්ඡපත්හි චන්ද්‍රාකෘතිව නෙත්‍රාකාරයෙන් තිබෙන සලකුණකි.

123. අ ද නා මනනෙතු නඳුනුයනෙක ළු
සොබනා නාකුසුමෙන් සත් මුහු ළු
ර ඳ නා එහි දෙවඟන කැන් බැබ ළු
ස ද නා තුරු පටසළුවැනි යහ ළු

124. ලි ය කැ ලේ යන මුවකැ ලේ
මිහි ලො ලේ සරපුල් වි ලේ
ම ඳ න ලේ නවපලුසැ ලේ
සි තු ඇ ලේ දුටු කලැව ලේ

125. ක න් ප සේ නිලුපුල්ග සේ
මෙ න් හ සේ ගමනින්ල සේ
ර න් රු සේ අඟනන්රැ සේ
ස න් තො සේ දුකැ මං බැ සේ

---

123. මනනෙතු, විශාලනෙත්‍රයන්; අදනා, ආකර්ෂණය කරන්නාවූ; නඳුනුයන, නන්දනොද්‍යානයහා; එකළු, එකාකාරවූ; සොබනා, ශෝභමානවූ; කුසුමෙන්, පුෂ්පයෙන්;සත්, ගැවසීගත්තාවූ; නා, නාගය; මුහුළු, වකුලය (යන) වෘක්ෂ (කෙසේද?)ශාහළු, මිත්‍රය; එහි, ඒ වනයෙහි;රඳනා රජමානවූ; බැබළු, බබලන්නාවූ; දෙවඟනකැන්, දිව්‍යාඞ්ගනාසමූහයා විසින්; සඳනා, සජ්ජිත කරන්නාවූ; උතුරුපටසළුවැනි, උත්තරපට සාටක මෙනි.

124. ලියකැලේ, ලතාගුල්මයෙහි;යන, ගමනයකරන්නාවූ;මුවකැලේ, මෘගසමූහයාගෙන්ද; පුල්විලේ, ප්‍රඵුල්ලතඩාගයන්හි; සර, හැසිරෙන්නාවූ; මිහිලොලේ, මධුලොලයන්ගෙන්ද; මඳනලේ, මන්ද මාරුතයෙන්;සැලේ, චචලවන්නාවූ; නවපලු, අභිනවපල්ලවයන්ගෙන්ද (යුක්තවූ); වලේ, වනය; දුටුකලැ, දර්ශනයකළාවූ කාලයෙහි; සිතු, චිත්තය; ඇලේ, ආලය වේ.

125. කන්පසේ, කර්ණපාසයෙහි; නිලුපුල්, නීලොත්පලයන්; ගසේ, ප්‍රවෙශකළාවූ; හසේමෙන්, හංසාඞ්ගනාවන් පරිද්දෙන්; ලසේ, ආලස්‍යවූ; ගමනින්, ගමනෙන් යුක්තවූ; රන්රුසේ, ස්වර්ණරූප බඳුවූ; අඟනන්රැසේ කාන්තාවන් සමූහයා; දුකැ, දර්ශනයකොට; සන්තොසේ, සන්තොෂයෙන්; මංබැසේ, මාර්ගාවතීර්ණව.

126. යලිමල්කැ න් නවසල් ය ටි
සැඳුනලෙසින් කරමුල් සැ ටි
ඒ දු වූ ව න් වනලෙස අ ටි
බ ල මි න් යව අඟනන් සැ ටි

127. කොකුම් ලියෙහි වැකී කොම ළ
වදිමින් නුබගඟ රෙන් ර ළ
පිවිසැ නැවත හිමවන ග ළ
එන නල විඳැ වඩු කෙළැ කෙ ළ

128. සැකමන් කරන නාඟනයසි රුවිනුදු ළ
මුකර න් පියුම තුළ අඟනන්ගෙ මනදෙ ළ
සකව න් බමරු මෙහෙයා රැඳි සැලෙලුකැ ළ
දූකය න් මිතුරෙ පෙරමගැ නාගකෝවි ළ

---

126. යලි, නැවත; කරමුල්සැටි, ග්‍රීවාමූලසංස්ථානය; (නම්) මල්කැන්, පුෂ්පස්තවකයෙන්; නවසල්යටි, අභිනවශාලයෂ්ටියක්; සැඳුනලෙසින්, සජ්ජිතවූවාක්මෙනි; ඒදුටුවන්, එය දර්ශනයකළවුන් විසින්; අටිවනලෙස, කැමතිවන පරිදිවූ; අඟනන්, අඞ්ගනාවන්ගේ; සැටි, ආකාරය; බලමින්, නිරීක්ෂණය කෙරෙමින්; යව, ගමනය කරව.

127. කොමළ, කොමලවූ; කොකුම්ලියෙහි; කුංකුමලතාවෙහි; වැකි, චර්චිතව; නුබගඟ, ආකාශ ගංගාවෙහි; රෙන්, (පුෂ්ප) පරාගයෙන් යුක්තවූ; රළ, තරංගයෙහි; වදිමින්, ඝට්ටනයවෙමින්; නැවත, ඉක්බිත්තෙන්; හිමවනගළ, හිමාලයවන ඝටයෙහි; පිවිසැ, ප්‍රවෙශව; එන, ආගමනය කරන්නාවූ; නල, මාරුතය; විඳැ, විඳිනයකොට; කෙළැකෙළ, ක්‍රීඩාකොටකොට; වඩු, ප්‍රයාණය කර.

128. රුවින්, රූපයෙන්; උදුළ, උජ්ජ්වලිතවූ; නාඟනයසි, නාගාඞ්ගනායසි; සැකමන්, ශඞ්කාවිතනය; කරන, කරනලද්දවූ; අඟනන්ගේ, කාන්තාවන්ගේ; මනදෙළ, චිත්තලොභය කරනුලබන්නාවූ; මුක, වක්ත්‍ර නමැති; රන්පියුම්තුළ, ස්වර්ණපද්මාභ්‍යන්තරයට; බමරුවන්, භෘඞ්ගයන් මෙන්; සක, චක්ෂුව; මෙහෙයා, ප්‍රේරණය (පිටත්) කොට; රැඳි, රංජිතවූ; සලෙලුකැළ, සල්ලාල සමූහයා ඇත්තාවූ; පෙරමගැ, පටිපාටියෙහි; නාගකෝවිල, එනම්වූ දෙවස්ථානය; මිතුරෙ, මිත්‍රය, දූක, දර්ශනයකොට; යන්, ගමනය කරන්න.

129. ක මි න් පියුම්රාමිණි සමුදුරබ ඩ ම
බොම් න් දිය මියුරුවන නිල්මිණික ඩ ම
සෙ මි න් ඇතුළ වැද වැඳ ගණිසුරු ඉ ඩ ම
එ මි න් පිටත් ලැගගත් වැල්ලේ ම ඩ ම

130. දූ හ නත් දිගත පිහිකුළු ගනඳුරු පුව ළ
ප හ රැ බරින්මෙන් සියමඬුලැතුළුක ළ
ස හ සකර වැටෙත පැහැසී සයුරර ළ
ප හ ළෙව් පෙනේ පිටතට වළබගිනිසි ළ

131. වි ය ලනු සියකරින් යුගතෙහි මහසයු ර
සි ය කුලැ පෙරසිරිත් කරුණෙන් සහසක ර
දි ය කඳ අතර එහි මෙතෙකැයි ඇති ගැඹු ර
වි ය ගිලුනෙව් බලනුව විමසා එව ර

---

129 සමුදුරබඩම, සමුද්‍රාසන්නයෙහිම; පියුම්රාමිණි, පද්මරාගමාණික්‍ය යන්; කමින්, ඛාදනය කෙරෙමින්; නිල්මිණිකඩම, නීලමාණික්‍ය ඛණ්ඩ යක්ම වැනිවූ; මියුරුවන, මධුරවූ; දිය, ජලය; බොමින්, පානය කෙරෙමින්; ගණිසුරු, ගණේශ්වරයා වාසය කරන්නාවූ; ඉඩම, ස්ථානයෙහි; ඇතුළ, අභ්‍යන්තරයට; සෙමින්, අතුරිනව; වැද, ප්‍රවෙශව; වැඳ, නමස්කාර කොට; පිටත, බාහිරයට; එමින්, ආගමනය කෙරෙමින්; වැල්ලේ මඩම, වැල්ලේ මඩමෙහි; ලැගගත්, ලග්නග්‍රහණය කර.

130. නත්දිගත, නානාදිශාන්තයන්; පිහිකුළු, ප්‍රතිච්ඡන්නකළාවූ; පුවළ, ප්‍රෞඪවූ; ගනඳුරු, ඝනාන්ධකාරය; දූහැ, (ඒ ඒ දිශාවෙන්) දුරු කොට; පහරැ, පැහැරගෙන; සියමඬුලු, ස්වකීය මණ්ඩලයට; ඇතුළුකළ, අභ්‍යන්තරකළාවූ; බරින්මෙන්, භාරයෙන් මෙන්; සහසකර, සහස්‍රකිරණ (සූර්‍ය්‍ය)යා; රළ, තරඞ්ගයන් හා; පැහැසී, සංසර්‍ගනව; සයුර, සාගරයෙහි; වැටෙත, පතිතවනකල්හි; වළබගිනිසිළ, වඩබාගනිශිඛාව; පිටතට, (සමුද්‍ර ජලයෙන්) බාහිරයට; පහළෙව්, පහළවූවාක් මෙන්; පෙනේ, දෘශ්‍යමානයි.

131. යුගනෙහි, යුගාන්ත (කල්පවිනාශකාල) යෙහි; මහසයුර, මහා සාගරය; සියකරින්, ස්වකීය රශ්මියෙන්; වියලනු, ශුෂ්කකිරීම; සියකුලැ, තමාගේ වංශයෙහි; පෙරසිරිත් කරුණෙන්, පූර්වචාරිත්‍රය හෙයින්; සහස කර, සූර්‍ය්‍යයා; එහි, ඒසමුද්‍රයෙහි; දියකඳ, ජලස්කන්ධයාගේ; අතර, අභ්‍යන්තරයෙහි; ඇති, විද්‍යමානවූ; ගැඹුර, ගම්භීරය; මෙතෙකැයි, මෙපමණක් යයි; විමසා, මීමාංසනය කොට; බලනුව, බලනු පිණිස; එවර, තත්කාල යෙහි; ගිලුනෙව්, නිමග්නවූවාක් මෙන්; විය, වූයේය.

132. නුබසා මඬුලු සඳවෙල ළපලු පැහැප ත
උදයග රුකෙහි සඳ මල්කැනෙක සිරිග ත
කරපතරින් සඳඳර නර පහරදෙ ත
දවගතළුව් බියෙන් ඇලපෙමිනි දසඅ ත

133. පු ලා කමල මුවරඳ පිණිස වැසෙදි නා
ම ලා ගියෙන් දදරද මෙරද වැද ගෙ නා
ලො ලා වෙමින් බමරුන් තම වෙතට එ නා
බ ලා වෙනේලිය ගත මල් මුවෙනි සි නා

134. හැම ගනඳුරු බොනවරැ නිසයුරු ග ත
පහන් බැවින් පිටතට සසලෙසින් ව ත
පුල් නිලුපුල් යවුවන කතක වුවන ත
කලදෙ කැටපතෙක දිසි වැනි පැහැ දිමු ත

---

132. නුබ, ආකාශ නමැති; සාමඬුලු, සාබාමණ්ඩලයද; පැහැපත, ප්‍රභා ප්‍රාප්තවූ; සඳවෙල, සන්ධ්‍යාවලාහක නමැති; ළපලු, බාලපල්ලවයන්ද ඇත් තාවූ; උදයග, උදය පර්වත නමැති; රුකෙහි, වෘක්ෂයෙහි; සඳ, චන්ද්‍රයා; මල්කැනෙක, පුෂ්ප ස්තවකයෙක; සිරි, ශොභාව; ගත, ග්‍රහණය කළ කල්හි; කරපතරින්, රශ්මි සමූහයෙන්; නර, මහත්වූ; පහරදෙත, ප්‍රහාර දානය කරනකල්හි; සඳඅඳර, සන්ධ්‍යාන්ධකාරය තෙම; බියෙන ඇලපෙ මිනි, භීතියෙන් ඇලපාමින්; දසඅත, දිශාන්තරයෙහි; දව, ධාවනය (දිවීම); ගතළුව්, ග්‍රහණයකළාක් වැන්න.

133. පුලා, ඵුල්ලවූ; කමල, පද්මයන්; දදරද මෙරද, චන්ද්‍ර මරීචිය; වැදගෙනා, ස්පර්ශව; මලාගියෙන්, ම්ලාන (භාව)යට පැමිණි හෙයින්; මුව රඳ පිණිස, (පද්ම)මකරන්දය උදෙසා; වැසැ, වාසයකොට; ඉදිනා, නිසීද නය කරන්නාවූ; ලොලාවෙමින්, ලොභවෙමින්; තමවෙතට තමා සමීපයට; එනා, ආගමනය කරන්නාවූ; බමරුන්, භෘඞ්ගයන්; බලා, නිරීක්ෂණය කොට; වෙනේ ලිය, අරණ්‍ය නමැති කාන්තාතොමෝ; මල් මුවෙනි, පුෂ්ප නමැති මුඛයෙන්; සිනාගත්, හාස්‍ය ග්‍රහණය කළා.

134. නිසයුරු, චන්ද්‍රයා; හැමගනඳුරු, සකල ඝනාන්ධකාරය; බොන වරැ, පානය කරන්නාවූ කාලයෙහි; ගත, ශරීරය; පහන් බැවින්, ප්‍රසන්න භාවයෙන්; පිටතට, (චන්ද්‍රමණ්ඩලයෙන්) බාහිරයට; සසලෙසින් වත, ශශක විලාසයෙන් යුක්තවූ කල්හි; පුල්නිලුපුල්, ප්‍රඵුල්ලනීලොත්පලය බඳුවූ; පැහැ, වර්ණයෙන්; දිමුත, දීප්තිමත්වූ; යවුවන කතක, තරුණකාන්තාව කගේ; වුවනත, වක්ත්‍රය; කලදෙකැටපතෙක, කලධෞත දර්පණයෙක්හි; (රිදී කැඩපතක) දිසිවැනි, දෘශ්‍යමාන වන්නාක් මෙනි.

135. වි සේ ස වන සරතුළැ එවෙනැ වනප සේ
තො සේ බමරවැල හෙන පුල් කුමුදු දෙ සේ
ල සේ නොවැ ගුවනඳුරු බිඳුතු සේර සේ
දි සේ එයින් විසිරෙන අඳුරු බිඳුලෙ සේ

136. ම ල වල වරල් යුතු සඳුනෙන් සිහිල් ග තුන්
ම ල වියකෙළියැ පැලඹෙන මොළ සලෙලකතු
ගෙ ල රැව් අසා හඬයයි සිය පරෙවි ක තුන්
ක ල රැව් ගොසින් නොරුවට පහර පියප තුන්

137. ලියවෙස් උපුල්මල් තමසුත් දද ගති නි
පිරිහුණු කෙරෙති ඉන් එම පැහැ පත් ගති නී
දකැ ලිය පරෙවිඳිනැසට වර රති සෙයි නී
ලොබ නොමකොට එහි නිදිගෙනැ රිසි ලෙසිනී

---

135. එවෙනැවනපසේ, ඒ (වැල්ලේ මඩම) සමීපාරණ්‍ය පාශ්වියෙහි; විසේසවන, විශිෂ්ටවූ; සරතුළැ, තඩාගාභ්‍යන්තරයෙහි; පුල්, පිපුණාවූ; කුමුදු දෙසේ, කෞමද දිශාවට; තොසේ, සන්තොෂයෙන්; හෙන, පතිත වන්නාවූ; බමරවැල, භෘඞ්ගාවලිතොමෝ; සේරුසේ, චන්‍ද්‍රයා; ගුවන, ආකාශයෙහි; අඳුරු, අන්ධකාරය; ලසේනොව, අනාලස්‍යව; බිඳුතු, භග්න කරනකල්හි, එයින්, ඒ අන්ධකාරයෙන්; විසිරෙන, විසතිණී වන්නාවූ; අඳුරුබිඳු ලෙසේ, අන්ධකාර බින්දු පරිද්දෙන්; දිසේ, දෘශ්‍යමානවනු ලබන්නිය.

136. මලවල, පුෂ්පාකුලවූ; වරල් යුතු, ධම්මිල්ලයෙන් යුක්තවූ; සඳුනෙන්, චන්දනයෙන්; සිහිල් ගතුන්, ශීතල ශරීරයන් ඇත්තාවූ; මලවිය කෙළියැ, අනඞ්ග ක්‍රීඩාවෙහි; පැලඹෙන, විජෘම්භමානවන්නාවූ; මොළ, වණ්ඩවූ; සලෙල කතුන්, සල්ලාල කාන්තාවන්ගේ; ගෙලරැව්, ග්‍රීවාරාවය; අසා, ශ්‍රවනය කොට; සියපරෙවි කතුන්, ස්‍වකීපාරාපත කාන්තාවන්ගේ; හඬයයි, ශබ්දය කියා; ගොසින්, ගමනයකොට; නොරුවට, රුවටෙන්නේ නැතිව; කලරැව්, පාරාපතය; පියපතුන්, පක්‍ෂපත්‍රයන්; පහර, ප්‍රහාරණය කරව.

137. උපුල් මල්, උත්පල පුෂ්පයෝ; තම, තමන්ගේ; සුත්, ශෝවන (භාව) ය; දද, ධාරණය කරන්නාවූ; ගතිනී, ශරීරයෙන්; ලිය * වෙස්, ස්ත්‍රීවෙෂයට; පිරිහුණු කෙරෙහි, පරිහානි කෙරෙත්; ඉන්, ඒ කාරණයෙන්; එම පැහැ, ඒ උත්පල වර්ණයට ම; පත්, පැමිණියාවූ; ගතිනි, ශරීර

---

* වෙස් යනු-සැරසීම් ආදියෙන්වූ රූපාන්තරයයි.

138. වි ඳ මුළු රෑ රතිසැප සමඟන් දියු ණු
ම ඳ නගනේ අඟනන් ඇඟෑ සත් සිඳු ණු
ම ඳ පවනින් මලිගිය රෙන් සුණු වැකු ණු
සෙ ද දිලිහිණී යලි පෙරඑ නැගුමට අරු ණු

139. වෙත වන පහළ නදකොලහළිනි දද රෑ සින්
න ඳ ව න මුහුනු යුතු හැමදිගඟනන් වි සින්
බ බ ල න කිරණ දිගුලනු බැඳෑ නොයෙකදෙසි
ගොඩලන රණ සැළෙව් දිවයුරු සයුරකු සින්

140. ප සි ඳු රම සන්දර වෙසිඳුගෙ නම් න
ගණිඳු විමනෑ අලුයම්බෙර ගන ගොසි න
පු බු දු දෙමල කිවි මියුරන් සහ තොසි න
සිනි ඳු කොකා නදවත් තියු ගී කිය න

යෙන් යුක්තව; ඉඳිනා, නිසීදනය කරන්නාවූ; පරෙවි ලිය, පාරාපත කාන්තාවන්; දුකෑ, දර්ශනය කොට; ඇසට, අක්ෂියට; වර, උතුම්වූ; රතිසෙයිනී, ආලයක් සෙයින්; ලොබනොම කොට, ලොභය නොකොටම; එහි, ඒස්ථානයෙහි; රිසි ලෙසිනි, ඊප්සාපරිද්දෙන්; නිදිගෙනෑ, නිද්‍රාග්‍රහණය කොට.

138. මුළුරෑ, සම්පූර්ණ රාත්‍රියෙහි; සමඟන් රති සැප, සාමග්‍රී රතිසෞඛ්‍යය; දියුණු, වැඩුණාව; විඳ, වින්දනය කොට; නේ, අනෙකවූ; අඟනන්, ස්ත්‍රීන්ගේ; ඇඟෑ, ශරීරයෙහි; සන්සිඳුණු, සන්සිඳුනාවූ; මදනාග, කාමාග්නිය; මලිගිය රෙන්සුණු, මාලතී (පුෂ්ප) රේණුචූර්ණයෙහි; වැකුණු, තැවරුණාවූ; මඳපවනින්, මන්ද මාරුතය කරණකොටගෙන; අරුණු නැගුමට අරුණෝද්ගමනයට; පෙරඑ, පූර්වයෙහි; යලි, නැවත; සෙද, ශීඝ්‍රව; දිලිහිණී, ජ්වලිතවනු ලැබී.

139. වෙත වන, සමීප වනයෙහි; දද රෑසින්, පක්ෂි සමූහයා කරණකොටගෙන; පහළ, පහළවූ; නද කොලහළිනි, නාදකොලාහලයෙන්; නඳවන, සන්තොෂ වන්නාවූ; මුහුනු යුතු, මුඛවලින් යුක්තවූ; හැමදිඟු, සකල දිශා නමැති; අඟනන් විසින්, කාන්තාවන් විසින්; බබලනා, භ්‍රාජමාන වන්නාවූ; කිරණ, (සූර්ය) රශ්මි නමැති; දිගුලනු, දීර්ඝ රජ්ජු; නොයෙක දෙසින්, අනෙක දිශාවෙන්; බැඳෑ, බන්ධනයකොට; දිවයුරු, සූර්යයා; සයුර කුසින්, සාගර කුක්ෂියෙන්; ගොඩලන, ස්ථල ප්‍රාප්තකරන්නාවූ; රණසැළෙව්, හෙමවාර්ය (රන්බඳුන) ක් මෙනි.

140. පසිඳු, ප්‍රසිද්ධවූ; රමසන්දර වෙසිඳුගෙ, රාමචන්ද්‍ර නම් වෛශ්‍යෙන්ද්‍රයාගේ; නම්න, නාමයෙන්; ගණිඳු, ගණෙශ්වරයාගේ; විමනෑ, විමානයෙහි; අලුයම්බෙර, ප්‍රාතඃකාල භෙරි (නාද) නමැති; ගනගොසින, මෙඝ

141. පෙ ර දිගු සර සැපත් දිවයුරු රන් තිස ර
ත ර සර තුඩින් ගනඳර සෙවෙල දනව ර
ඇ ර නෙතැ නින්ද නැඟිසිට මිතුරිඳු එව ර
ව ර මුනි ගුණය සිහිකරැ වඩන මගතු ර

142. වඩුතුපුල්සුරරද—සයුරතිනෙදිනැ මිහික ත
ලූපියවිලිය සිරිගත්—යාගත් මඟුල්වැල්ලෙ න්

143. සඳන වෙනේ කිසල කැනේ සසල කො ට
ම ල ය ගි නේ ම ඳ ප ව නේ එන වෙත ට
සි හි ල සි නේ දුහැ ගි ම නේ සෙමෙන්සි ට
නු බ ව ද නේ පළමු වෙ නේ වෙහෙරත ට

---

ඝොෂාවෙන්; පුබුදු, ප්‍රබොධවූ; දෙමළකිවි, ද්‍රවිඩකාව්‍යකාර නමැති; මියුරන්, මයූරයන් විසින්; සහතොසින, තොෂ සහිතව; සිනිදු, සනිග්ධ වූ; කෙකානදවන්, කෙකාධ්වනිය වැනිවූ; තියුගී, සත්‍යගීතිකාවන්; කියන, කථනය කරන්නාවූ;

141. පෙරදිගුසර, පූර්වදිශා නමැති තඩාගයට; සැපත්, සම්ප්‍රාප්තවූ; දිවයුරු රන්තිසර, සූය්‍යීනමැති සුවණීහංසයා; තරසර තුඩින්, සාරරශ්මි නමැති තුණ්ඩයෙන්; ගනඳරසෙවෙල්, ඝනාන්ධකාර නමැති ශෛවාලය; අදනවර, භක්ෂණය (කෑම) කරන්නාවූ කාලයෙහි; නෙතැ, නෙත්‍රයෙහි; නින්ද, නිද්‍රාව; ඇර, පහකොට; නැගිසිට, නැගිට සිට; මිතුරිඳු, මිත්‍රානන්දමය; එවර, තත්කාලයෙහි; වරමුණිගුණය, උත්තම සර්‍වඥගුණය; සිහිකරැ, සමරණය කොට; මගතුර, මාගිාන්තරයෙහි; වඩන, ගමනය කරන්න.

142. උපුල් සුරරද, උත්පලවණී දිව්‍යරාජයා; සයුරතින්, සාගරාන්තරයෙන්; වඩුතු, වඩිනකල්හි; මිහිකත, මහිකාන්තාව විසින්; එදිනැ, ඒදවසෙහි; ලූ, ලනලද්දාවූ; පියවිලිය, පාදපට (පාවාඩ) යාගේ; සිරි, ශොභාව; ගත්, ග්‍රහණය කළාවූ; මඟුල්වැල්ලෙන්, එනම්වූ වාලුකා ප්‍රදෙශයෙන්; යාගත්, යාත්‍රාග්‍රහණය කර.

143. සඳනවෙනේ, චන්දනවනයෙහි; කිසලකැනේ, පල්ලවසමූහය; සසලකොට, චචල කොට; මලයගිනේ, මලය පර්වතයෙන්; වෙතට, සමීපයට; එන, ආගමනය කරන්නාවූ; මඳපවනේ, මන්දමාරුතයාගේ; සිහිල සිනේ, ශීතලයෙන්; ගිමනේ, ග්‍රීෂ්මයෙන්; දුහැ, දුරුකොට; සෙමෙන්සිට, අනුගිනව සිට; නුබ, යුෂමත්නු; පළමුවෙනේ, ප්‍රථමයෙන්; වෙහෙරතට, විහාරාභ්‍යන්තරයට; වදනේ, ප්‍රවෙශ වන්න.

144. ඇමද සිතු පැහැද වඳින ලොවැදු රූ
මුනිඳ පෙර සළුද ඩැඩු සැඇසු රූ
සුබද ලෙස සුසද ඇඳි සිතුරු තු රූ
වටද ගෙය තුළද ගැබ වඳු මිතු රූ

145. ගුණබෝ මුනිරජුට මුළු තුන්ලෝ කිරුළු
පෙර ලෝඇදුරු පුදනුව බැරම ලොවින ළු
කලදේ යටග බඳ නිල්මිණි සත එක ළු
වැඳැ බෝදුමිඳු මොක්පුර සිරි ලබ යහ ළු

146. සූ වි සි අසෙකි සතලා අමනිවන්පු රා
සැ සි සි මුනිඳු සැපසේ සැතපුණු අයු රා
පැ දි සි රිවි කිරණ ගැ විලස මනහ රා
තෝනිසි ලෙසින් වඳු ඔත්පිළිම හිමිව රා

---

144. ලොවැදුරු,බ්‍රහ්මයාවිසින්; ඇමද,සැමදවස්හි; සිතුපැහැද,චිත්ත ප්‍රසාදනව; වඳින, නමස්කාර කරන්නාවූ; මුනිඳ, මුනීන්ද්‍රයාගේ; පෙර, පූර්වයෙහි; සළුදවැඩු, සාටකධාතු නිදන් කළාවූ; සැ අයුරු, චෛත්‍ය; ආකාරවූ; සුබදලෙස, කල්‍යාණදායකපරිද්දෙන්; සුසද, සුසජ්ජිතකොට; ඇඳි, අජනය කරනලද්දාවු; උතුරු, අතිසුන්දරවූ; සිතුරු, චිත්‍රකර්මාන්ත ඇත්තාවූ; වටදගෙයතුළ, වටදාගේ ඇතුළෙහි; දගැබ, ධාතුගර්භය; මිතුරු, මිත්‍රය; වඳු, නමස්කාර කරව.

145. මුළුතුන්ලෝ, සමස්ත ත්‍රිවිධලොකයාගේ; කිරුළු, කිරීටයවූ; ගුණබෝ, බහුලගුණ ඇත්තාවූ; මුනිරජුට, සර්වඥරාජයාහට; පුදනුව, පූජාක රනුපිණිස; පෙර, පූර්වයෙහි; ලෝඇදුරු, බ්‍රහ්මයාවිසින්; බැරමලොවින්, බ්‍රහ්මලෝකයෙන්; අළු, එළවූවාවූ ගෙනාවාවූ; කලදේයටග, කලධෞතයෂ්ට්‍යග්‍රයෙහි; බඳ, බන්ධනය කරනලද්දාවූ; නිල්මිණිසත, (ඉන්ද්‍ර) නීල මාණික්‍යඡත්‍රය හා; එකළු, එකාකාරවූ; බෝදුමිඳු, බොධිද්‍රුමේන්ද්‍රයා; වැඳැ, නමස්කාරකොට; මොක්පුර, මොක්ෂපුරයෙහි; සිරි, ඓශ්වර්‍ය්‍යය; යහළු, මිත්‍රය; ලබ, ලබාගනුව.

146. සූවිසි අසෙකිසත, චතුර්විංශත්‍යසංඛ්‍ය සත්වයා; අම නිවන්පුරා, අමෘත මහානිර්වාණ පුරයෙහි; ලා, ප්‍රක්ෂෙපකොට; සැසිසි මුනිඳු, ශාක්‍ය සිංහසෑශිවූ මුනීන්ද්‍රයා; සැපසේ, සැපවූ පරිද්දෙන්; සැතපුණු අයුරා, සන්තර්පිත ආකාරවූ; රිවිකිරණ, සූර්‍ය්‍යරශ්මිය; ගැවිලස, ආලිම්පනය කළ පරිද්දෙන්; මනහරා, මනොඥවූ; පැ, ප්‍රභාව; දිසි, දෘශ්‍යමානවූ, ඔත්පිළිම හිමිවරා, ශයන ප්‍රතිමා ස්වාමීන්ද්‍රයා; තෝ, ප්‍රසමත්හු; නිසිලෙසින්, යොග්‍ය පරිද්දෙන්, වඳු, වන්දනය කරව.

147. සැඬලෙටි මරු පැරයූ ඉඳැ බෝතුරු ල  ගෙහි
දි ඬ දි ටි රුවෙල් කසුබන් ලූ අටම  ගෙහි
මැඬ පැ ටි කරන දිටුපවඳුර සතන  ගෙහි
වැ ඩ සි ටි පිළිම හිමි වඳු සිටිපිළිම  ගෙහි

148. ස ල තුරු වැඹින් සුලකළ තුන් මහල්යෙ  ඳු
නි ල තුරු කිකිණි බඳ රන්දද පෙළසුසැ  ඳු
දු ල තුරු වැලෙව් පළගෙහි මුතු ලැල් සිනි  ඳු
ග ල තුරු මුලපායෙහි මහසඟන ව  ඳු

149. දු ල සක් වන් පිරිසුදු සිව් සිල්සො  ඳු රු
න ල සක් වන් බිඳි මිසදිටු තුරුප  ඳු රු
ස ල සක් මන් තරකර විසු තෙරනැ  ඳු රු
බ ල සක් මන් රත්පත්සුලුපා මැ  ඳු රු

---

147. බෝතුරුලගෙහි, බොධිවෘක්ෂාසනනයෙහි; ඉඳැ, නිසද්‍යකොට; සැඬලෙටි, චණ්ඩලීලා ඇත්තාවූ; මරු, මාරයා; පැරයූ, පරාජය කළාවූ; දිඬදිටි, දෘඪ දෘෂ්ටිඇත්තාවූ; උරුවෙල් කසුබන්, උරුවෙලකාශ්‍යපාදීන්; අටමගෙහි, අෂ්ටාඞ්ගිකමාර්ගයෙහි; ලූ, ප්‍රක්ෂෙප කළාවූ; සතන, සන්තාන නමැති; ගෙහි, ගෘහයෙහි; දිටුපව්, (මිථ්‍යා)දෘෂ්ටිපාප නමැති; අඳුරු, අන්ධකාරය; මැඬ, මර්දනය කොට; පැටිකරන, ලපටි කරන්නාවූ; සිටිපිළිම ගෙහි, සිටිපිළිම නම්වූ ගෘහයෙහි; වැඩසිටි, වැඩසිටින්නාවූ; පිළිමහිමි, ප්‍රතිමා ස්වාමීන්වහන්සේ; වඳු, නමස්කාර කරව.

148. සල, ශෛලමයවූ; * තුරු, මහත්වූ; වැඹින්, ස්තම්භයෙන්; සුල කළ, අත්‍යලඞ්කෘතවූ; යෙඳු, යොජිතවූ; තුන්මහල්, ත්‍රිභූමකවූ; කිකිණි, කිඞ්කිණීකයන්; බඳ, බන්ධනය කරනලද්දාවූ; රන්දදපෙළ, ස්වර්ණධ්වජ පාලියෙන්; නිලතුරු, නිරන්තරව; සුසැඳු, මනාවසජ්ජිතකළාවූ; දුල, දිලියෙන්නාවූ; තුරුවැලෙව්, තාරකාපාලිය මෙන්; පළගෙහි, ඡදනාග්‍රයෙහි; සිනිඳු, ස්නිග්ධවූ; මුතුලැල්, මුක්තාලතිකාවන් ඇත්තාවූ; ගලතුරු මුලපායෙහි, එනම්වූ ප්‍රාසාදයෙහි; මහසඟන, මහාසංඝයා; වඳු, නමස්කාර කරව.

149. දුල, දිලියෙන්නාවූ; සක්වන්, ශඞ්ඛය මෙන්; පිරිසුදු, පරිශුද්ධවූ; සිව්සිල්, † චතුර්විධ ශීලයෙන්; සොඳුරු, සුන්දරවූ; මිසදිටු, මිථ්‍යාදෘෂ්ටි නමැති; තුරුපඳුරු, වෘක්ෂගුල්මයන්; බිඳි, භග්නකළාවූ; නලසක්වන්, මාරුත චක්‍රය වැනිවූ; තෙරනැඳුරු, ස්ථවිරාචාර්යයන් විසින්; අසල, ආශ්‍රය කරනලද්දාවූ, සක්මන්, චඞ්ක්‍රමණය; (සක්මන්කිරීම්) තරකරු, ස්ථිර කොට; විසු, වාසය කරනලද්දාවූ; සක්මන්, චඞ්ක්‍රමණය හා; රත්පත් සුළුපා, එනම්වූ; මැඳුරු, මන්දිරයද; බල, අවලොකනය කර.

---

* තර කිවමනාතන්හී "තුරු"යි එළිසමකිරීම් වශයෙන් පිළිපෙරළිකරනලදි.

† ප්‍රාතිමොක්ෂ සංවරශීලය, ඉන්ද්‍රිය සංවරශීලය, ආජීවපාරිශුද්ධිශීලය, ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය, යනු චතුර්විධ ශීලයයි.

150. හ ර සු ර පෙතැලිරූ කැටයම් කල පි ඬු ව
ත ර ස ර ලකළ නිල්මිණි ටැඹිනි සමු ඬු ව
පු ර ඳ ර සබාසුරූ දූකැ මහවත් ම ඬු ව
පු ර ව ර බලා එනලෙස පරෙවිනි ව ඬු ව

151. සිරිවස් ලකුණු රැඳි–දෙරවත් පුරෙව් හොබ නා
එසුරිඳු පුරවැනුම් නව–පඬුරූකර පත්නාත ට

152. සතකුම්යුතු පහමතු කැරළි කෙළව ර
පිහිටි පියුම්රා රුවනින් කැලුම්බ ර
රත්පැහැගත් සිසි වුවනට ලිය නෙත ර
පැරදූ අවර රිවි වෙස් ගත් එව් එව ර

---

150. හරසුර, ඊශ්වරදෙවයාගේ; පෙතැලිරූ, පෙතැලිවූ රූපයන්; පිඬුව, සමූහව; කැටයම් කළ, කැටයම් කරන ලද්දාවූ; තරසර, රශ්මියෙන් සාරවූ; ලකළ, අලඞ්කෘතවූ; නිල්මිණි ටැඹිනි, (ඉන්ද්‍ර) නීලමාණික්‍යස්තම්භයෙන්; සමුඬුව, සමුඬිවූ; පුරඳර සබාසුරූ, ශක්‍රයාගේ (සුධර්මානම් දිව්‍ය) සභාව ආකාරවූ; මහවත්මඬුව, මහවත් නම්වූ මඬුව; දූකැ, දර්ශනය කොට; පරෙවිනි, පාරාපතයිනි; පුරවර, පුරප්‍රවරය; බලාඑනලෙස, නාරඹා එනපරිද්දෙන්; වඬුව, ගමනය කරව.

151. සිරිවස්ලකුණු, * ශ්‍රීවත්සලාංඡනයා (විෂ්ණු) විසින්; රැඳි, රජමානවූ; දෙරවත්පුරෙව්, ද්වාරවතී නගරය මෙන්; හොබනා, ශොභමානවූ; එසුරිඳු, ඒසුරෙන්ද්‍රයාගේ; පුරවැනුම්, නගරවර්ණනා නමැති; නවපඬුරූ, අභිනව ප්‍රාභෘතයන්; (නැති) නා, යුෂ්මත්හුගේ; අනට පත් කර, හස්ත ප්‍රාප්තකරව.

152. පහමතු, (නගර) ප්‍රාසාදමස්තකයෙහි; සතකුම්යුතු, ශතකුම්භ (ස්වර්ණ) යෙන් යුක්තවූ; කැරළි කෙළවර, ශෘඞ්ග (කොත්) මස්තකයෙහි; පිහිටි, පිහිටියාවූ; කැලුම්බර, කාන්තිසමූහය ඇත්තාවූ; පියුම්රා රුවනින්, පද්මරාග මාණික්‍යයන් කාරණකොටගෙන; රත්පැහැ, රක්තවර්ණය; ගත්, ග්‍රහණය කළාවූ; සිසි, චන්ද්‍රතෙමේ; එපුර, ඒ නගරයෙහි; ලියන්, ස්ත්‍රීන්ගේ; වුවනට, වක්ත්‍රයට; පැරදූ, පරාජිතව; එනර, තත්කාලයෙහි; අවර, අපර; (පර්වතයටපැමිණි) පවර, උතුම්වූ; රිවි, සූර්‍ය්‍යයාගේ; වෙස්, වෙශය; ගත්එව්, ග්‍රහණය කළාක් මෙනි.

---

* ශ්‍රී කාන්තානුකත වක්ෂස්ථලයෙහි කරකැවුණු රෝමලක්ෂණයක් පිහිටිහෙයින් විෂ්ණුහට ශ්‍රීවත්සලාංඡනයයි නමෙකි. හරිවංශයෙහි–"ශ්‍රීවත්සෙනොරසි ශ්‍රීමාන් රෙම ජාතෙන රජතා" යි වර්ණිතයි.

153. එපුරඹ දද අතින් සන්කරැ නොවී ල       ස
බඳ රසුනද මහසි බැණැ ඇසෙන ලෙ       ස
තොප රිසිවක් ඇරගනුවගි සුරන් රැ       ස
වෙත කැඳවා රවටන වැනි ඇමදව       ස

154. ප හ මි ණි බිතු තුළැ මත වතග       සේයා
සපැ මි ණි බිගු නොනැලෙනු නම් කෙ       සේයා
පි රි හි ණි මල්දුනු දුනුදිය රැ       සේයා
සැර හි ණි ඉන් නෙතඟිනි මියුලැ       සේයා

155. වෙසෙසක් එකම ගෙනැ අහසින් යන විත       ර
අ ප ස ක් හමුව යව්දූයි මතුයෙන් නිත       ර
ස හ ස ක් වෙමින් එහි අස්පෙළ කුර රෙණැ       ර
දි ය ස ක් තුරඟ නොපැනෙන ලෙස වැසූ යු       ර

---

153. එපුර, ඒ නගර නමැති; අඹ, වනිතාව; අලස නොවී, අනාලස්‍යව; දද, ධවජ නමැති; අතින්, හස්තයෙන්; සන්කරැ, සංඥකොට; බඳ, බන්ධනය කරනලද්දාවූ; රසුනද, කිඞ්කිණික නාද නමැති; මහසී, මාසී (වචන) ය; ඇසෙනලෙස, ඇසෙන පරිද්දෙන්; බැණැ, කථනය කොට; තොප, යුෂ්මතුන්ට; රිසිවක්, ඊප්සිත දෙයක්; ඇරගනුවසී, හැරගනුව කියා; සුරන්රැස, දෙවසමූහයා; වෙත, සමීපයට, කැඳවා, ආමන්ත්‍රණය කොට; ඇමදවස, සැමදවස්හි; රවටන වැනි, රවටන්නාක් මෙනි.

154 පන, ප්‍රාසාදයන්ගේ; මිණිබිතුතුළෑ, මාණික්‍ය භිත්ති අභ්‍යන්තරයෙන්; මත මතඟ, මත්ත මාතඞ්ගය (මත්ඇතු) න්ගේ; සේයා, ඡායාවට; සපැමිණී, සම්ප්‍රාප්තවූ; බිගු, භෘඞ්ගයන් නොනැලෙනුනම් කෙසේයා, නාධනය නොවීම නම් කෙසේද (නැළීම වේ මය); මල්දුනු, අනඞ්ගයාගේ; දුනුදිය රැසේයා, ධනුජ්‍යා (දුනුදිය) රශ්මිය; පිරිහිණි, පරිහාණි විය; ඉන්, ඒ කාරණයෙන්; මියුලැසේයා, කාන්තාවන්ගේ; නෙතඟිනි, නයනාග්‍රයෙන්; සැරහිණි, (ඊ) ශරපතිත වී.

155. අහසින්, ආකාශයෙන්; යන විතර, ගමනය කරන්නාවූ ප්‍රමාණයක; එකම වෙසෙසක්, එකම විශෙෂය (වෙනස) ක්, ගෙනැ, ග්‍රහණය කොට; අපසක් හමුව, අපගේ චක්ෂුස්සම්මුඛයෙහි; මතුයෙන්, මස්තකයෙන්; නිතර, අනාවරනයෙන්; යව්දූයි, ගමනය කරව්දූයි; සහසක් වෙමින්, සාහසික (කෲර) වෙමින්; එහි, ඒ නගරයෙහි; අස්පෙළ, අශ්ව පඞ්ක්තිය; කුරරෙණැර, ක්ෂුරරේණූන් (ධූලි) පහකොට; දියසක්, සූර්‍ය්‍යයාගේ; තුරඟ, අශ්වයන්; නොපැනෙන ලෙස, දෘශ්‍යමාන නොවන පරිද්දෙන්; වැසූපුර, ඡාදනය කළාක් මෙනි.

156. එ පු ර ලිය සරල් දිගු නිල් වරල් ව ලේ
ත ඹ ර වුවන් මඳහස පණැදූ මනක ලේ
ස ම ර සරන සලෙළුන් සිත් මියුල් කැ ලේ
නොහැර විදූ ඇවිද සැර පසිනි ඇමක ලේ

157. අකුසු පහර බියනෙව් ගජකුඹු රුවැ ති
එපුර කතුන් තුඟු පියයුරු විලස් ග ති
එහි ද දුතනු තද නියකුසු පහරදෙ ති
උඩ ගු තද ගුණන්හට සැප කොතන ඇ ති

158. ම න් ස න් තොස වඩන එනුවරෙහි වේමැ ද
තැන් තැන් සුසැදි සල්පිල් නවමිණි මෙර ද
අ න් බ න් සේ වතෙහි වෙත පත දනන් වැ ද
න න් ව න් ගුජර පටසළු සිරි රැපැයි සො ද

---

156. එපුර, ඒ නගරයෙහි; ලිය, ස්ත්‍රීන්ගේ; සරල්, රැලි සහිතවූ; දිගු, දීර්ඝවූ; නිල්, නීලවර්ණවූ; වරල්, ධම්මිල්ල නාමැති; වලේ, වනයෙහි; තඹර, තාම්‍රරස වැනිවූ; වුවන්, වක්ත්‍රයෙහි; මනකලේ, මනොඥවූ; මඳහස, මන්දහාස්‍ය නාමැති; පණැදූ, ප්‍රත්‍යාකර්ෂණය කොට; (පත්ඇද) සමර, අනඞ්ග තෙම; සරන, හැසිරෙන්නාවූ; සලෙළුන්, සල්ලාලයන්ගේ; සිත්, චිත්ත නාමැති; මියුල් කැලේ, මෘගසමූහයා; සැරපසිනි, පංචබාණයෙන්; ඇමකලේ, සෑම කල්හි; නොහැර, පසනොකොට; විදූ, විද්ධනය කොට; ඇවිද, ආහිණ්ඩනය කරයි.

157. රුවැති, ලක්ෂණාන්විතවූ; ගජකුඹු, හස්ත්‍යකුම්භ තෙමේ; අකුසු පහර, අඞ්කුශප්‍රහාරයට; බියෙනෙව්, භින්නයන් මෙන්; එපුර, ඒනගරයෙහි; කතුන්, ස්ත්‍රීන්ගේ; තුඟු, උස්වූ; පියයුරු විලස්, පයෝධර විලාශය; ගති, ගන්නේය; දුතනු, (ස්ත්‍රී) ධූර්තීයෝ; එහිද, ඒ පයෝධරයෙහිද; තද, ඝනබව; නියකුසු පහර, නඛාඞ්කුශ ප්‍රහාරය; දෙති, දානය කෙරෙත්; (එහෙයින්) උඩගු, උඩගත (විනාශ ඇත්තා)වූ; තද ගුණන්හට, දෘඪ ගුණාන්විතයන්ට; සැප, සෞඛ්‍යය; කොතන ඇති, කවර නම්වූ ස්ථානයක ඇත්තේද (නැත්තේමය.)

158. මන් සන්තොස, චිත්ත සන්තෝෂය; වඩන, වර්ධනය කරන්නාවූ; එනුවරෙහි, ඒ නගරයෙහි; වේමැද, වීථි මධ්‍යයෙහි; තැන් තැන්, තන්හි තන්හි; සුසැදි, මොනවට සජ්ජිතවූ; සල්පිල්, ආපණශාලාවන්හි; නව, නව විධවූ; මිණි මෙරද, මාණික්‍ය මරීචිය; (මැණික් රශ්මිය) වැද, ප්‍රවිෂ්ටව; එති, එනන්ති; වෙත, සමීපයට; පත, පැමිණියාවූ; දනන්, සැබ්‍යන්විසින්; අන්, අඳින ලද්දාවූද; බත්, බඳින ලද්දාවූද; සේවන්, ශ්වෙතවස්ත්‍ර; සොඳ, සුන්දරවූ; නන්වන්, නානාවර්ණවූ; ගුජර පටසළු, ගුජ්ජර පට්ට සාටකයන්ගේ; සිරි, ශොභාව; රැපැයි, ගෙනහැර දක්වී.

159. දෙ ප ස එපුර සුසැදුණු සැපතින් නොම ද
නිවෙ ස තුරින් නික්මුණු සුවඳ දුම්ක ඳ
ස ව ස නැගු පහන් පෑ තෙදිනි බියවැ ද
නොලස දිවන වැනි විය නිසඳුරු පබ ද

160. නු දු රු වැ නුබට සිරි වහසල් බිගිදෙරි නි
අ දු රු වැ නොදිසි සුරරද පහ මිණි රැසි නි
සොඳු රු වැ සැදුණු එනුවර දෙව්පුර නමි නි
අ ඳු රු වැ වනත අනතය දහසක් වති නි

161. මුනිව ර නරවරන් නිවෙසෙහි නිබඳ වැ ස
පුවත ර බැවින් තොප නොමබනු පසඟ ගො ස
දවසැ ර නුවර දැක්මෙන් තුරු පෙනෙත හ ස
මම්තු ර වැඩම කර දෙව් රජගෙට සතො ස

---

159. නොමඳ, අමන්දවූ; සැපතින්, සම්පත්තියෙන් යුක්තවූ; එපුර, ඒ නගරයෙහි; දෙපස, උභය (වීථි) පාර්ශ්වයෙහි; සුසැදුණු, සුසජ්ජිතවූ; නිවෙස තුරින්, නිවාසාභ්‍යන්තරයෙන්; නික්මුණු, නිෂ්ක්‍රමණයවූ; සුවඳ දුම්කඳ, සුගන්ධධූම ස්කන්ධය; සවස, සායාහ්නකාලයෙහි; නැගු, ආරොපණය කරනලද්දාවූ; පහන්, ප්‍රදීපයන්ගේ; පෑ තෙදිනි, ප්‍රභා තෙජස කරණකොටගෙන; බියවැද, භීති ප්‍රාප්තව; පබඳ, ප්‍රබන්ධවූ; නිසා අඳුර, රාත්‍රි අන්ධකාරය; නොලස, වහා; දිවනවැනි විය, දුවන්නාක්මෙන් වූයේය.

160. නුබට, ආකාශයට; නුදුරු'වැ, අවිදූරව; සිරි; සපිනවූ; වහසල්, වාසලෙහි; බිගිදෙරනි, බහිද්වාරයෙ (තොරණ) න් යුක්තවූ; සුරරද, (ජිෂ්ණු) දිව්‍ය රාජයාගේ; පහ, ප්‍රාසාදයෙහි; මිණිරැසිනි, මාණික්‍ය රශ්මි කරණ කොටගෙන; අඳුරුවැ, අන්ධකාරය; නොදිසි, අදෘශ්‍යමානවූ; දෙව්පුර නමිනි, දෙව්නුවර (දෙවුන්දර) යන නාමයෙන්; සොඳුරුවැ, සුන්දරව; සැදුණු, සජ්ජිතවූ; එනුවර, ඒ නගරය; අඳුරුවැ, තමස් (සහිත) ව; වනත, වර්ණනා කරත්හොත්; දහසක් වතිනි, සහස්‍ර වක්ත්‍රහෙයින්; අනතය, අනන්ත නම් නාගරාජයාය.

161. මුනිවර, මුනිවරයන්ගේද; නරවරන්, නරෙන්ද්‍රයන්ගේද; නිවෙසෙහි, නිවාසයෙහි; නිබඳ, නිරන්තරයෙන්; වැස, වාසයකොට; පුවතර බැවින්, ප්‍රසිද්ධ භාවයෙන්; තොප, යුෂ්මත් තෙම; පසඟ ගොස, පඤ්චාඞ්ගික (තූර්‍ය්‍ය) ඝොෂාවට; නොමබනු, බිය නොවන්නේ මය; (එහෙයින්) නුවර, නගරය; දැක්මෙන්, දර්ශනය කිරීමෙන්; දවසැර, දිවා භාගය අතික්‍රාන්ත කොට; අහස, ආකාශයෙහි; තුරු, තාරකාවන්; පෙනෙන, දෘශ්‍යමාන වනකල්හි; මම්තුර, මාගේ මිත්‍රය; දෙව් රජගෙට, දෙවරාජ ගෘහයට; සතොස, සන්තොෂයෙන්; වැඩම කර, ප්‍රයාණය කරව.

162. ම ල වල මුහුඵ බැඳගෙනැ විලවුන් සරඟ
පැල දි මිණි බරණ මල් වැල සඟ සරඟ
සු ල කුඵ මෙවන් නඵ නලඟන කැන් සරඟ
බ ල රඟ මඩල පරෙවිඳු සඳ පැහැ සරඟ

163. තු රු නා අබරණ දිනයෙහි රඟ නා
ග ව නා නදිහට පුදකළ ලෙසි නා
මි ණි නා බඳ බිමැ ඉසි පුල් මලි නා
ය මු නා ගඟැ පෙණ සිරිසිලි සොබ නා

164. මු තු වැ ළ සුලකල තන යුග එක ලා
හ ස වැ ළ වැනි බිසකුරු ගත් නිව ලා
නුරු වැ ළ නිල්මිණි යුග දුළ පතු ලා
බි ගු වැ ළ වට කළ වැනි රතකම ලා

---

162. මලවල, පුෂ්පාකුලවූ; මුහුඵ, ධම්මිල්ලය; බැඳගෙනැ, බන්ධනග්‍රහණයකොට; අඟ, ශරීරය; විලවුන්, විලෙපනයෙන්; සරා, සජ්ජිතකොට; සරඟමල්වැලසඟ, ශෘඞ්ගාර පුෂ්පාවලිය සමග; මිණිබරණ, මාණික්‍යාභරණයන්; පැලඳී, පිලන්ධනය කොට; මෙවන්, මෙසේ; සුලකුඵ, අත්‍යලඞ්කෘතවූ; සරඟ, නෘත්‍යසහිතවූ; නඵනාලඟන කැන්, නාටක නාටිකාඞ්ගනා සමූහයා ඇත්තාවූ; රඟමඩල, නෘත්‍යමණ්ඩලය; අඟපැහැ, ශරීර වර්‍ණයෙන්; සර, සාරවූ; පරෙවිඳු සඳ, පාරාපතෙන්ද්‍රය; බල, අවලොකනයකර.

163. තුරුනා අබරණ, චන්ද්‍රාභරණයා හෙවත් ඊශ්වරයා; රඟනාදිනයෙහි, නෘත්‍ය කරන්නාවූ දවස්හි; ගවනා නදිහට, ආකාශ ගංගාවට; පුදකළ ලෙසිනා, පූජාකළ පරිද්දෙන්; මිණිනා, මාණික්‍යයෙන්; බඳ, බන්ධනය කරන ලද්දාවූ බිමැ, භූමියෙහි; ඉසි, සිංචනය කළාවූ; පුල්මලිනා, ප්‍රඵුල්ල පුෂ්පයෙන්; යමුනාගඟැ, කාලින්දී නම්වූ ගංගාවෙහි; සොබනා, ශොභනාවූ; පෙණ, ඵේනමාලාවගේ; සිරි, ශොභාව; ඉසිලි, උද්වහනය කෙළේය.

164. එකලා, ඒ කාන්තාවගේ; මුතුවැල, මුක්තාවලියෙන්; සුලකළ, අත්‍යලඞ්කෘතවූ; තනයුග, පයොධර යුග්මය; නිවලා, නිර්මලවූ; බිසකුරු, *බිසාඞ්කුරයන්; ගත්, ග්‍රහණය කළාවූ; හසවැල වැනි, හංසාවලිය වැනිය; නිල්මිණි, නීලමාණික්‍යයෙන් යුක්තවූ; නුරුවැල, නූපුරාවලියෙන්; දුළ, දිලිසෙන්නාවූ; යුගපතුලා, යුග්මපාදතලය; බිගුවැල, භෘඞ්ගාවලිය විසින්; වටකළ, පරික්ෂෙප කළාවූ; රතකමලාවැනි, රක්තපද්මය වැනි.

---

* "මෘණාලං බිසමබ්ජාදි කදම්බෙ ඛණ්ඩමස්ත්‍රියාම්" අමරකොශයි.

165. පියයුරු කිණිහිරි කැකුලෙක අ　　න් ද ම්
දසනග රැස් වැනි ගෙළෙ දූසම　　න් ද ම්
ලෙළවන කොමළත් පැහැසර ර　　න් ද ම්
අඟනන් දුට නොහිබේ තව සු　　න් ද ම්

166. සි ත් කලු විලසින් මඳලස ගමනි　　නි
යු ත් සෙවනලු නැනැ වැඩි මියුරන් වැ　　නි
ග ත් පැහැ නෙලෙනද ළා අඹ දලු වෙ　　නි
සි ත් තුටු වෙයි අඟනන් රඟ දැකුමෙ　　නි

167. ලෙ ළ දු න් නවතඹ පලුවන් පා　　දේ
ත බ මි න් නිවරදූ මද්දල නා　　දේ
ග ය මි න් පානා ගීතෙන් කි　　දේ
අ ඟ න න් රඟ දුටුවන් සිත් පැ　　දේ

---

165. කිණිහිරි කැකුලෙක, කර්ණිකාර කුඩ්මලයක; අන්දම්, ආකාරවූ; පියයුරු, පයොධර ඇත්තාවූ; ගෙළෙ, ග්‍රීවයෙහි; දූසමන් දම් වැනි, ජාති සුමනදාමය වැනිවූ; දසනගරැස්, දන්තාග්‍රරශ්මි ඇත්තාවූ; පැහැසර, ප්‍රභාසාරවූ; රන්දම්, සුවර්ණදාම්‍ය වැනිවූ; ලෙළවන, ලීලොපෙත කරවත් නාවූ; කොමළත්, කොමල හස්තයන් ඇත්තාවූ; අඟනන්, කාන්තාවන්; දුට, දර්ශනය කළහොත්; තවසුන්, තාපසයන්ගේ; දම්, (තපො) ධර්මය; නොහිබේ, ස්ථාපනය නොවේ.

166. සිත්කලු විලසින්, චිත්ත කාන්ත විලාසයෙන්ද; මඳලස ගමනිනි, මන්දාලස්‍ය ගමනයෙන්ද; සෙවනලු යුත්, ඡායාකුලයෙන් යුක්තවූ; නැනැ, ස්ථානයෙහි; වැඩි, වර්ධනයවූ; මියුරන් වැනි, මයුරයන් වැනිවූ; නෙළෙන්, මාරුතයන්; අද, ගැවසී ගත්තාවූ; ළා, තරුණවූ; අඹදලුවෙනි, ආම්‍රකිසලය වැනිවූ; ගත්පැහැ, ශරීර වර්ණ ඇත්තාවූ; අඟනන්, ස්ත්‍රීන්ගේ; රඟ, නෘත්‍යය; දැකුමෙනි, දර්ශනය කිරීමෙන්; සිත් තුටු වෙයි, චිත්ත සත් තොෂ වේ.

167. ලෙළදුන්, ලීලාදානය කළාවූ; නව තඹ පලුවන්, අභිනව තාම්‍ර පල්ලවයන් වැනිවූ; පාදේ, පාදයන්; මද්දලනාදේ, මද්දල නාදයට; නිව රදූ, නිරවද්‍යකොට; තබමින්, ස්ථාපනය කෙරෙමින්; ගීතෙන් කිදේ, ගීතිකාවෙන් කීදෙය; ගයමින් පානා, ගායනා කෙරෙමින් පෙන්වන්නාවූ; අඟනන්, කාන්තාවන්ගේ; රඟ, නෘත්‍යය; දුටුවන්, දර්ශනය කළවුන්ගේ; සිත්, චිත්තය; පැදේ, ප්‍රසන්න වේ.

168. ල සි ත ලලිත විදුලි සේය
දි සි ත ලියන් නොකම සේය
ව සි ත කියන ගී ර සේය
තසි ත නොපටු වේ නො සේය

169. තරඟ අයුරු කොමල අ තේ
උර ග නවන් රුසිරු යු තේ
වර ග නරඟ දෙන දිමු තේ
නරඟ අවෙස වුවයි සි තේ

170. මුදුනෙන් බැමයු ව ළි න් දිගු නුවනින් ගෙල ප සි නි
යුග තින් රතැඟිලියෙන් උර තලයෙන් මැද දෙ සි නි
වටොරින් පුළුලුකුලෙ න් දඟ යුවළි න් පතු ල සි නි
රැඟුමෙන් කළ කරණින් සොඳඅඟනන් දකු නො සි නී

171. කිඳු රන් බස කොවුලන් නද පසුකරැ මියුරසි නේ
කිය මින් ගී ර ඟ මි න් සිටි අඟනක් සරතසි නේ
ලිහි ලින් වත ව ර ලි න් මුත දුන්සෝබිදු ගති නේ
නුව නින් රත මෙඇමින් රඟ සලෙලකුමෙන් තෙව් නේ

---

168. ලසින, බබලන ලද්දාවූ; ලලින, ලෙළදෙන ලද්දාවූ; විදුලිසේය, විද්‍යුල්ලතාවන් මෙන්; දිසින, දක්නා ලද්දාවූ; ලියන්, ස්ත්‍රීන් විසින්; නොකමසේය, අකුසීනව; වසිත, (සඬයන්) වසඟකරනලදුව; කියන, කථනය කරන්නාවූ; ගීරසේය, ගීතිකාරසයෙහි; තසින, තාගේ චිත්තය සම්බන්ධවූ; නොසේය, සනෙහාශ්‍රය; නොපටුවේ, පටුනොවෙයි; හෙවත් කුඩානොවේ.

169. තරඟඅයුරු, තරඞ්ගාකාරවූ; කොමලඅතේ, කොමල හස්තඇත්තාවූ; උරගනවන්, නාගාඞ්ගනාවන් මෙන්; රුසිරු යුතේ, රූපශ්‍රීන් යුක්තවූ; රඟදෙන, නෘත්‍යදානය කරන්නාවූ; දිමුතේ, දීප්තිමත්වූ; වරඟන, උත්තමාඞ්ගනාවන්ට; නරඟ, අනඞ්ගයා; අවෙස වුවයි, ආවෙශ වූයේයයි; සිතේ, චින්තනය වේ.

170. මුදුනෙන්, මස්තකයෙන්ද; බැමයුවළින්, භ්‍රෑයුග්මයෙන්ද; දිගු නුවනින්, දීර්ඝනෙත්‍රයෙන්ද; ගෙලපසිනි, ග්‍රීවාපාශ්වයෙන්ද; යුගතින්, යුග්ම හස්තයෙන්ද; රතැඟිලියෙන්, රක්තාඞ්ගුලියෙන්ද; උරතලයෙන්, උරස්ථලයෙන්ද; මැදදෙසිනි, මධ්‍ය ප්‍රදෙශයෙන්ද; වටොරින්, වෘත්තොරුවෙන්ද; පුළුලුකුලෙන්, පෘථුල ශ්‍රොණියෙන්ද; දඟයුවළින්, ජඞ්ඝායුගලයෙන්ද; පතුලසිනි, පාදතලයෙන්ද; (යන) කරණින්, ශරීර (ස්ථාන) යෙන්; කළ, කරනලද්දාවූ; රැඟුමෙන්, නෘත්‍යයෙන්; සොඳ, සුන්දරවූ; අඟනන්, කාන්තාවන්; නොසිනි, සනෙහාශයෙන්; දකු, දශීනය කරව.

171. කිඳුරන් බස, කින්නරයන්ගේ වචනයද; කොවුලන් නද, කොකිලයන්ගේ නාදයද; මියුරසිනේ, මධුර රසයෙන්; පසුකරැ, පරාජය කොට; ගී කියමින්, ගීතිකා කථනය කෙරෙමින්; රඟමින්, නෘත්‍ය කරමින්; සර

දෙහිරුන් තඹරන් ගෙනැරෙන් යනමෙන් කියමින් ගීතය වෙසෙ සේ
පද යෙන් පදයට තබමින් දෙපතුල සන්කරු රන්රසුනොල සේ
නළඹ න් අතුරෙන් අඟනක් රඟගත් විලසක් වෙසකරු සක සේ
සුර කැන් මැද්‍ද උන් සඟසක් අබියසැ උරුවෙස් රඟගත් විල සේ

173. ඇසින්හත් වසත්නත් වණින්යුත් කලූ න්නේ
රුවන් වන් ර ස න් දම් කැලුම්කැන් පෙනෙ න්නේ
ඔවු න් දුන් වෙ ගි න් ගත් සකක්මෙන් බව න්නේ
අ දුන් වන් ගුවන් වන් විදුන්වන් එතැ න්නේ

---

තසිතේ, ශ්‍රාන්තභාවයෙන්; ඝිවි, ස්ථානය කළාවූ; අඟනක්, කාන්තාවක්; ලිහිලින් වත, සිඹිල (බුරුල් වූ) වස්ත්‍රයෙන්ද; මුන වරලින්, මුක්ත (මිදුණු) ධම්මිල්ලයෙන්ද; දුන් සෝබිදු, ජනිත ස්වෙද (උපන්දහඩිය) බින්දු ඇත්තාවූ; ගතිනේ, ශරීරයෙන්ද; රතනුවනින්, රක්ත (වණි) නෙත්‍රයෙන්ද; මේ, උක්තප්‍රකාරවූ; රඟ ඇමින්, ආකාර සියල්ලෙන්; සලෙලකුමෙන්, සල්ලාලයෙකු පරිද්දෙන්; නෙව්නේ, විරාජමානවූවා.

172. දෙහිරුන්, විරෙඑය (මීමැස්ස)න් විසින්; තඹරන් තාමරසයන්ගේ; රෙන්ගෙනැ, රේණු ග්‍රහණය කොට; යනමෙන්, ගමනයකරන පරිද්දෙන්; වෙසෙසේ, විශිෂ්ටවූ; ගීතය, ගීතිකාව; කියමින්, කථනය කෙරෙමින්; පද යෙන් පදයට, පාදයෙන් පාදයට; දෙපතුල, පාදතලවය; තබමින්, ස්ථාපනය කෙරෙමින්; නොලසේ, අනලසව; රන්රසු, ස්වණි කිඞ්කිණිකයන්; සන්කරු, නාදකොට; නළඹින් අතුරෙන්, නාටිකාඞ්ගනාවන් අතරෙන්; අඟනක්, අඞ්ගනාවක්; සකසේ, සකස්ව; වෙසකරු, වෙශය කොට හෙවත් අලඞ්කාරාදියෙන් රූපය වෙනස් කොට; රඟගත්, නෘත්‍යග්‍රහණය කළාවූ; විලසක්, විලාසයක්; (කෙසේද) සුරකැන් මැද්‍ද, දිව්‍ය සමූහයා මධ්‍යයෙහි; උන්, උන්නාවූ; සඟසක් අබියසැ, ශක්‍රයා අභිමුඛයෙහි; උරුවෙශ්, * උර්ශිනම්වූ දිව්‍යාඞ්ගනාව; රඟගත් විලසේ, නෘත්‍යග්‍රහණය කළාවූ ආකාරයි.

173. නේකලුන්, අනෙක කාන්තාවන් විසින්; හත්, අඳින ලද්දවූ; නන්වණින් යුත්, නානාවණියෙන් යුක්තවූ; වසන්, වස්ත්‍රයන්ගේ; ඇසින්, ඡිද්‍රයෙන්; පෙනෙන්නේ, දෘශ්‍යමාන වන්නාවූ; කැලුම්කැන්, කාන්ති සමූහයෙන් යුක්තවූ; රුවන්වන්, රත්නයක් පැමිණියාවූ නොහොත් මැණික් වලින් කරන ලද්දවූ; රසන්දම්, රසනා (මෙඛලා) දාමය ඇත්තාවූ; දුන්, ජනිතවූ; වෙගින්, වෙගයෙන්; ගත්, ශරීරය; සකක්මෙන්, චක්‍රයක් මෙන්; බමන්නේ, භ්‍රමණය කරන්නාවූ; ඔවුන්, ඒ නාටිකාඞ්ගනාවන්; අඳුන් වන් ගුවන් වන්, අඤ්ජනවණි ආකාශය වැනිවූ; එතැන්නේ, ඒ ස්ථානයෙහි; විදුන් වන්, විද්‍යුල්ලතාවන් වැන්න.

---

* ස්වර්ලොකවාසීන් වසඟ කිරීමෙහි මෙනකාදිදෙවඟනන් අතුරෙන් උර්වශී නම් දිව්‍යාඞ්ගනාව ශ්‍රෙෂ්ඨයයි කියනලදී.

174. කෙ ළ වන දිගුනෙත නිලුපු ලසේයා
ලෙ ළ පවනින් රන්ලිය වි ලසේයා
නා ළ ඟන රඟනෑ දූකෑ නො ලසේයා
නා ළ ළනෑ නුවනනෑ රඟ.සැ ලසේයා

175. ච ත් ච ත් පුට ඇ දූනෑ තලබේ දත්
ස ත් ත න් මියුරුවු සහ වෙණනා දත්
නෙත්නත් දෙවඟන පානා වා දත්
චි ත් ද ත් නළඟන දකු සිතුපෑ දත්

176. ලා නෙ ත් කෙළවර කළ අනවෑ නු ම ට
ඒ නෙ ත් පත්නැන සිතරස ගෑ නු ම ට
සේ ප ත් ළද තුනුවඟ රඟගෑ නු ම ට
පෝ ස ත් වියතුන් නොදනිමි වෑ නු ම ට

---

174. නිලුපුල සේයා, නිලොත්පලය වැනිවූ; දිගුනෙත, දීඝීනෙත්‍රය; කෙළවන, ක්‍රීඩාකරවන්නාවූ; පවනින්, මාරුතයෙන්; ලෙළ, ලීලොළප නවූ; රන්ලිය විලසේයා, සවණීලතා විලාසවූ; නොලසේයා, අකුසීතව; රඟනා, නෘත්‍යය කරවන්නාවූ; නළඟන, නාටිකාඞ්ගනාවන්; දූකෑ, දශීනය කොට; නළළනෑ, ලලාටයෙහිද; නුවනනෑ, නෙත්‍රයෙහිද; රඟසැල සේයා, නෘත්‍යය සැලසෙයි.

175. චත්චත්පුටඇ, චත්චත්පුට යනාදි වූ; තලබේදත්, තාලභෙද යන්ද; * දූනා, ජානනය කොට; මියුරුවූ, මධුරවූ; සත්තන්වෙණ නාදත් සහ, සප්තතන්ත්‍රි වීණානාදයද සමග; දෙවඟන, දිව්‍යාඞ්ගනාවන්ගේ; නෙත්, නාට්‍යයන්හා; අනත්, අනන්තවූ; වාදත්,වාදයන්ද, පානා, ප්‍රකාශ කරන්නාවූ; චිත්දත්, චිත්ත ජානනය කළාවූ; නළඟන,නාටිකාඞ්ගනාවන්; සිතු පෑදත්, චිත්තප්‍රසන්නකොට; දකු, අවලොකනය කර.

176. කළ, කරන ලද්දාවූ; අනවැනුමට, හස්තචාලනයට;නෙත් කෙළවර; නයනකොටිස; ලා, ප්‍රක්ෂෙප කොට; ඒ, එහි;නෙත්පත්නැන, නෙත්‍ර ප්‍රාප්තවූ නැනැත්තන්ගේ; (ගුවූඅයගේ) සිතරස, චිත්තරස (සිතේආල) ය; ගැනුමට, ගැනීම පිණිස;රඟගෑනුමට, නෘත්‍යග්‍රහණය කිරීමට;සේපත්, දක්ෂප්‍රාප්තවූ; ළද, තරුණවූ; තුනුවඟ, කායදෙහිත් හෙවත් සත්‍රීන්; වැනුමට, වණීනා කිරීමට;පෝසත් වියතුන්,සමෘද්ධ ව්‍යක්තයන්;(අසවලුන් යයි) නොදනිමි, (කාව්‍යකතිවූ මම) ජානනය නොකෙරෙමි.

---

* සඞ්ගීතශාස්ත්‍රයෙහි භරතාචායීන් සම්මතවූ "චර්චත්පුට, චාරුපුට, සම්පක්කා පුත්‍රක" යනාදිවූ තාලසැට ප්‍රධානකොට 101 ක් තාලභෙද මෙහි ආදි ශබ්දයෙන් දත්නේය.

177. ලය නොවරද්ද පහරන කසු තා ළ ය
රඟඇඳුරන් හැකි කිසි නොවි නා ළ ය
නළඟන දුට රඟ දෙන එක තා ළ ය
පරෙවිඳු සඳ නොස වේ එක නා ළ ය

178. වි පුල් ව න් යසැති ලොවැ පතළ පිරිසු දු
කොපුල් ව න් රුවන් පස්කැන් කණින් සැ දු
උ පුල් ව න් සමග රූ රස අඳුන් බ දු
උ පුල් ව න් සුරිඳු සිරිපා පියුම් ව දු

179. රන් මිණි ලකළ එසුරිඳු මුදුනත් කිරු ළ
රන් කෙසරිඳුට සරිකළ මතෑ අඳුන්කු ළ
වන් යම් සතෙකු මහවතුරැතුළ ගඟතු ළ
දුන් අත් අයුරු බිම්සඳ පතට හෝවැ ළ

177. ලය නොවරද්ද, තාලය විරුද්ධනොකොට; කසුනාලය, කාංසතාලයන්; පහරන, ප්‍රහාරණය කරන්නාවූ; රඟ ඇඳුරන්, නෘත්‍යාචාර්යයන් විසින්; කිසි, කිසිවක්; නොවිනාලයහැකි, විනාල නොහැක්කාවූ; එකනාලය, ඒකාකාරයෙන්; රඟදෙන, නෘත්‍යදානය කරන්නාවූ; නළඟන, නාටිකාඞ්ගනාවන්; දුට, දර්ශනය කළහොත්; පරෙවිඳුසඳ, පාරාවතේන්ද්‍රය; එකනා, ඒකාන්තයෙන්; ලය, චිත්තය; නොස වේ, සන්තෝෂ වේ.

178. ලොවැ, ලොකයෙහි; පතළ, ප්‍රසෘතවූ; පිරිසුදු, පරිශුද්ධවූ; විපුල් වන්, බොහෝවූ; යසැති, කීර්තිය ඇත්තාවූ; කොපුල් වන්, කපොලයට පැමිණියාවූ; රුවන්පස්කැන්, රත්නතාඩ * ඞ්කයන් (යුක්තවූ); කණින්, කර්ණයෙන්; සැදු, සජ්ජිතවූ; උපුල් වන් සමග, උත්පලයාගේ වර්ණය හා; රසඅඳුන්බඳු, රසාඤ්ජනය හා සමානවූ; රූ, රූපය ඇත්තාවූ; උපුල්වන් සුරිඳු, උත්පලවර්ණ සුරෙන්ද්‍රයාගේ; සිරිපා පියුම්, ශ්‍රීපාද පද්මය; වඳු, නමස්කාර කරව.

179. රන්මිණි, ස්වර්ණමාණික්‍යයෙන්; ලකළ, අලඞ්කෘතවූ; එ සුරිඳු, ඒ සුරෙන්ද්‍රයාගේ; මුදුනත්, මස්තකයෙහි; කිරුළ, කිරීටය; (ඔවුන්ත) අඳුන්කුළුමතෑ, අඤ්ජනකූට මස්තකයෙහි; රන්කෙසරිඳුට, ස්වර්ණකේසරෙන්ද්‍රයෙකුට; සරිකළ, සමාන කළහොත්; (මේඋපමාව) මහවතුර, මහෞඝය; උතුළ, උත්තරිතවූ; ගඟතුළ, ගංගාභ්‍යන්තරයට; වන්, ප්‍රවිෂ්ටවූ; යම් සතෙකු, යම් සත්වයෙකු විසින්; බිම්සඳ, මක්ෂිකාන්තාවයයි; හෝවැළපතට, ගංඉවුරු පාශර්වයට; අත්, හස්තය; දුන් අයුරු, දුන්නාවූ ආකාරයයි හෙවත් දිගුකළාවූ ආකාරයි.

* ඩකාරයහට ටකාරකොට "තාටඞ්ක" යිද පඨිත යි.

180. ඉඳුමිණි සටග බඳ මනසිකිනිඳු සුව ළ
යුගපත් රඹ පැළක වැඩි යොවුන වන ග ළ
කිව මෙ උවම් බැම ගහනතට පැහැදු ළ
අඳේ කාඳ වැනි දේහිමිට සරික ළ

181. ර ත් මිණි තෝඩු යුග හිමි සවනතැ සොබ න
ව ත් සිය පතය පොබයන ලෙසිනි ඇමදි න
ප ත් රිවි යුගය වැනියයි කියත වෙසෙසි න
ම ත් ගජ රදුට නඟුලිස සදිසි කළ මෙ න

182. ලොව නඳ කරන අමකිරණින් යුත් නිම ලී
මු ව සලකුනු දරණුය මුවලප සිය ලී
මු ව සිසි හිමි ඔහු ගත් නෙත් යුග ඉසි ලී
කි ව ඉසුරුගෙ අබියසැ පේරග කිය ලී

---

180. ඉඳුමිණි සටග, ඉන්ද්‍රනීලමාණික්‍යයෂ්ටියෙහි; බඳ, බන්ධනය කරන ලද්දාවූ; මනසිකිනිඳු සුවළ, මාන්‍ය මයූරේන්ද්‍ර යුගලයද; යොවුන වනගළ, යෞවන වනඝට (සමූහ)යෙහි; වැඩි, වර්ධනයවූ; යුගපත්, යුග්ම පත්‍රයක් ඇත්තාවූ; රඹ පැළක, රම්භා පොතකයද; (යන)මෙ උවම්, මේ උපමාවන්; පැහැදුළ, ප්‍රභාවෙන් දිලිසෙන්නාවූ; බැම ගහනනට, භ්‍රූවහා නාසිකාවට; කිව, කථනය කළහොත්; ද්‍යුතිමිට සරකළ, සූර්‍ය්‍යයාට සමාන කළාවූ; අඳේ, දීප්තිය නැත්තාවූ; කාඳේ වැනි, ඛද්‍යෝතකෘමි මෙනි.

181. හිමි, (විෂ්ණුදෙව) ස්වාමීන්ගේ; සවනතැ, ශ්‍රවණයෙහි; සොබන, බබලන්නාවූ; රත්මිණි තෝඩු යුග, රත්න මාණික්‍ය තාඩඞ්ක යුගලය; වත්, වක්ත්‍ර නමැති; සියපතය, ශතපත්‍රය; ඇමදින, සැමදවස්හි; පොබයන ලෙසිනි, ප්‍රබොධ කරන පරිද්දෙන්; පත්, ප්‍රාප්තවූ; රිවි යුගය වැනියයි, සූර්‍ය්‍ය යුගලය සමානයයි; වෙසෙසින, විශෙෂයෙන්; කියන, කථනය කළහොත්; (මේ උපමාව කෙබඳුද?) මත්ගජ රදුට, මත්ත ගජේන්ද්‍රයාහට; නඟුලිස, නාංගල ශීර්ෂ; සදිසි කළ මෙන, සමාන කළාක්මෙනි.

182. ලොව, ලොකයා; නදකරන, සන්තොෂ කරන්නාවූ; නිමලී, නිර්මලවූ; අමකිරණින් යුත්, අමෘතරශ්මීන් යුක්තවූ; මුවසලකුනු, චන්ද්‍රතෙම; සියලී, සියල්ලෙන්; මුවලප, මෘගලපය; දරණුය, දරන්නේය; * හිමි, ස්වාමීහුගේ; මුවසිසි, මුඛචන්ද්‍රතෙම; ඔහු, ඒ චන්ද්‍රයා විසින්; ගත්, ගන්නාලද් දක් හෙවත් ගත්තාවූ ලපය; නෙත්යුග, නෙත්‍රයුගලයෙන්; ඉසිලී, උවහනය කෙළේයයි; කිව, කථනය කළහොත්; (මේ උපමාව) ඉසුරුගෙ අබියසැ, ඊශ්වරයාගේ අභිමුඛයෙහි; පේරග, ප්‍රේතයකුගේ ආකාරය; කියලී; ප්‍රකාශ කළාක් වැනිය.

---

* සියලීමුව, සකලමුඛයෙන්; ලප, ලපය; දරණුය, දරන්නේයයි ඇතම් පඬුවෝ ඇඹී කියත්.

183. දද සොඳ කුසුම දම් සැදි සරසවිය ක ල
රදනා නිතොර එසුරිඳු දර මුව කම ල
පිරි අම පියුම්රම්ණී විතෙන්කැයි උදු ල
තෙපලන බඹුට ගොවි කී වෙද මතුරු තු ල

184. අනත කුලුණු බරකල බැව්නි උරබි ත
සිඟු වලඟට ඉන් වෙහෙසක් වෙයි සත ත
දුන් ඉඳුමිණි වැම් යුවළැයි කිව ලඹ ත
රිසි අබියසැ ලූ පානැයි යෙහි විය ත

185. උර නිල් සරතලින් බට ගඟෙක විලස ද
නැබ පියුමට ගමනොත් මත බිඟුවැළ ද
වසාරෙදට සරිකළ සුරරජුගෙ සො ඳ
බරණැස සහල් නැළියට මිල කළෙව් ද ද

---

183. එසුරිඳු, ඒ සුරෙන්ද්‍රයාගේ; සරසවිය කල, සරස්වතී කාන්තාව; නිතොර, අනවරතයෙන්; රදනා, රජමානවූ; මුවකමල, මුඛ පද්මයෙහි; දද, දන්ත නමැති; කුසුම දම්, පුෂ්පදාමයෙන්; සැදි, සජ්ජිතවූ; අදර, අධරය (තොල); උදුල, උජ්වලිතවූ; පිරිඅම, පූර්ණ අමෘතයෙන් යුක්තවූ; පියුම් රම්ණී විතෙනකැයි, * පද්මරාගමාණික්‍ය වෂයකැයි; තෙපලන, ප්‍රකාශ කරනහොත්; (මේ උපමාව නම්) බඹුට, බ්‍රහ්මයාට; ගොවි කී, ගොවියා විසින් කියන ලද්දාවූ; වෙදමතුරු තුල, වෙදමන්ත්‍රය සමානය.

184. උරබිත, වක්ෂස් නමැති භිත්තියෙහි; අනත, අනන්තවූ; කුලුණු බරකල බැව්නි, කරුණාභාරය කළහෙයින්; සිඟු වලඟට, කෘශවූ මධ්‍ය ප්‍රදෙශයට; ඉන්, එයින්; වෙහෙසක් වෙයි, වෙහෙසෙක් වේයයි; සතත, බ්‍රහ්මයා විසින්; ලඹන, ප්‍රලම්බිත හස්තය; දුන්, දෙනලද්දාවූ නොහොත් තබනලද්දාවූ; ඉදුමිණිවැම් යුවළැයි, ඉන්ද්‍රනීල මාණික්‍යසම්මිත යුග්මයයි; කිව, කථනය කළ හොත්; රිවි අබියසැ, සූර්‍යයා අභිමුඛයෙහි; ලූ, දල්වන ලද්දාවූ; පානැයි, ප්‍රදීපය(වැනිය)යි; වියත, ව්‍යක්තයෝ; යෙහි, කියත්.

185. උර, වක්ෂස් නමැති; නිල්, නීල වර්ණවූ; සරතලින්, තඩාග තල යෙන්; බට, අවතීර්ණවූ; ගඟෙක විලසද, ගඞ්ගාවක විලාසයද; නැබ පියුමට, නාභි නමැති පද්මයට; ගමනොත්, ගමන ග්‍රහණය කළාවූ; මත්බිඟු වැළද, මත්තභෘඞ්ගාවලිය ද; සොඳ, සුන්දරවූ; සුරරජුගෙ, දිව්‍යරාජයාගේ; වසාරෙදට, වසාරජියට; සරිකළ, සදෘශකළහොත්; (මේ උපමාව කෙලෙසද?) දද, මුග්ධයා විසින්; බරණැස, බාරාණසී නගරය; සහල් නැළියට, තණ්ඩුල නාලිකාවට; මිලකළෙව්, මිලකළාක් මෙනි.

---

* පළිඟුයෙන් සැදූ තැටිය.

186. පැහැපත් කලිඳු විලසින් මොළක හෙල් මැ ලී
අ ම ව ත් සිනිඳු බව මඳ නල වන් සිහි ලී
ගජන ත් එසුර රජ විටොරට කරන තු ලී
සි රි ම ත් කඬුපුලට සරිකළ කඬොල් ම ලී

187. මු ල් මේ ලොවට ඔහු දඟ යුවළට බැබ ළි
පු ල් නු තැඹිලිමල් හියවුරු වැටුපු සි ළි
නි ල් ගෙළෙ ගෙළේ ලෙහෙළද දුනුකෝ කැකු ළි
තු ල් කළකල උවම් කිරිසයුරට හොවැ ළි

188.*හි රි තර පතර වැඳූ නවපුල් රත කම ල
සි රි සර සුරතුරක බබලන ළතඹද ල
ස රි කළ එසුරිඳුගෙ සිරිපතුලට නිම ල
කි රි මිහිරට මොහොරෙකි එකියන තෙපු ල

---

186. කලිඳු විලසින්, කාලින්දී (යමුනා) නම් ගඞ්ගාව පරිද්දෙන්; පැහැපත්, ප්‍රභා ප්‍රාප්තවූ; හෙල්මැලී, කල්හාර පරිද්දෙන්; මොළක, මෘදුවූ; අමවන්, අමෘතය මෙන්; සිනිඳුබව, සනිග්ධභාවය (ඇත්තාවූ); මඳනලවන්, මන්ද මාරුතය මෙන්; සිහිලී, ශීතලවූ; එසුරරජ, ඒ දිව්‍යරාජයාගේ; විටොරට, වෘත්තෝරුවට; ගජනත්, හස්තිසොණ්ඩය; තුලිකරන, සමාන කරනහොත්; සිරිමත්, ශ්‍රී යුක්තවූ; කඬුපුලට, † කඬුපුල් මලට; සරිකළ, සමාන කළාවූ; කඬොල්මලී, කඬොල්මල වැනිය.

187. මේ ලොවට, මේ ලොකයට; මුල්,මූලිකවූ; ඔහු, ඒ දිව්‍ය රාජයාගේ; බැබළි, බබලන්නාවූ; දඟයුවළට, ජඞ්ඝා යුගලයට; පුල්නූ, නොපිපුණාවූ; තැඹිලිමල්, සත්හිර පුෂ්පය; හියවුරු, ‡ වාණධිය;වැටුපුසිළි, ප්‍රදීපශිඛාය; නිල්ගෙළෙ, නීල ග්‍රීවයා (මොනරා) ගේ; ගෙළේ,ග්‍රීවය; ලෙහෙළිද, ලේල් ලූය; (යනමේවසතුද) දුනුකෝ කැකුළි, රාජකෙතකී කුඩ්මලය ද;තුල්කළ කල, සමානකළ කල්හි; (මේ උපමාව) කිරිසයුරට, ක්ෂීරසාගරයට; හො වැළි, දියවරය; උවම්, උපමා වූයේයි.

188. හිරි තරපතර, සූර්‍ය්‍යරශ්මි සමූහය; වැඳූ, ප්‍රවිෂ්ටව; නවපුල්, අලුත පිපුණාවූ; රත කමල, රක්ත පද්මය ද; සිරිසර,ශ්‍රීසාරවූ; සුරතුරක, දිව්‍යවෘක්ෂයෙක්හි; බබලන, භ්‍රාජමාන වන්නාවූ; ළතඹ දල, බාලතාම්‍ර පත්‍ර ද; එසුරිඳුගෙ, ඒ සුරෙන්ද්‍රයාගේ; නිමල, නිර්මලවූ; සිරිපතුල, ශ්‍රීපාද තලයට; සරිකළ, සමාන කළහොත්; එකියන, ඒකාර්ථනය කරන ලද්දාවූ; තෙපුල, වචනය (නම්); කිරි, ක්ෂීරයෙහි; මිහිරට,මධුරයට; (සමානකළාවූ) මොහොරෙකි, මෝරුවෙක්ය.

---

* හිරු කිවමනා තන්හි එලිසම කරනු පිණිස 'සිරි' යි පිළිපෙරළි කළ නියායි.
† නාගලොකයෙහි තිබෙන මානිල්මල් වර්ගයකි.
‡ ඊතලපසුඹිය-වැද්දන් විසින් ඊතල දමා එල්ලාගෙන තිබෙන සම් කූරපසියක්.

189. හිමි සිරිසරණ නමදින සෙසු සුරන් හි ස
පැලඳි කිරුළු අඟමුතු ලැලි ගිලි විල ස
පවසන උවම් කරු නිය පතරට සක ස
දෙවුතුරු මරු තුරු කළ වැන්න එක ලෙ ස

190. වි දු ලේ වැනි එසුරිඳු සුනිල මේ කු ළ
බැමලේ මියුරුකැන් අසුරඹුවන් කොම ළු
වර ලේ පිල් නලල් රන් ගිරිතලැ අත ළ
නිමලේ එවන් විකුමන් කිම වනනු ය ළු

191. තෙදියතිසුරු පළ දියැ ඔහු යස අන ත
එනත ගෙලෙ මිණෙකැ සිරිපැසි තෙද දිමු ත
එමිණ පැතු දෙය දෙන වැනි සැපත දෙ ත
මෙවැනි සුරිඳු කෙසමත වනන මෙදිය ත

---

189. හිමි, ස්වාමිනුගේ; සිරිසරණ, ශ්‍රීචරණය; නමදින, නමස්කාර කරන්නාවූ; සෙසු සුරන්, අවශේෂ දිව්‍යයන් විසින්; හිස, ශීර්ෂයෙහි; පැලඳි පිළන්ධනය කරන ලද්දාවූ; කිරුළු අග, කිරීටමස්තකයෙහි; මුතුලැල්, මුක්තාලතිකාවන්; ගිලි විලස, ගිලුනාවූ විලාසය; උවම් කරු, උපමා කොට; නිය පතරට, නඛ ප්‍රස්තාරයට; සකස, සකස්ව; පවසන, ප්‍රකාශ කරනහොත්; දෙවුතුරු, දිව්‍ය වෘක්ෂය හා; මරුතුරු, ශිරීෂ (මාරා) වෘක්ෂය; එකලෙස කළ වැන්න, එකාකාර කළාක් මෙනි.

190. එසුරිඳු, ඒ සුරේන්ද්‍ර නමැති; සුනිල, මනොඥ නිල වර්ණවූ; මේකුළ, මේඝකූටය කරණ කොටගෙන; විදුලේ වැනි, විද්‍යුල්ලතා සමානවූ, කොමළ, කොමලවූ; අසුරඹුවන්, දානව වනිතාවන්ගේ; බැමලේ, භෲරේඛා නමැති; මියුරු කැන්, මයූර සමූහතෙම; වරලේ, ධම්මිල්ල නමැති; පිල්, පිඤ්ඡයන්; නලල්, ලලාට නමැති; රන්ගිරිතලැ, ස්වර්ණ පර්වත තල යෙහි; අතළ, ආස්තරණය කරනලද්දේය; නිමලේ, නිර්මලවූ; එවන් විකුමන්, එබඳුවූ වික්‍රමයන්; යළු, නැවත; වනනු කිම, වර්ණනා කරනු කිමෙක් ද.

191. තෙදියතු, ත්‍රිවිධ ලොකයාට; ඉසුරු, ඊශ්වරවූ හෙවත් ප්‍රධානවූ; දියැ, ලොකයෙහි; පළ, ප්‍රකටවූ; අනත යස, අනන්තකීර්ති ඇත්තාවූ; ඔහු, ඒ දිව්‍යරාජයාගේ; දිමුත, දීප්තිමත්වූ; තෙද, තෙජස් තෙම; එනත ගෙලෙ, ඒ අනන්තනාගරාජයාගේ ග්‍රීවයෙහි; මිණෙකැ, (රත්න) මාණික්‍යයෙක; සිරි, ශොභාව; පැසි, ප්‍රකාශ කෙළේය; සැපත දෙන, (ඒ දිව්‍ය රාජයා) සම්පත්තිය දෙනකල්හි; එමිණ, ඒ මාණික්‍යය; පැතු දෙය, ප්‍රාර්ථනා කළාවූ දෙය; දෙනවැනි, දානය කරන්නාක් වැන්න; මෙවැනි, මෙබඳුවූ; සුරිඳු, සුරේන්ද්‍රයා; වනන, වර්ණනා කරනහොත්; මෙදියත, මේ ලොකයෙහි, කො සමත, කවරෙක් සමර්ථ ද.

192\. දැ  න බස් අරුත් නොවරදා සසර  සැල කරන්
පැ න සහ සිහිය නොවරදි ලෙසට  සැල කරන්
ර  න ඔර ඔරුඳි සුරිඳුට රුසිරු    සැල කරන්
ගෙන ගිය අස්න නතු මිතුරිඳුනි   සැල කරන්

193\. පෙර දා සමග විසුමෙන් නෑසිය වැ නි     තී
අ  ර තර මෙලොවැ වැඩයෙදුමෙන්හෝ කැමතී
න ර දිය ඇසුරු පතු නෙළුඹුලසෙ වැඩුමැ    තී
ක ර පෙම් මිතුරු වෙති යනු දහමේ පැව    තී

194\. එබැවි  න් වාසනා පින්බලයෙන් සොඳු    රු
වැඩු නැන්  යතිතුමකු සහ වූ වෙනි මිතු    රු
ඔ බ  ද න් වන ලෙසට කී අස්නැ තොරතු රු
දෙ ස ව න්  නමාසන් සුරිඳුනි ලෝඉසු      රු

---

192\. බස්, වචන හා; අරුත්, අර්ථයන් ද; නොවරදා, විරුද්ධ නොකොට; දැන, ජානනය කොට; සසර, සාරභව්‍ය සහිතව; සලකා අරත්, සංලක්ෂණ ග්‍රහණය කොට; පැනසහ, ප්‍රඥාව සමග; සිහිය, සමෘතිය ද; නොවරදී ලෙසට, නොවරදින ආකාරයට; අසලකරන්, ආශ්‍රය කරගෙන; රනඹර, සවර්ණ වස්ත්‍රයෙන්; ඔරුඳි, විරාජමානවූ; රුසිරු, රූපශ්‍රීයෙන්; සැලකරන්, සාලඞ්කෘතවූ; සුරිඳුට, (විෂ්ණු) දිව්‍යරාජයාහට; ගෙන, ග්‍රහණය කොට; ගිය, ගමනය කළාවූ; අස්න, සන්දේශයෙහි; නතු, නත්වය; මිතුරිඳුනි, මිත්‍රොත්තමයාණනි; සැලකරන්, ආදරවන්‍ය කරන්න–කෙපමණක් පෙරටු කරු දක්වම්ද යත්.

193\. පෙරදා, පූර්වජාතියෙහි; නෑසිය වැ, සවකීය ඥාතීව; නිති, නිත්‍යයෙන්; සමග විසුමෙන්, සමගිව වාසය කිරීමෙන් හෝ; මෙලොවැ, මේ ලොකයෙහි; කැමති, ඊප්සිතවූ; අරනර, අධික නරවූ; වැඩ, අර්ථයන්; යෙදුමෙන් හෝ, යුක්තකිරීමෙන් හෝ; දියතර, ජලාන්තරය; ඇසුරුපතු, ආශ්‍රයට පැමිණියාවූ; වැඩුමැති, වර්ධනවීම ඇත්තාවූ; නෙළුඹුලසෙ, පද්මකරය මෙන්; පෙම්කර, ප්‍රේමය කොට; මිතුරු වෙති යනු, මිත්‍රවෙත් යන්න; දහමේ, ධර්මයෙහි; පැවති, ප්‍රවෘත්තින සී.

194\. එබැවින්, තත්භාවයෙන්; සොඳුරු, සුන්දරවූ; වාසනා පින්බල යෙන්, වාසනා පුණ්‍යබලයෙන්; වැඩු, වර්ධනය කරනලද්දාවූ; නැන්, නැනැත්තෙන්වූ; යති තුමකු සහ, යතීන්ද්‍රයකු සමග; මිතුරුවූවෙනි, මිත්‍රවූ හෙයින්; ඔබ, ඔබවහන්සේට; දන්වනලෙසට, ජානනය කරවන ආකාරයට; කී, කථනය කළාවූ; අස්නැ, සන්දේශයෙහි; තොරතුරු, විශේෂ විභාගය; ලෝඉසුරු, ලොකෙශ්වරවූ; සුරිඳුනි, සුරෙන්ද්‍රයාණනි; දෙසවන්, ශ්‍රවණ යුගලය; නමා, නාමිත කොට; අසන්, ශ්‍රවණය කරන්න.

195. කිඹිරුළි උපුල්වන්-දෙව්රජුනි ගිරිහෙලපුර
මුනිඳුන් වදන් මුදුනෙන් ගත් සුරිඳු ස ද
නිරිඳුන් මෙලකැ රකිනුව බුදුසසුන්සො ද
වර දුන් බැවිනෙනොබට-මකියන සුදුසු නෙපලක
රජසිරි බිසෙව් ලත් දිවයුරු කුලෙනි ප ද
බුජබල නුවණ තරසර ගුණෙනි මන න ද
ප සී රුසිරු නිරිඳුට මේ පැරකු ම්බා
වි සී කරු දුදුළු විරිඳුන් ළය ත ම්බා
නි සී ලෙසින් රකිවයි ලක ඕලෙ ම්බා
ර සී ගුණැති අයදින් මමිතුර එ ම්බා

196. සිරිලක් තිදසපුර-සුරතුරු අයුරු පුවතර
උරබ තුරු මැඳුරු සැදු නවමිණි මිතු ර
සරබ යුරු විකුම් දපහළ රුපු කෙස ර

---

195. ගිරිහෙලපුර, ගිරිහෙල් පුරයෙහි; කිහිරුළි උපුල්වන් දෙව්රජුනි, ඛදිරදෙහලිවංශොද්භූත උත්පලවර්ණ නම්වූ දිව්‍යරාජයාණනි; මුනිඳුන්, සර්වඥයන්වහන්සේගේ; වදන්, වචනය; මුදුනෙන්, මස්තකයෙන්; ගත්, (ප්‍රති) ග්‍රහණය කළාවූ; සුරිඳු සඳ, උතුම්වූ ශක්‍රයාවිසින්; මෙලකැ, මේ ලඞ්කාවෙහි; නිරිඳුන්, නරෙන්ද්‍රයන් හා; සොඳ, සුන්දරවූ; බුදුසසුන්, සර්වඥ ශාසනය ද; රකිනුව, රක්ෂාකරනුපිණිස-ඔබට, ඔබවහන්සේට; වරදුන් බැවින්, වර දානය කළ හෙයින්; මකියන, (මේ) මාවිසින් කියනලද්දේ; සුදුසු නෙපුලක, යොග්‍යවූ නෙපුලක්ය; (එනම්) දිවයුරුකුලෙනි, සූර්‍ය්‍යවංශයෙන්; පද, ප්‍රාප්තව; රජසිරිබිසෙව් ලත්, රාජ්‍යශ්‍රී අභිෂෙකය ලද්දාවූ; බුජබල නුවණ තරසර ගුණෙනි, බාහුබල ඥාන ස්ථිරසාර (යනාදි) ගුණයෙන්; මනනද, මනොනන්දනාවූ-පසී, පඤ්චබාණ (අනඞ්ග) යා වැනිවූ; රුසිරු, රූපශ්‍රී ඇත්තාවූ; මේ පැරකුම්බා නිරිඳුට, මේ පරාක්‍රමබාහු නරෙන්ද්‍රයාහට; දුදුළු, වණ්ඩිවූ; විරිඳුන්, විරුඬයන්ගේ; ළය, හෘදය; තම්බා, පවනයකොට හෙවත් මෘදුකොට; විසීකරු, වසඟකොට; ලක, ලක්ෂ්මිය (ශ්‍රීකාන්තාව); ඕලොම්බා, අවලම්බනය කරවා; නිසීලෙසින්, යොග්‍යපරිද්දෙන්; රකිවයි, රක්ෂාකරවයි; රස ගුණැති, මාධුර්‍ය්‍ය ගුණ ඇත්තාවූ; එම්බා මමිතුර, එම්බා මාගේ මිත්‍රය; අයදින්, ආයාචනා කරන්න.

196. සිරිලක්, ශ්‍රීලඞ්කා නමැති; තිදසපුර, ත්‍රිදශපුර(දිව්‍යලොක)යෙහි; පුවතර, ප්‍රසිඬවූ; සුරතුරු අයුර, දිව්‍යවෘක්ෂාකාරවූ; උර අබතුරු, හෘදයාභ්‍යන්තර නමැති; මැඳුරු, මන්දිරය; සැදු, සජ්ජිතකළාවූ; නවමිණි මිතුරු, අභිනව මාණික්‍ය ප්‍රදීපය වැනිවූ; රුපුකෙසර, ශත්‍රු නමැති

තියසක් සිව් උපා-සගුණෙණින් අසුරගුරුයුරු
පියුම ම්බා තනකොකුමතල බුජතු • රු
පැරකු ම්බා නරනිඳුසඳුට සොහොවු රු
දිනි සුරුඅසුරු තදතෙද මුළුලොවු බැබ එ
දිනි සුරුසදිසි පැරකුම් නිරුඳු සුලකු එ
දිනි රන් වහල් මදගජ අනගි පටස එ
දිනි යදියන්ට මෙනිරිඳු තිළිනෙන් නැඹු එ

197. පහයා දිගත යසසඳ පහනින් නිතො ර
පහයා ගත් රුසිරු නලකුබර අයු ර
මහයා දුනුනුවර රුඳි යුවරජ පව ර
සහයා පතින් රකිනුව අයදින් මිතු ර

---

සිංහයන්ගේ; විකුම්දප, වික්‍රමය හා දර්පය; හළ, පහකළාවූ; * සරබයුරු, ශරභ මෘගායමානවූ-තියසක්, † ත්‍රිවිධ ශක්තිය සිව්උපා, ‡ චතුරොපායය; §සගුණෙණින්, ෂාඩ්ගුණ්‍යය; (යන මෙයින්) අසුරගුරු යුරු, ශුක්‍රයාබඳුවූ; පියුමම්බා, පද්මාම්බිකාවගේ; තන, පයොධරයන්හි; කොකුම්, කුංකුමය; අතල, ආස්නරණය (නැවරුණා)වූ; බුජතුරු, බාහු අන්තර (උර)ය ඇත්තාවූ; පැරකුම්බා නරනිඳුසඳුට, පරාක්‍රමබාහු නරෙන්ද්‍රොත්තමයාහට; සොහොවුරු, සහොදරවූ-මුළුලොවු, සමස්ත ලොකයෙහි; බැබළු, භ්‍රාජමානවූ; දිනිසුරු අසුර, සූර්‍ය්‍ය බඳුවූ; තද, සන්බ්ධවූ; තෙද, තෙජස් ඇත්තාවූ; දිනිසුරු සදිසි, බලභද්‍රයා සමානවූ; සුලකුළු, මනාව අලඞ්කෘතවූ; පැරකුම්නි, පරාක්‍රමයෙන්; රුඳු, රජමානවූ; මෙනිරිඳු, මේ (යුව) රජතෙම; නැඹුළු, මහත්වූ; තිළිනෙන්, ත්‍යාගයෙන්; රන්, සුවර්ණය; වහල්, දාසය; මදගජ, මත්ත හස්තිය; අනගි පටසළු, අනර්ඝ පට්ට සාටකය; (යනාදිආදි) දිනි, ධනයන්; යදියන්ට, යාචකයන්ට; දිනි, දානය කෙළේය.

197. යස, කීර්තිනමැති; සඳපහනින්, චන්ද්‍රාලොකයෙන්; දිගත, දිශාන්තයන්; නිතොර, නිරන්තරයෙන්; පහයා ප්‍රභාමත් කළාවූ; පහයා,ප්‍රසන්නාවන ලද්දාවූ; ගත් රුසිරු, ශරීර රූපශ්‍රීයෙන්;නලකුබරඅයුර,¶නලකුබරයා බඳුවූ; මහයාදුනු නුවරු, මායාදුනු නම් නුවරෙහි; රුඳි, රජමානවූ; යුවරජ පවර සන, උපරාජෝත්තමයා සමග; යාපතින්,යහපත්ව; රකිනුව, රක්‍ෂාකරනු පිණිස; මිතුර, මිත්‍රය; අයදින්, ආයාචනා කරන්න.

---

* එනම් ඉහලට පා සතරක්ද පහලට පා සතරක්දැයි මෙසේ පා අටක් ඇත්තාවූ උඩට ඇස්ඇති මෘගයෙකි .

† ප්‍රභාවය, උත්සාහය, මන්ත්‍රණය, යනු ත්‍රිවිධ ශක්තියයි.

‡ භෙදය, දණ්ඩය, සාමය, දානය යනු චතුරොපායයි.

§ රජුන්කෙරෙහි පවත්නාවූ සන්ධිවිග්‍රහාදි ගුණසයක්.

¶ එනම්-වෙසමුණු රජුරුවන්ගේ ලක්‍ෂණවත්වූ පුත්‍රයෙක්.

198. පැරකුම් රජ වියතැ–පහළ නවසඳලේ යුර
සිරිලක් වවන රජ බිජු සරු කෙතෙව් දි සි
සිරි පින් ලකුණු මිණි පිරි නිදනෙක සදි සි
සඳවත් නමින් යුත්–රජදූ ළඳුට සිරිබර
නොලසා සමුව මෙන් දෙව්සෙන් වඩන රු තී
ස ලසා සරිකුලෙන් හිමියකු රූ පිනැ ති
ග ත් රුසිරු සුරකුමරකු මෙන් බැබ ළු
යු ත් ගුණ නැණ දූනුමැති නෙපල කිවින ළු
මෙත් කැරැ මෙලක රකිනා දූරුමෙන් කිරු ළු
පු ත් රුවනක් දෙන ලෙස අයදින් යහ ළු
199. ඇතිවූ නිතොර මහ පිරිවර නිරිඳු ළ ඟ
අරුත උතුරු කටයුතු නියුතු මැතිව ග
ගජ හය රිය පාබල සිව්රඟ සෙන ඟ
රකින ලෙසට අයදින් මිතුර මනර ඟ

---

198. පැරකුම්රජ, පරාක්‍රමබාහුරාජ නමැති; වියතැ, ආකාශයෙහි; පහළ, ප්‍රාදුර්භූතවූ; නවසඳලේ යුර, අභිනව චන්ද්‍රරේඛාකාරවූ; සිරිලක්, ශ්‍රීලඞ්කාව; වවන, වර්ධනය කරන්නාවූ; රජ බිජු, රාජ බීජයන්ට; සරු කෙතෙව්, සාර ක්ෂේත්‍රයක් මෙන්; දිසි, දෘශ්‍යමානවූ; සිරිපින් ලකුණු, ශොභා පුණ්‍ය ලක්ෂණ නමැති; මිණි, මාණික්‍යයන්ගෙන්; පිරි, පූර්ණවූ; නිදනෙක සදිසි, නිධානයක්හා සදෘශවූ–සිරිබර, ඓශ්වර්‍ය්‍ය භාරවූ; සඳවත් නමින් යුත්, චන්ද්‍රවතී නාමයෙන් යුක්තවූ; රජදූලඳුට, රාජදුහිතෘ කාන්තාවට; දෙව්සෙන්, දිව්‍යසෙනාව; රුතී, රුචිය; වඩන, වර්ධනයකරන්නාවූ; සමුවමෙන්; * ෂණ්මුඛයා පරිද්දෙන්; සරිකුලෙන්, සමානවංශයෙන්; රුපිනැති, රූපපූර්ණයාන්විතවූ; හිමියකු, ස්වාමියකු; නොලසා, අනාලස්‍යව; සලසා, සලස්වා–ගත් රුසිරු, ශරීර රූපශ්‍රියෙන්; සුර කුමරකුමෙන්, දිව්‍ය කුමාරයකු පරිද්දෙන්; බැබළු, භ්‍රාජමානවූ; ගුණ නැණ, ගුණයෙන් හා ඥානයෙන් ද; යුත්, යුක්තවූ; කිවිනළු නෙපල, කාව්‍යනාටක වචනයන්; දූනුමැති, දැනීම ඇත්තාවූ; කිරුළු, කිරීටය; දූරුමෙන්, ධාරණය කිරීමෙන්; මෙත් කැරැ, මෛත්‍රී කොට; මෙලක, මේ ලඞ්කාව; රකිනා, රක්ෂාකරන්නාවූ; පුත්රුවනක්, පුත්‍ර රත්නයක්; දෙනලෙස, දානය කරන පරිද්දෙන්; යහළු, මිත්‍රය; අයදින්, ආයාචනා කරන්න.

199. නිරිඳු ළඟ, නරේන්ද්‍රයා සමීපයෙහි; නිතොර, නිරන්තරයෙන්; ඇති වූ, විද්‍යමානවූ; මහපිරිවර, මහාපරිවාර ද; අරුත, අභීෂ්ටාර්ථය; උතුරු, පරමකොටඇති; කටයුතු, කෘත්‍යයන්හිද; නියුතු, නියුක්තවූ; මැති

---

* කාත්දස්වාමි.

200. ස ඳ ව න් යසරැසින් හෙළි කළ මුළුදිය ත
ස ඳ ව න් සිරින් දනමන කොඳ කල දිමු ත
ස ඳ ව න් සුරිඳු සිය තුනු රන් කරඬු ප ත
ස ඳ ව න් බිසෝසඳ වැඳැ කියව මෙපව ත

201. දුනු කම් රම් රජුමෙන් ලොවැ පුවත ර ව
දුනු පරසුරම් ගත රන්දුනු සරද ර ව
දුනු පුල්වන් දෙව් රජ කුලැ ගරුත ර ව
දුනු දෙව්රජුහටද මෙතෙපුල් සැලක ර ව

202. ද ස දෙසැ පතළ යසයුතු සුරිඳුට දිමු තු
ර ස වන් අසුන් සැලකැරැ මෙලෙසින් අමුතු
හ ස රදවන් නුබ විල් කෙළියෙහි නියු තු
තො ස සිය සියන් සහ පරෙවිඳු සඳ පව තු

---

වග, මන්ත්‍රිවර්ගයා ද; ගජහයරිය පාබල, හස්ත්‍යශ්වරථ පදික; (යන) සිව් රඟ සෙනඟ, චතුරඞ්ගිනී සෙනාව ද; රකිනලෙසට, රක්‍ෂාකරන ආකාරයට; මනරඟ, මනොඥවූ; මිතුර, මිත්‍රය; අයදින්, ආයාචනා කරන්න.

200. සඳවන්, චන්ද්‍රයා වැනිවූ; යස රැසින්, කීර්තිසමූහයෙන්; මුළුදියත, සමස්තලොකය; හෙළි කළ, ආලොක කළාවූ; දන, ජනයන්ගේ; මන, චිත්ත නමැති; කොඳ, කුමුදයන්; දිමුත කළ, දිප්තිමත් කළාවූ; සිරින්, ශොභාවෙන්; සඳවන්, චන්ද්‍රයා වැනිවූ; සුරිඳු,(ශ්‍රීරාමචන්ද්‍ර) සුරෙන්ද්‍රයාගේ; සඳවන්, සිත්වූ පරිද්දෙන්; සියතුනු, ස්වකීය ශරීර නමැති; රන්කරඬු පත, රන්කරඬුවට පැමිණියාවූ;සඳවන්,චන්දන වැනිවූ;බිසෝසඳ, (ලක්‍ෂ්මී නම්වූ) මහෙසිකා චන්ද්‍රිකාව; වැඳැ, නමස්කාර කොට; මෙපවත, මේ ප්‍රවෘත්තිය; කියව, කථනය කර.

201. දුනුකම්, ධනුඃකර්මයෙහි; රම්රජුමෙන්, රාමරාජයා පරිද්දෙන්; ලොවැ, ලොකයෙහි; පුවතර ව, ප්‍රසිද්ධ ව; ගත, ඝනවූ; රන්දුනුසරදරව, ස්වර්ණධනුර්බාණ (ඊතල) ධාරීව; පරසුරම්, පරශුරාමයා; දුනු, ජයගත්තාවූ; ගරුතරව, අතිශයෙන් ගෞරවාර්හව; උපුල්වන් දෙව්රජකුලැ, උත්පල වර්ණ දිව්‍යරාජවංශයෙහි; දුනු, ජනිත (උපන්නා)වූ; දුනුදෙව්රජුහට ද, ජනක දෙවරාජයානට ද; මෙතෙපුල්, මේ වචනයන්; සැළකරව, ආරොචනාය කර.

202. දසදෙසැ, දශදිශාවෙහි; පතළ, ප්‍රසෘතවූ; දිමුතු, දීප්තිමත්වූ; යසයුතු, කීර්තියෙන් යුක්තවූ; සුරිඳුට, (ශ්‍රී [illegible]) සුරෙන්ද්‍රයානට; රස වන්, මාධුර්‍ය්‍යොපෙතවූ; අමුතු අසුන්. අමුතු අස්න; මෙලෙසින්, යථොක්තාකාරයෙන්; සැලකැරැ, ආරොචනය කොට; නුබ, ආකාශ නමැති;

203. කඳ වුරුකුලැ උපන් රැඳි තොටගමු පිය ස
සෙ ද දත් සියල් කවිනළු මගද සකුබ ස
ක ද සුරිඳුන් වරලැබ පසළොස් වය ස
ව ද හළ රහල් වැඩිතැන් කලරැව් සඳෙ ස

---

විල්කෙළියෙහි, තඩාග ක්‍රීඩාවෙහි; නියුතු, නියුක්තවූ; හසරද මෙන්, හංසරාජයා පරිද්දෙන්; පරෙවිඳුසඳ, පාරාපතෝත්තමය; සිය සියන් සහ, ස්වකීය බන්ධූන් සමග; තොස, (විශාල) සන්තොෂයෙන්; පවතු, ප්‍රවෘත්ත වේවා;හෙවත් කායචිත්ත පීඩාවක්නොව චිරකාලයක් ජීවත් වේවා.

203. කඳවුරුකුලැ උපන්, ස්කන්ධාවාර වංශයෙහි උපන්නාවූ; තොටගමු පියස, තිශ්ශීග්‍රාම නාමවූ ප්‍රදෙශයෙහි; රැඳි, රජමානවූ; සියල් කවි නළු මගද සකුබස, සකල කාව්‍යනාටක හා මාගධසංස්කෘත (ආදි) භාෂාවන්; පසළොස්වයස, පඤ්චදශවර්ෂයෙහි; කඳ සුරිඳුන්, ස්කන්දකුමාරෙන්ද්‍රයන්(කෙරෙන්);වරලැබ, වරලාභීවැ; සෙද, වහා; දත්, ජානනය කළාවූ; රහල් වැඩිතැන්, රාහුල ස්ථවිරපාදයන් විසින්; වදහළ, වදාළාවූ; කලරැව් සඳෙස, පාරාපත සන්දෙශයයි.

නිමි.

# සුද්ධිපත්‍රය.

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 3 | 27 | තම | නමා |
| 5 | 15–16 | උජ්වජලිත | උජ්ජවලිත |
| ,, | 18 | අවෘතතව | ආවෘතතව |
| 6 | 25 | තීක්ෂණ | තීක්ෂණ |
| 7 | 25 | ජයාගේ | ජනයාගේ |
| ,, | 31 | (අන්ධකාරකොටද;) | (අන්ධකාර) කොටද; |
| *8 | 21 | ගණකුළු | ගනකුළු |
| ,, | 29 | සෙවන | ශෙවන |
| 9 | 8 | ගෙවූයන් | ගෙළයන් |
| ,, | 9 | උපාදක්ෂ | උපායදක්ෂ |
| ,, | 33 | හරෙරින්ද්‍රයාට | ඉන්ද්‍රයාට |
| 12 | 32 | ලලටාක්ෂි | ලලාටාක්ෂී |
| 13 | 17 | පුවල | පුවළ |
| ,, | 24 | උමයඞ්ගනා | උමාඞ්ගනා |
| 14 | 13–14 | චතුරඞ්ගිණී | චතුරඞ්ගිනී |
| 16 | 25 | ඛඹ | ඛඹ |
| ,, | 33 | ග්‍රණය | ග්‍රහණය |
| 19 | 3 | දෙඹවතු | දෙඹඅතු |
| 24 | 20 | නොත්‍රයෙන් | නෙත්‍රයන් |
| ,, | 33 | විලාසමෙන් | විලාසයෙන් |
| ,, | 34 | සංලක්ෂිනායි | සංලක්ෂිතයි |
| 25 | 23 | ලිලා | ලීලා |
| 26 | 16 | ක්‍රිඩා | ක්‍රීඩා |
| 27 | 18 | අප්‍රවෘතතීත | අප්‍රවෘතත |
| ,, | 28 | පටිපටිසෙහි | පටිපටියෙහි |

* 16. ම ද ග ළ වරණගළ පළ කා ළ කුළු පුව ළ
රූ පු ම ළ මොළ ගහළ හළ ලෙ ළ පූරණ තු ළ
නොවහ ළ ඊරල රළ පෙළ හෙ ළ දහර ස ළ
ර සු දු ළ ලකළ හස පෙළ බ ළ සකි කොම ළ

මේ කාව්‍ය මූර්ධජ ළකාර යෙදුව මනා තන්හි දන්ත්‍ය ලකාර යුක්තවූ යම් කිසි ලෙසකින් පොත්හි මුද්‍රිතව තිබේ. එහි ශුද්ධය යථොක්තලෙස සැලකියයුතුවාවත් හැර සන්තයටද එය එලෙස් සොදගත යුතු

| පිට. | පේළි. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 27 | 30 | අසුර | අසුරු |
| 28 | 33 | තුළ | තුලව |
| 29 | 13 | වාලුකාබ්‍යන්තර | වාලුකාභ්‍යන්තර |
| 30 | 11 | නිමගනව | නිමගනා |
| ,, | 19 | සමූගයා | සහය |
| ,, | 23 | ද්‍රශ්‍ය | දෘශ්‍ය |
| ,, | 27 | මිතුරුසඳ | මිතුරුසඳ |
| 31 | 14 | ගි | ගි |
| 32 | 13 | සමුද්‍ර | සමුදුර |
| ,, | 19 | බිඟු | බිඟු |
| 40 | 38 | ප්‍රත්‍යන්තර | ප්‍රත්‍යන්ත |
| 42 | 25 | අහී | අහි |
| 46 | 18 | අකාර | ආකාර |
| 48 | 14 | අභිනව | අභිනව |
| 49 | 13 | මණි | මිණි |
| 58 | 5 | බියනෙව් | බියෙනෙව් |
| 59 | 23 | ආදෘශ්‍ය | අදෘශ්‍ය |
| 60 | 26 | කාන්තා | කාන්තා |
| 62 | 22 | කොමලහසන | කොමලහසන |
| 63 | 27 | වණන් | වණින් |
| 71 | 27 | ලක්ෂමීය | ලක්ෂ්මීය |